# දළදා වරුණ

මහනුවර ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන
ලංකාවේ වැඩිම පිරිසක් කියවන බෞද්ධ සඟරාව

■ ශ්‍රී බුද්ධ වර්ෂ 2559 බක් මස 21 වන ගුරු දින ■ 2016 අප්‍රේල් මස 21 වැනි බ්‍රහස්පතින්දා



■ නොමිලේ පිරිනමන දහම් පඬුරකි ■ විකිණීම සඳහා නොවේ

# සිත ක්ලේෂයන්ගෙන් අලවා තබන මාර බන්ධන මෙන්න


සත්ත්වයා පිළිබඳ කතා කිරීමේදී ඔවුන් ජීවත් වන ලෝකය මෙලොව වශයෙන්ද, එයින් පසු හට ගන්නා ස්ථානය පරලොව වශයෙන්ද දැක්වීමට පුළුවන. අතීතයේ අප කුමන ජීවිත ගත කළද, කුමන ආත්ම ගෙව්වද ඒ පිළිබඳ එතරම් වැදගත් නොවනු ඇත. එයට හේතුව ඒවා ගෙවා අවසන් වූ බැවිනි. අප දැන් කළ යුත්තේ දැනට ගෙවන ආත්ම භාවය හා එයින් පසු ආත්ම භවයත් යහපත් කර ගැනීම වේ. ඒ සම්බන්ධව සෘජුවම බලපාන බලවේගයක් ලෙස මනස නොහොත් සිත හැඳින්විය හැකිය.

බුදු දහමේ කතා කරන ප්‍රධාන මාතෘකාවක් ලෙස "සිත" හැඳින්විය හැකිය. සිත ශරීරයට වඩා බලවත් බව විවිධ තැන්වල දේශනා කොට ඇත. සසර ගමනටද බලපාන ප්‍රධාන බලවේගය වන්නේ සිතයි. ඒ අනුව සිත පිරිසිදු කරගැනීම සෑම පැත්තකින්ම සුදුසු බවත්. හොඳ බවත් පැහැදිලි වේ. උපතින් මෙම සිත ප්‍රභාෂ්වර වුවද ආගන්තුකව පැමිණෙන කෙලෙස් ධර්ම හේතුවෙන් එය අපවිත්‍ර වේ.

අපේ සිතේ මාරයන් සේ පැන නගින ප්‍රධාන කෙලෙස් ධර්ම 10 ක් පිළිබඳ සඳහන් වේ. බුදුරදුන් බුද්ධත්වය උදෙසා ඇසතු රැක මුල භාවනාවෙහි යෙදී සිටියදීද එයට බාධා කොට කඩා බිඳ දමනු වස් මාර සේනාව පැමිණි බව දහමෙහි කියැවෙයි. එම දසමාර සේනාව නම්,

1. කාමය, 2. අරතිය, 3. සාපිපාසාව, 4. තෘෂ්ණාව, 5. ථීන මිද්ධය, 6. භය, 7. විචිකිච්ඡාව (සැකය), 8. ගුණමකු බව, 9. ලාභ සත්කාර හා වැරදි මගින් ලබන යසස, 10. තමන් උසස් කොට අනුන් පහත් කොට තැකීම.

මාරයාගේ බන්ධන පිළිබඳ කතා කිරීමේදී මාරයින් පස්දෙනෙක් පිළිබඳ පැහැදිලි වේ. එහිදීද ක්ලේශ මාර යනුවෙන් මාරයෙක් පිළිබඳ පැහැදිලි වේ. මේ ආදී විවිධ මාර සංකල්පයන් ඉදිරිපත් කර ඇති අතර ඒවා සිත අපිරිසිදු කරන ක්ලේෂ කර්ම වශයෙන් සිතේ හටගන්නා ආකාරය පෙන්වා දී ඇත. මා දූවරු ගත් කල්හිද තණ්හා, රතී, රඟා ආදී වශයෙන් සිතේ හටගන්නා ක්ලේෂ ධර්ම, සංකල්ප වශයෙන් විවිධ අයුරින් පැමිණ සිතේ පිරිසිදු භාවය, සිතේ දැහැන් බව මිදීමට සමත් වනු ඇත.



එම සියලු කෙලෙස් මාරයන් ලෝභ දෝෂ මෝහ යනුවෙන් කොටස් තුනකින් හැඳින්වීම යුක්ති යුක්තය. සිත අපිරිසිදු කරන ප්‍රධාන අකුසල මූල වන්නේ ලෝභ දෝෂ මෝය යන්නයි. ඒවා මෙලොවට මෙන්ම පරලොවටද බලපානු ඇත. තමන්ට සේම අනුනටද බලපානු ඇත. සංසාර භව ගමනටද බලපානු ඇත. සිත පිරිසිදු කරගැනීමට නම් ආලෝභය, අදෙවෂය, අමෝහය ගොඩ නගා ගත යුතුය. ඒ සඳහා බුදු හිමි දේශනා කළ දහම් මාර්ගය ප්‍රයෝජනයට ගැනීම වැදගත් වේ.

නිරන්තරයෙන්ම අපිරිසිදු සිතක චිත්ත තරංග ස්වභාව ධර්මයට සතා සිවුපාවුනට පවා අහිත පිණිස පවතිනු ඇත. බුදු පසේ බුදු මහරහතන් වහන්සේලාගේ සිතේ බලය, ශක්තිය, පිරිසිදු භාවය තුළින් ලෝ සතුන් පමණක් නොව දෙවි බඹුන් පවා සුවපත් වූ ආකාරය ඉතා පැහැදිලිය. පිරිසිදු චේතනා ගෙන දෙයි වාසනා ආදී පද තුළද එම අර්ථය අන්තර්ගතව ඇත. එබැවින් අප පිරිසිදු සිතක් නිරන්තරයෙන් ඇති කරගැනීමට උත්සාහවත් විය යුතුය. ඒ සඳහා කළ යුත්තේ කුමක්ද?

වර්තමාන යුගය තුළ පුද්ගලයා ගෙවන ජීවිතත් සමග සංසන්ධනය කර බැලීමේදී නිරන්තරයෙන්ම සිත අපවිත්‍ර කරන ඉන්ද්‍රියයන් විකෘති කරන කාම ලෝකයක් බව අමුතුවෙන් කිව යුතු නැත. "අන්තෝ ජටා බහි ජටා" (ඇතුළත් ප්‍රශ්න පිටත් ප්‍රශ්න) අවුල් වූ නූල් බෝලයක් සේ මුළු ජීවිතයම ප්‍රශ්න ගැටලුවලින් පිරී පවතී. එවිට සිත නිරන්තරයෙන් අපිරිසිදු වේ. ඒ අනුව බුදු හිමි දෙසූ දහම් මග සිත පිරිසිදු කරගැනීමට ඇති එකම මග බව අමතක නොකළ යුතුය.

දාන, ශීල, භාවනා නම් වූ ත්‍රිවිධ පුන්‍යක්‍රියා සිත පිරිසිදු කරගැනීමට ඇති මාර්ගයයි. දස පුන්‍යක් ක්‍රියා ගත්තද ත්‍රිවිධ පුන්‍යක්‍රියා මුලින් දැක්වේ. දන් දීමේදී සිත පිරිසිදු වන්නේ කෙලෙසද, ලෝභය, ද්වේෂය, මෝහය නම් වූ ප්‍රධාන අකුසල මූල යටපත් වී ඒ වෙනුවට තාවකාලික වශයෙන් හෝ අලෝභ, අදෝෂ, අමෝහ නම් වූ කුසල මූල මුදුන්පත් වීම තුළින් සිත පිරිසිදු වී මෙලොව පරලොව යහපත් කරවන සිතුවිලි ඉස්මතු වේ.

ශීලය තුළින් සිදුවන්නේද එයමය. සිත කය වචනය පිරිසිදු වීම නොහොත් සංවර වීමම එහිදී දස අකුසල් ලෙස හැඳින්වෙන සියල්ල දස කුසල බවට පත්වේ.

කයට අයත්, 1. ප්‍රාණඝාතය, 2. අදත්තාදානය, 3. කාම මිත්‍යාචාරය,වචනයට අයත් 4. මුසාවාදය, 5. පරුෂ වචනය, 6. කේලම් කීම, 7. නිෂ්ඵල කතා කීම

සිතට අයත් 8. අභිද්‍යාව, 9. ව්‍යාපාදය, 10. මිත්‍යා දෘෂ්ටිය.

මෙම දස අකුසල් නොකර සිටීමම දස කුසල් බවට පත් වේ. ඒ බව බුදු හිමි ම.නි. මහා වච්චගොත්ත සූත්‍රය තුළින් පැහැදිලි කොට ඇත. ම.නි. අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය තුළින්ද ඒ පිළිබඳව කරුණු ඉදිරිපත් කොට ඇත.

32 පිටුවට ▶

"මේ ලෝකයේ කවරදුවත් වෛරයෝ වෛරයෙන් නොසන්සිඳෙත්. අවෛරයෙන්ම වෛරයෝ සංසිඳෙත්."



# ලොව්තුරා බුදු බව ඕනෑම අයකුට ප්‍රාර්ථනා කළ හැකිද?

## තමන් බුදු බව පතන බව අන්‍යයනට හැඟවීම සුදුසුද?


ලොව්තුරා බුදු බව යනු මේ ලෝකයේ යම් පුද්ගලයකුට ලැබිය හැකි අති ශ්‍රේෂ්ඨතම පදවියයි. එය පහසුවෙන් ලැබිය හැක්කක් නොව උදර අදහස් ඇති ධීර වීර පුද්ගලයන්ටම ලැබිය හැකි ශ්‍රේෂ්ඨ පදවියකි. ඒ සඳහා අවම වශයෙන් සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද, උපරිම වශයෙන් සොළසාසංඛ්‍ය කල්ප ලක්ෂයක්ද පාරමී දම් පිරිය යුතු බව අපේ ධර්ම ග්‍රන්ථවල දැක්වේ.

පාරමී පිරීමේ අවස්ථා තුනකි. එය මනෝප්‍ර නිදන, වාප්‍ර නිදන, නියත විවරණ වශයෙන් දැක්වේ. මේවා සමහර තැනක දූරේ නිදන, අවිදූරේ නිදන, සන්තිකෙ නිදන වශයෙන්ද දක්වා තිබේ. මනෝප්‍ර නිදනය යනු බුදු කෙනකුන් වහන්සේ හමුවෙහි තමන්ටත් යම් දවසක මෙබඳු තත්ත්වයක් ලැබීමට හැකි වේවායි අධිෂ්ඨාන කොට පුණ්‍ය කර්මයන් සිදු කිරීමයි. නොහොත් නිස්සරණධ්‍යාශයෙන් බුද්ධත්වයේ සිත තබා පුණ්‍ය කර්මයන් සිදු කිරීමයි. මෙය දීර්ඝ කාලයක් විය හැකිය. අනතුරුව එය මුහුකුරා ගිය අවස්ථාවට පත්වූ විට බුදු කෙනකුන් වහන්සේ හමුවෙහි දන පරිත්‍යාගාදී පුණ්‍ය කර්මයන් සිදුකොට වචනයෙන් බුදු බව පතා කුසල් දහම් කිරීම වාප්‍ර නිදනයයි. අප ගෞතම බෝසතාණන් වහන්සේගේ මනෝප්‍ර නිදන, වාප්‍ර නිදන කාලය ගිනිය නොහැකි තරම් කාලයකි. එම කාලය තුළ පන්ලක්ෂ දෙළොස් දහසකට අධික බුදුරජාණන් වහන්සේලා දැක මනෝප්‍ර නිදන, වාප්‍ර නිදන පිරූ බව දැක්වේ. නියත විවරණ ලැබීම බුදු කෙනකුන් වහන්සේ හමුවෙහි දන ශීලාදී පුණ්‍ය කර්මයන් සිදු කොට සිටි කල්හි බුදුරදුන් විසින්ම එම පුද්ගලයා පිළිබඳ නියත වශයෙන්ම මොහු අසවල් කාලයේ බුද්ධත්වයට පැමිණේ යැයි සිදු කරන ප්‍රකාශයයි. අප ගෞතම බෝසතුන් විසි හතර නමක් බුදුරජාණන් වහන්සේලාගේ නියත විවරණ ලැබූ අතර අප බෝසතුන් ප්‍රඥාධික උතුමකු හෙයින් උන්වහන්සේගේ පාරමී කාලය කල්ප අසංඛ්‍ය හතරකුත් කල්ප ලක්ෂයකට සීමා විය.

මෙම කරුණු සංපිණ්ඩනය කර බැලීමේදී පෙනී යන කරුණක් නම් බුදු බව පතන උතුමකු බුද්ධාදී උතුමකු සමග විනා අන්‍යයන් සමග ඒවා කියමින් කටයුතු කරන බවක් පෙනෙන්නට නැති බවයි. නූතනයෙහි අප බෞද්ධ සමාජය තුළ බුදු බව පතන බොහෝ පින්වතුන් සිටින බව අසන්නට ලැබේ. බුද්ධත්වය පතා බෝසත් ගුණ පුරන පැවිදි උතුමන් පිළිබඳවද අසන්නට, දක්නට ලැබේ. එහෙත් ඒ උතුමන් අතර ඇතැම් අය විශාල පිරිස් සම්බන්ධ කර පින්කම් සිදුකොට එය තමන්ගේ අභිමතාර්ථය සඵලමත් කර ගැනීම සඳහා හේතුපාදක කරගැනීමේ අවස්ථාද විරල නොවේ. මා සිතන පරිදි එම උතුමන්ගේ බුද්ධ කාරක ධර්ම මුහුකුරා නොගිය අවස්ථාවක පවතිනු ඇතැයි යන්නයි. කෙසේ නමුත් අන්‍යයන්ට (සුදුසු පුද්ගලයන්ට විනා) තමා බුද්ධාංකුරයෙක් බව කුමන ආකාරයකින් හෝ ප්‍රකට කිරීමට වඩා අප්‍රකටව තම අපේක්ෂා ඉදිරියට ගෙනයාම උතුම් යයි කිව හැකිය. එහෙත් අනපේක්ෂිතව අන් අයගෙන් එය කියවීම වරදක් විය නොහැක. නමුත් තමන් හුවා දක්වා ගැනීම නම් උතුම් ප්‍රාර්ථනාවට නොවටිනා ප්‍රසිද්ධියක් ඇතිකර වීමක් සේ පෙනේ.

**පූජ්‍ය යටමලගල සුමනසාර හිමි**

"යමකු බැරිවීමකින් පවක් කළත් නැවත නැවත එය නොකළ යුතුය. පව් කිරීම නිසැකවම දුකට හේතු වේ."



# මේ ආත්මයේ කරන පින්වලින් පමණක් නිවන් දැකිය හැකිද?

## ඉඟුරුවත්තේ පියනන්ද හිමියෝ පිළිතුරු දෙති

❐ **බෞද්ධයකු වෙනත් ආගමික පොත් පත් කියවීම වරදක්ද?**

කිසිම වරදක් නැත. එහෙත් හොඳ බෞද්ධයකුගේ ස්වභාවය වෙනත් ආගමික පොත් පත් කියවීමට පෙර බෞද්ධ පොත් පත් තරමක් හෝ කියවා බුද්ධ දේශනාව තුළින් දැනුවත් බෞද්ධයකු වීමයි. බුද්ධ දේශනාව හොඳින් කියවා නැති අයකුට වෙනත් ආගමික පොත් පත් කියවා බුද්ධ දේශනාවේ සහ අන්‍යාගම් තුළ පවතින වෙනස තේරුම් ගැනීම දුෂ්කරය. බුද්ධ දේශනාවේ ඇති වටිනාකම, ශ්‍රේෂ්ඨත්වය, පුද්ගල නිදහස, චින්තන නිදහස, විවෘත භාවය මෙන්ම එහි ඇති විද්‍යාත්මක වටිනාකම, මැනවින් වටහා ගැනීමට නම් විශේෂයෙන් සූත්‍ර පිටකයත්, යම් ප්‍රමාණයකින් අභිධර්ම පිටකයත් උගත යුතුය. ඉන්පසු අන්‍යාගමික පොත් පත්ද කියවීම තුළින් බුද්ධ දේශනාවේ ඇති ශ්‍රේෂ්ඨත්වය සහ අන්‍යාගමික ඉගැන්වීම් අතර පරතරය යම් ප්‍රමාණයකින් වටහා ගත හැකි වනු ඇත. එහෙත් බණ භාවනා තුළින් අධ්‍යාත්මය සකස් වූ සසල නොවන ආගමික චින්තනයක් සිත තුළ සනිටුහන් වීමෙන් අන්‍යාගමික පොත් පත් කියවූයේ නමුදු බොදු සිත වෙනස් නොවේ.

ඔබගේ ප්‍රශ්නයෙන් ඉදිරිපත් කර ඇති පරිදි එම පිළිතුරට තවදුරටත් යමක් කිව යුතුය. එනම්, විවිධ

"පව් කරන්නා මෙලොවත් ශෝක කරයි. පරලොවත් ශෝක කරයි. දෙලොවම ශෝක කරයි."

කිතුණු සංවිධාන මගින් ප්‍රසිද්ධ පුවත්පත් මාර්ගයෙන්ද වෙනත් උපක්‍රමශීලී ක්‍රම තුළින්ද බොදු දරු දැරියන්ට ඇතැම් විට ආගමික ස්ථානවලට නොමිලයේ ඇතැම් විට බයිබලයද, බයිබලයේ කොටස් අඩංගු යම් යම් පොත් පත්ද නොමිලයේ පරිත්‍යාග කරන බව පෙනේ. මෙම පරිත්‍යාගය තුළින් තව තවත් අනුගාමිකයන් එක්කර ගැනීමද ඔවුන් යම් යම් සංවිධානවලට බඳවා ගැනීමද එම පොත්පත්වල අඩංගු බයිබලයේ යම් යම් කොටස් පිළිබඳ අදහස් විමසීමද (පිළිගත හැක, පිළිගත නොහැක යනාදී වශයෙන්) කරන බව පෙනේ. මෙම ක්‍රමයෙන් උපායශීලීව ඔවුන්ට යම් යම් රැකියා ලබාදීමද අනතුරුව එම ආගමික සංවිධානවලට බඳවා ගැනීමද මෙම ධර්මද්වීපයේ කලක සිටම සිදුවන බව කිව යුතුය. එබැවින් බෞද්ධ වූ ඔබ මේ පිළිබඳවද කල්පනාකාරී විය යුතුය.

❒ **කෙනකුගේ මරණය සිදුවන්නේ කර්ම ශක්තිය අනුවමද?**

කෙනකුගේ මරණය සිදුවීමට හුදු කර්මයම නොව වෙනත් හේතුද බලපෑ හැක. ඒ අතරින් උත්පත්තිය ලබා දුන් ජනක කර්මයාගේ විපාකය අවසන් වීමෙන්ද, මේ ලෝකයට අයත් ආයුෂ ගෙවී යාමෙන්ද, මේ දෙකම එකවර ගෙවී යාමෙන්ද, ලෙඩ රෝග, හදිසි අනතුරු, ස්වාභාවික විපත් ආදියද වෙසෙසා දැක්විය හැකිය. මෙයට පෙර ප්‍රශ්නයේදී සාකච්ඡා කළ පරිදි ප්‍රයෝග සම්පත් නොදැනීම නිසා ඇතිවන ප්‍රයෝග විපත් අකල් මරණ ආදියට හේතු වන බව සමාජය දෙස බැලීමේදී පැහැදිලි වේ. අප තවදුරටත් ඒ පිළිබඳව මදක් විමසා බලමු.

යමෙකුට මේ මිනිස් ලොව උපත ලබා දුන් කර්ම විපාකයෙහි ශක්තිය ඇත්තේ කෙටි කාලයක් ජීවත් වීමට නම් සමස්ත පරමායුෂ ශේෂව තිබියදී කුමන හෝ කරුණක් ඉදිරිපත්ව මරණයට අවස්ථාව ලබාදෙයි. කෙනකුගේ උපත ලබා දුන් කර්මය දීර්ඝ කාලයක් ජීවත් කරවීමේ ශක්තිය ඇතද, සමස්ත ආයු කාලය අබිභවා යාමට (වසර සිය ගණනක්) හැකියාවක් නැත. මරණය සිදු වෙයි. කලාතුරකින් අයකුට කර්මය සහ ආයුෂය යන දෙකම එකවර ගෙවීමෙන්ද මරණය සිදුවෙයි. බහුතරයක් දෙනා ලෙඩ රෝග, හදිසි අනතුරු, සියදිවි හානිකර ගැනීම්, විවිධ අපරාධ මෙන්ම මෙම ක්‍රමයට අනුව සිතාගත හැකියි. මනා ඥානයක් ඇති අයට නිවන් දැකීමට මේ සූත්‍ර සාරයද ප්‍රමාණවත් විය හැක. අට්ඨකථා සාහිත්‍යය එක්වන්නට ඇත්තේද මෙම සාරාංශ ක්‍රමය නිසා යයි අනුමාන කළ හැකිය. නමුත් මෙය මගේ අදහසක් මිස දේශනාවේ එන දෙයක් නොවේ. තම තම නැණ පමණින් මේ පිළිබඳව සිතා බැලීම වරදක් නොවේ.

❒ **මේ ආත්මයේදී කරන පින්වලින් පමණක්ම කෙනකුට නිවන් දැකිය හැකිද?**

ඔබ අසා නැද්ද? පාරමී සංඛ්‍යාත නිස්සරණධ්‍යාශයෙන්



''අනුන්ගේ රළු පරළු කතාත් අනුන් කළ නොකළ දේත් නොසෙවිය යුතුය. තමාගේම කළ නොකළ දේ සෙවිය යුතුය.''

දන සීල නෙක්ඛම්ම යනාදී පුණ්‍ය කර්මයන් අවම වශයෙන් කල්ප අසංඛයක්වත් සංසාර ජීවිතවලදී දියුණු කළ යුතු බවත්, පෙර සංසාර පාරමී මෙන්ම මේ ජීවිතයේදීත් ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥ සංඛ්‍යාත සමථ විදසුන් බලය වැඩිය යුතු අතර, ඒ සඳහා සද්ධර්ම ශ්‍රවණය, කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, ධර්මානු ධර්ම ප්‍රතිපත්තිය, යෝනිසෝ මනසිකාරය යන අංග අවශ්‍යයෙන්ම තිබිය යුතුය. එබැවින් දුක්ඛාදී චතුරාර්ය සත්‍යයන් අවබෝධ කිරීමට එක් භවයක කරන උත්සාහයම ප්‍රමාණවත් නොවේ. එනමුත් අපට ඇති සැනසිල්ල අප කොතෙක් කාලයක් තිස්සේ බෝධිකාරක ධර්මයන් පුරා ඇතිදැයි නොදන්නා බවයි. අනිවාර්යයෙන්ම ඒ සඳහා යොමුව ඇති බවට වටිනා සාධකයකි මේ ජීවිතයේදී පින් දහම් කිරීමේ බණ භාවනා කිරීමේ පවත්නා කැමැත්ත. එමෙන්ම බුද්ධෝත්පාද කාලයක ලැබූ උත්පත්තිය, ඇස් කන් ආදී ඉන්ද්‍රියයන්ගේ විකලත්වයක් නොමැති බව, තෙරුවන් පිළිබඳ පවත්නා අවංක පළිගැනීම යනාදිය සංසාර පාරමී ඇති බවට සාධක වේ.

ඇත්ත වශයෙන්ම ඔබට අවංකවම දුකින් මිදීමේ නොහොත් නිවන් දැකීමේ අපේක්ෂාවක් පවතී නම් ජීවිතය පිළිබඳව, යථාර්ථය පිළිබඳව අනුමාන ඥනයක් හෝ ඇතිවේ නම් (ගැඹුරු ධර්මයම නොවේ) එයින් ගම්‍ය වනුයේ සංසාර පාරමී ඇති බවයි. නමුත් එම වාසනා ගුණය ඒ ඒ පුද්ගලයන් අනුව විවිධාකාරය. ඇතැමුන්ට එම ඥනය ඇති වන අවස්ථාව එළඹෙන මොහොත දැක්වීම අපහසුය. එය යම්කිසි කළකිරීමක්, ජීවන ප්‍රශ්නයක් යනාදී අරමුණකින් දහම් මගට යොමු විය හැකිය.

කෙසේ වෙතත් කොතරම් පාරමී දියුණුව ඇතත් පාප මිතුරන්ගේ ඇසුර, විපරීත අදහස් ඇති බව, විෂම පරිසරයක ජීවත් වීම යනාදී කරුණු නිසා නිවන් දැකීමේ භාග්‍යය මේ භවයෙන් පිරිහී යා හැකිය. කාශ්‍යප බුදුරදුන් දවස අප බෝසතුන් බ්‍රාහ්මණ කුලයක ජෝතිපාල නමින් ඉපිද මව්පියන්ගෙන් ලත් වැරදි ආභාසය නිසා විපරීත මිත්‍යා දෘෂ්ටි ඇත්තෙක් විය. නමුත් ඝටිකාර නමැති සත්පුරුෂයාගේ ඉදිරිපත්වීම නිසා අන්තිමේදී බුදු සව්වෙක්ව අන්තිම විවරණය පවා ලැබීය. එමෙන්ම මේ ජීවිතයේදී පඤ්චානන්තරීය අකුසලයකට අසු වුවහොත්, ආර්ය උපවාදයක අසු වුවහොත්, නියත මිත්‍යා දෘෂ්ටියකින් යුක්තව සිටිය හොත් නිවන් දැකීමේ භාග්‍යය නැතිවී යයි. එබැවින් ගිහි සීලයකින් යුක්තව මව්පිය වැඩිහිටි ආදීන්ට අපවාද උපවාද නොකරමින්, ඔවුන්ට ඇප උපස්ථාන කරමින් බණ ඇසීම, ධර්මානු ධර්ම ප්‍රතිපත්තියෙන් යුක්තව සතර සතිපට්ඨාන ධර්ම අසා දැනගෙන කාමයන්හිම ඇලී ගැලී නොසිට කටයුතු කිරීම තුළින් තම භාග්‍යය මතුකර ගත හැකිය.

**ධර්ම ගවේශක**



''මෝඩයා මට දරුවෝ ඇත. මට ධනය ඇත කියා සිතමින් උද්දම් වෙයි. තමාට තමනුත් නැති කල කුමන දරුවෝද? කුමන ධනයද?''

# කුමටද කුසලට කම්මැලි වන්නේ පිනමයි නිවනට නුඹ ගෙනි යන්නේ



මෙම ලිපිය තුළින් අප විස්තර කර දෙන්නට බලාපොරොත්තු වන්නේ බුද්ධ ශාසනයේ පවත්නා මහානීය පින්කම් දහයක් පිළිබඳවයි. දස පුණ්‍ය ක්‍රියා, දස පින් කිරියවත් නමිනුත් මේවා හැඳින්වෙනවා. පින්වත්නි, අපි සසර සැරි සරන්නේ අප විසින් රැස්කරන ලද පින්, පව් අනුවයි. කරන ලද පින් අනුව කාමාවචර සැප විපාකත්, කරන ලද පව් අනුව දුක් විපාකත් විඳින්න සිද්ධ වෙනවා. කොහොම වුණත් මේ දෙකම හේතුවන්නේ සසර පැවැත්මටයි. ඒ නිසාමයි බුදුහාමුදුරුවෝ වදාළේ ''සබ්බ පාපස්ස අකරණං කුසලස්ස උපසම්පදා'' වශයෙන්. එනම් සියලු පවින් දුරු වී චිත්ත, චෛතසික දෙකේ යහපත් එකාග්‍රතාවය ඇති කරගෙන ඒ එකඟ බව (සමාධිය) තුළින් විදර්ශනා ප්‍රඥාව උපදවා ගන්න කියලා.

පින්වත්නි, මේ සියල්ල සිදුකර ගත හැක්කේ හොඳ ආත්ම භාවයක් ලබා තිබුණොත් පමණයි. සිත දියුණු කරලා විදර්ශනා ප්‍රඥාව ලැබීම කෙසේ වෙතත් පින් කරන්නවත්, අනුමෝදන් වෙන්නවත් පුළුවන්කමක් ඇත්තේ නෑ. ඒ අතින් බලන විට ''පින'' බොහෝම වටිනා දෙයක්. කරන ලද පින් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥා සම්පත්තීන්ගෙන් සමන්විත ජීවිතයක් උපදවනවා. පිනින් අඩු ජීවිතයක් පවත්වන එක බොහෝම වෙහෙසකර දෙයක්. පෙර කරන ලද පින් ඇත්තන්ට බොහෝ සම්පත්, ප්‍රාර්ථනා පහසුවෙන් ලැබෙනවා, ඉටුවෙනවා. මේ නිසාම බුදුහාමුදුරුවෝ ''පින'' ගිහි, පැවිදි සෑම දෙනාටම මහෝපකාරී බව දේශනා කළා.

කෙළෙස් සහිතව කළේ වී නමුත් පින් කරන විට ලෝභ, ද්වේශ, මෝහ ආදී අකුසල මූලයන් යටත් වෙලා කුසල මූල උපදිනවා. එවිට ඇතිවන සිත ප්‍රභාෂ්වරයි. ප්‍රසාදජනක පිනා ගිය සිතකුයි ඒ වේලේ පවතින්නේ. තමන් කරන ලද ඒ පිනින් තමන් සතුටු වෙනවා වගේම අනුන්ටත් සතුටු වෙන්න අනුමෝදන් කරවන්නත් පුළුවන්කම තියෙනවා. එවිට පින තව තවත් දියුණු, තියුණු වෙනවා. බුදුහාමුදුරුවෝ එක් තැනකදී ''පින් කළ තැනැත්තා මෙලොවත් පරලොවත් දෙකෙහිදීම සතුටු වන බවත් මා විසින් මේ පින කරන ලද්දේ යැයි සිත සිතා නැවත නැවතත් සතුටට පත්වන බවත් දේශනා කර තිබෙනවා.''

**මේ තරම් හොඳ පිනෙහි ඇලුණොත්...**

පින ඉතා හොඳ දෙයකි. නිර්වාණාබෝධයටද උපකාර වන ධර්මයකි. පෙර කරන ලද පින් ඇති බව (පුබ්බේ ච කත පුඤ්ඤතා) මංගල කාරණයකි. කෙසේ වුවද පිනෙහිම ඇලී ගැලී කරන පිනෙන් දිව්‍ය ලෝකාදී සැප සම්පත් ප්‍රාර්ථනා කරමින් පසුවීම, බුදු හාමුදුරුවෝ වදාළ දහම් මග නොවේ. බුදුහාමුදුරුවෝ වදාළ දහමට අනුව අප කළ යුත්තේ කරන ලද පින උපකාරක ධර්මයක් කරගෙන මේ ඝෝර වූ සසරින් අත්මිදීම සඳහා වන කුසල ප්‍රතිපදාවට යොමු වීමය. යමෙක් තුන් සිත පහදවාගෙන පින්කමක් කොට එහි විපාක වශයෙන් දිව්‍ය මානුෂික සැප සම්පත් ලැබෙන බවත් දැන ඒ සැප සම්පත්ද අනිත්‍යය භාවයට, දුක්ඛ භාවයට, අනාත්ම භාවයට පත් වන්නේ යැයි කල්පනා කරන්නේ නම් ඔහු කරන ලද පින බුද්ධාදී උතුමන් ප්‍රශංසා කරන ලද ප්‍රනීත, මහේශාඛ්‍ය පුණ්‍ය කර්මයක් වන අතර, අනෙක් පසින් ඔහුගේ කුසල පක්ෂයද දියුණු වීමයි.

පින් කොට දෙව්ලොව, බඹලොව සැප සම්පත් විඳින ලද බොහෝ සත්ත්වයෝ පුණ්‍ය විපාකවල අවසානයත් සමග නැවත දුක්ඛිත භව සයුරටම ඇද වැටී තිබේ. මේ පිනෙහිත් එහි විපාකයෙහිත් ඇලී ඉන් සෑහීමකට පත්වීමේ අනුවනකමේ ප්‍රතිඵලයයි.

අප මිනිසුන් වී ඇත්තේ පින් කොට ඇති නිසාය. තව කොපමණ කාලයක් සසර සැරි සැරීමට සිදුවේද යන්න අපි නොදනිමු. එහෙයින් ලැබෙන හැම විටකදීම දනාදී පින්කම් සිදුකරගත යුතුය. එසේ පින් කොට එයින් ලබන පුණ්‍ය විපාකත් අනිත්‍ය භාවයට පත්වන බව මෙනෙහි කළ යුතුය. එසේ මෙනෙහි කිරීම තුළින් පින ඉක්ම වූ සසර දුක ඉක්මවීමට හේතුවන විදර්ශනා ප්‍රඥාව කරා අපේ සිත මෙහෙයවිය හැකි වෙයි. අප කරන හොඳ වැඩ තුළින් පින නිරායාසයෙන්ම ලැබෙයි. ඒ ගැන කරදර වීම නුවුවමනා දෙයකි. ඒ පින උපකාරක ධර්මයක් කරගෙන කුසලයම වැඩිය යුතුය. කුසලය නිරායාශයෙන් නොලැබේ. ඊට උත්සාහත්, වීර්යයත්, අධිෂ්ඨානයත්, සතිමත් බවත් අවශ්‍ය වේ. මේ ගැන හොඳින් මෙනෙහි කරමින්ම දැන් අපි ''දස පුණ්‍ය ක්‍රියා'' තේරුම් ගැනීමට උත්සාහ කරමු.

අප විසින් මාතෘකා කළ ගාථා ධර්මය තුළ පුණ්‍යකර්ම දහයක් අන්තර්ගතව පවතී. ඒවා මෙසේය.

''යමක් කොට පසුතැවෙන්නට වේද යමක විපාකය කඳුළු පිරි මුහුණෙන් යුක්තව හඬමින් විඳින්නට සිදුවේ.''

1. දනං - දීම.
2. සීලං - කාය වාග් සංවරය.
3. භාවනා - කුසල අරමුණක සිත වැඩීම.
4. පත්තිදන - පින් දීම.
5. පත්තානුමෝදනා - පින් අනුමෝදන් වීම.
6. වෙය්‍යාවච්ච - වතාවත් කිරීම.
7. අපචායන - පිදිය යුත්තන් පිදීම.
8. ධම්ම දෙසනා - ධර්මය දේශනා කිරීම.
9. ධම්ම සවණ - ධර්ම ශ්‍රවණය.
10. දිට්ඨිජු - නිවැරදි අවබෝධය.

## දනය

දනය යනු දීමයි. දීමේ නොයෙක් ප්‍රභේද පවතී. ඒ සියලු ආකාරයේ දීම ගැන කෙටියෙන් කිවහොත් තමන් සන්තකයේ තමන්ට අයත්ව පවතින යම් උපභෝග, පරිභෝග වස්තුවක අයිතිය අත්හැරීමය. පූජා බුද්ධියේන මෙන්ම අනුග්‍රාහක බුද්ධියෙන්ද මෙය සිදුකළ හැකිය. මෙයින් පෙනෙන්නේ යමක් දීමම දනය නොවේ. එය සම්පූර්ණයෙන්ම අතහැරීම දනයය. ඒ තුළින් ලෝභය දුරුවෙයි. අලෝභය, විරාගය වැඩෙයි. ත්‍රිවිධ පුණ්‍යක්‍රියා, දස රාජධර්ම, සතර සංග්‍රහ වස්තු ආදී සියල්ලේ මුලටම පවතින්නේ දනයයි. බුදුහාමුදුරුවෝ දනයට දී ඇති තැන මෙයින් පැහැදිලිය.

## සීලය

සීලය නම් කායික සහ වාචසික සංවරයයි. මෙහිද ප්‍රභෝද බොහෝ පවතී. සීලය ත්‍රිශික්ෂාවේ පළමුවැන්න වේ. සීලයෙන් තොරව සමාධි, ප්‍රඥ ලද නොහැකිය.

## භාවනා

සිතට නිදල්ලේ යාමට නොදී කුසල අරමුණක සිත වැඩිම භාවනාවය. සමථ, විදර්ශනා වශයෙන් මෙය දෙආකාර වේ. සමථ භාවනාවෙන් සිත කෙලෙසුන්ගෙන් තාවකාලිකව යටපත් කර ගනිමින් ධ්‍යානාදිය ඉපදවිය හැකි අතර විදර්ශනාවෙන් ප්‍රඥව ලැබිය හැකි වේ.

## පත්තිදන

පත්තිදන වශයෙන් දක්වෙන් පින් දීමය. එනම් තමන් කළ පිනක් අනුන්ට අනුමෝදන් කරවීමය. මෙය බුදුහාමුදුරුවෝ අනුදත් පිනකි. විශේෂයෙන් කළ පින් මියගිය ඥතීන්ට අනුමෝදන් කිරීම ඥති ධර්මයකි. දුකින් පෙළෙන පරලොව ඥතීන්ට ඉන් මිදීමට එම පින හේතුවනවා මෙන්ම පින් අනුමෝදන් කිරීමෙන් අපේ පින තව තවත් වැඩිවේ.

## පත්තානුමෝදනා

පත්තානුමෝදනා නම් අනුන් විසින් කරන ලද යම් පිනක් දක හෝ අසා ඉන් සතුටට පත්වීමය. ඒ පින ප්‍රශංසා කිරීමය. අනේපිඬු සිටාණන් දෙව්රම් විහාරය පූජා කිරීම දුටු එක් දුගී දර කපන මිනිසෙක් ඒ පිනින් සතුටු වී දෙව් සැප වින්ද පුවතක් ධර්ම සාහිත්‍යයේ එයි. අනුන් කළ පින් අනමෝදන් වීම වෙනුවට එහි අඩුපාඩු කියමින් නොසතුටු වීම වර්තමානයේ ඇතැමුන් විසින් සිදුකරන්නා වූ අනුවණකමකි.

## වෙය්‍යාවච්ච

වෙය්‍යාවච්ච නම් වතාවත් කිරීමය. බුදුන් වහන්සේ පෙන්වා ඇත්තේ වතාවත් සිදු නොකරන්නාගේ සීලය පරිපූර්ණ නොවන බවයි. මේ අනුව සීලය සම්පූර්ණ වන්නේ වතාවත් ඉටු කිරීමත් සමඟය. මළපෙත් නැමදීම, මලසුන් පිළියෙළ කිරීම ආදී බොහෝ වතාවත් ඇතත් බොහෝ දෙනා ඒවා මහානීය පින්කම් ලෙස සලකන බවක් නොපෙනේ. භික්ෂූන් වහන්සේලාට කළයුතු වත්වත් දක්වෙන වත්තක්ඛන්ධකයක්ම බුදුන් වහන්සේ දේශනා කොට තිබේ.

## අපචායන

අපචායනය නම් පිදිය යුත්තන් පිදීමය. මෙය මංගල කරුණක් වශයෙන්ද බුදුන් වහන්සේ පෙන්වා දී තිබේ. පිදිය යුත්තන්ගෙන් අසම සම පූජාර්හයන් වහන්සේ නම් අරහං ආදී ගුණාංගයන්ගෙන් සමන්වාගත බුදුරජාණන් වහන්සේය. ආර්යය මහා සංඝරත්නය, ගුරු දෙමාපියන්, වැඩිහිටියන්, ධර්ම විනයධර බහුශ්‍රැතයන්ද පිදිය යුත්තෝය. ඔවුහු පිදීම මහ පින්කමෙකි. තමන් කිත් පැසසුම් කැමැති වන්නේ පිදිය යුත්තන් පිදීම ඊට මගෙකි. පිදිය යුත්තන් පිදීමෙන් ආයු, වර්ණ, සැප, බල, ප්‍රඥ ලද හැකි බවත් බුදුන් වහන්සේ වදළහ.

## ධම්ම දේශනා

ධර්මය අන් අයගේ අවබෝධය පිණිස දේශනා කිරීම, ඉගැන්වීම, ලිවීම, ලියැවීමද මහානීය පින්කමකි. මෙය අටමහා කුසල් අතරටද ගැණෙන්නකි. සියලු දනයන්ට වඩා උත්තම වූ දනය ලෙස පෙන්වා දී ඇත්තේ මෙයය. එහෙයින් තමා උගත් ධර්මය අන් අයට කියාදීම පින්කමක් යැයි සිතා, සිදුකළ යුතුය.


## ධම්ම සවණ

ධම්ම සවණ නම් ධර්මය ඇසීමය. ප්‍රඥව ලද හැක්කේ ධර්ම ශ්‍රවණයෙකි. ධර්මය අසන්නට ලැබීම දුර්වල වූ පින්කමෙකි. එහි දුර්ලභ බව දහම්සොඬ ආදී කතා ප්‍රවෘත්ති තුළින්ද පැහැදිලි වේ. සද්ධර්ම අසන්නට ලැබෙන්නේ කල්‍යාණ මිත්‍රයන්ගෙනි. ධර්මය අසා, දරා ඒ අනුව පිළිවෙත් පිරීමෙන් ආර්ය මාර්ගයට පිවිසිය හැකි වේ. නො ඇසූ දේ ඇසීමත්, ඇසූ දේ නැවත නැවත පිරිසිදු කර ගැනීමත්, සැක සංකා දුරුකර ගැනීමත්, නිවැරදි දක්මක් ඇතිකර ගැනීමත්, සිත පහද ගැනීමටත් ධර්ම ශ්‍රවණය මහෝපකාරීය. මේ අනුව බණ ඇසීම මහ පිනක් මෙන්ම නිර්වාණාවබෝධයෙහිලා වන කුසලයකි.

## දිට්ඨිජු කම්ම

මෙයද ඇති වන්නේ ධර්ම ශ්‍රවණය කිරීම තුළිනි. ධර්මය ඇසීම තුළින් තමා මෙතෙක් කල් සිතාගෙන සිටි වැරදි අවබෝධයන් දුරු වී යයි. ඒ වෙනුවට නිවැරදි දක්මට පැමිණෙයි. විශේෂයෙන් කර්මය, කර්ම ඵල පිළිබඳ විශ්වාසයට පැමිණෙයි. අප සසරට බැඳී ඇත්තේ පඤ්චස්කන්ධය මමය, මගේය, මගේ ආත්මය වශයෙන් උපාදන ලෙස අල්ලාගෙන ඒ පිළිබඳව ඇති කරගෙන සිටින වැරදි දක්ම නිසයි. එහෙයින් අනිත්‍යය, දුක්ඛ, අනාත්ම ත්‍රිලක්ෂණයට අනුව ජීවිතය, ලෝකය පිළිබඳ කල්පනා කිරීම දස පුණ්‍ය ක්‍රියාවන්හි දසවන පුණ්‍ය කර්මයයි. තමන් වැරදි දක්මක් ඇතිකර ගන්නවා වාගේම අන් අයටද ඊට මගපෙන්වීමද මහනීය පින්කමෙකි.

පූජ්‍ය හෙම්මාතගම පියදස්සි හිමි



''දෙවූ වහාම කිරි නොමිදෙන්නාක් මෙන් කෙනෙකු විසින් කරන ලද පව වහා නොමෝරයි. එය අළු යට වූ ගිනි පුපුරක් මෙන් ඔහු දවමින් පසුපස ලුහු බඳී.''




# 'පරපණ නැසුවොත් කවර උපායේ අපමණ දුක් දෙයි සතර අපායේ'



දේශකයාණෝ : ශ්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශ්වයේ විංශද්වර්ගික කාරක සංඝ සභික

**පූජ්‍ය තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර**

තේවාවහාර නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ

පින්වත්නි,

තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ, රජගහනුවර ජීවක නම් අඹ උයනේ වැඩවාසය කරන සමයෙහි ජීවක වෛද්‍යවරයා බුදුරජාණන් වහන්සේ වෙත එළඹ වැඳ නමස්කාර කොට විමසන ලද ප්‍රශ්නයක් අරභයා දේශනා කොට වදාළ ජීවක සූත්‍රය මජ්ඣිම නිකායේ ගහපති වග්ගයේ එන සූත්‍ර දේශනාවකි. ප්‍රාණඝාත අකුසල කර්මය මෙන්ම, මාංශ පරිභෝගය පිළිබඳව කරුණු දැන ගැනීමට ඉතා වැදගත් වන දේශනාවෙකි. එදා ජීවක වෛද්‍යවරයා විමසන ලද ප්‍රශ්නය නම්, ඔබවහන්සේ උදෙසා පිළියෙළ කරන ලද සත්ව මාංශ සහිත දානය වළඳන බව මම අසා ඇත්තෙමි. මෙය සත්‍යයක් ද මුසාවක් ද කියා මම නොදනිමි. එවිට බුදුරජාණන් වහන්සේ ජීවකය, යමෙක් බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ උදෙසා, මරණ ලද සතුන්ගේ මස් අනුභව කරන්නේ යැයි

"තමාට පිහිට තමාමය. වෙන කවරෙක් තමාට පිහිට වේද? තමා මනාව දැමුණු කල දුර්ලභ වූ පිහිටක් ලබන්නේය."

කියන්නේ නම් එය මුසාවෙකි. අසත්‍යකි. අද්භූත චෝදනාවෙකි. මගේ ශ්‍රාවකයන් වහන්සේලාට මා විසින් අනුදැන වදාරා ඇත්තේ, තමන් වහන්සේ උදෙසා සතුන් මැරුවේ යැයි තමන් දුටුවේ නම් හෝ ඇසුවේ නම් හෝ එවැනි සැකයක් ඇති වූයේ නම් හෝ එවැනි මාංශයක් කිසිවිටෙක පරිභෝගය නොකළ යුතු බවය. මම ද එවැනි මාංශ නො වළඳමි.

යම්කිසි භික්ෂූන් වහන්සේ නමක් දායකයෙකුගේ ආරාධනයෙන් ඔහුගේ නිවසට දානය පිණිස වැඩම කරන අවස්ථාවේදී කවර ආකාරයේ දානයක් ලැබේදැයි අපේක්ෂාවක් නොමැතිව වැඩම කරන අතර, තමාට ලැබෙන රසවත් හෝ නීරස ආහාර වළඳනවා මිස රස නීරස, මිහිරි අමිහිරි බව ගැන නොසිතයි. භික්ෂුව වනාහි නිවැරදිව, පිරිසිදු සිතින් යුතුව ආහාර වළඳියි. මා මෙන්ම මගේ ශ්‍රාවකයන් ද නිවැරදිව උපේක්ෂා සහගතව පිරිසිදු සිතින් ආහාර වළඳන බව මම දනිමි. ලෝභ, ද්වේශ, මෝහ යන අකුසල් මුල් සිඳ දැමූ තථාගතයන් වහන්සේ උදෙසා මරණ ලද සතුන්ගේ මාංශ අනුභව කරතැයි පැවසීම අසත්‍ය චෝදනාවකි. එය මහා පව් ගෙන දෙන්නෙකි. අකුසල් මුල් සිඳීමෙහි යෙදී සිටින මාගේ ශ්‍රාවක භික්ෂූන් වහන්සේ කෙරෙහි ද එබඳු අසත්‍ය චෝදනා නැඟීම පව් රැස්කර ගැනීමකි.



තථාගතයන් වහන්සේ උදෙසා හෝ ශ්‍රාවකයන් වහන්සේ උදෙසා ප්‍රාණඝාතයක් සිදු කරන්නේ නම්, ඔහු අකුසල කර්ම රැස්කරන්නෙක් වෙයි. මැරීම සඳහා අසවල් සත්වයා රැගෙන එන්නැයි කීමෙන් ම, මහත් අකුසලයක් ඇති කරගන්නා අතර, එම ප්‍රාණියා රැගෙන එන විට ඒ ප්‍රාණියා බියට පත්ව ශෝක වන විට ද, බරපතල අකුසලයක් ඇති වේ. බියට පත් සත්වයා මරන්නට නියම කිරීමද බලවත් අකුසලයකි. මරණ විට සතා බියෙන් වෙවුලා මහා හඬ තැලීම, මරණ වේදනා විඳීම ද බරපතල අකුසල කර්මයකි. එසේම බුදුරජාණන් වහන්සේ හෝ උන්වහන්සේගේ ශ්‍රාවකයෝ අකැප මාංශ වළඳතියි අසත්‍ය චෝදනා කරන්නේ නම් එයින් ද බරපතල අකුසල කර්ම සිදුවේ. මේ අන්දමින් බුදුන් වහන්සේ උදෙසා හෝ ශ්‍රාවකයන් වහන්සේ උදෙසා හෝ යමෙක් මාංශ ආහාරයක් පිළියෙල කරන්නේ නම් එම දානයෙන් ලබන ආනිසංස වෙනුවට බරපතල අකුසල් විපාක විඳින්ට සිදුවේ. මෙලොව දී මෙන්ම පරලොව දී ද අමිහිරි විපාක විඳින්ට සිදුවේ. එබැවින් බුදුන් උදෙසා හෝ ශ්‍රාවකයන් උදෙසා හෝ ප්‍රාණඝාත අකුසල නොකළ යුතු බවට බුදුරජාණන් වහන්සේ විසින් වැඩිදුරටත් දේශනා කොට වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ස්වකීය ශ්‍රාවකයන් වහන්සේලාට


1. තමා උදෙසා මේ ප්‍රාණියා ඝාතනය කළේ යැයි අසා තිබේ නම් හෝ
2. තමා උදෙසා එම ප්‍රාණියා ඝාතනය කළේ යයි තමන් දුටුවේ නම් හෝ
3. තමා උදෙසා මේ ප්‍රාණියා ඝාතනය කරන්නට ඇතැයි යන සැකය තමන්ට ඇතිවූයේ නම් හෝ යන කාරණා

තුනට අදාලව කිසියම් මාංශයක් නොවැළඳිය යුතු බව දක්වා වදාළ සේක.

බුදුරජාණන් වහන්සේ ශ්‍රාවකයන් වහන්සේලා මාංශයක් අනුභව කරන්නේ නම් එය කැප වන්නේ කෙසේදැයි පහත දැක්වෙන ආකාරයට දේශනා කොට වදාළ සේක. තමා උදෙසා මේ ප්‍රාණියා ඝාතනය කළ බව තමා නො දුටුවේ නම් හෝ එසේ අසා නො තිබුණේ නම් හෝ එසේ සැකයක් පහළ නොවුණේ නම් හෝ එවැනි ත්‍රිකෝටික පාරිසුද්ධියෙන් යුක්ත දානය අනුදැන වදාරා ඇත.

තථාගතයන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය තුළ ප්‍රාණඝාතය හා මාංශ පරිභෝගය පිළිබඳ දේශනා කොට ඇති විවිධ ධර්ම කොටස් අතර ජීවක සූත්‍රයට සුවිශේෂී තැනක් හිමිවේ. ඉහත දැක්වූ ධර්ම කොටස් තුළින් ප්‍රාණඝාතයේ ඇති අකුසලයන් මෙන්ම දැන දැන හෝ පෙනි පෙනී හෝ සැක ඇතිකර ගනිමින් හෝ මාංශ අනුභවය යන දෙකම සපුරා ප්‍රතික්ෂේප කරන බව මැනවින් වටහා ගත යුතුය. බුදුදහම සාකල්‍යයෙන්ම අවිහිංසාවාදී දහමකි. සෑම සියලු ආකාරයෙන්ම ප්‍රාණඝාතය මෙන්ම සත්ව හිංසාව ද බුදුදහම විසින් ප්‍රතික්ෂේප කොට ඇත. එසේම පිළිවෙත් සපුරන බෞද්ධයෝ මාංශ අනුභවය පිළිකුල් කරති. ජීවිතේන්ද්‍රිය සහිත සත්වයන්ගේ රූපස්කන්ධය කෙරෙන් එම ජීවිතය කර්මානුරූපව අභාවයට පත්වීමට ඉඩ නොදී ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන් මුල් කොට යම් කිසි උපක්‍රමයකින්

"සියල්ලෝ දඬුවමට තැති ගනිත්. සියල්ලෝ මරණයට බිය වෙත්. ඒ නිසා තමා උපමා කොට සිතා අනුන් නොනැසිය යුතුය. නොනැස්විය යුතුය."



අතරමගදී විනාශ කිරීම ප්‍රාණඝාතය ලෙස සැලකේ. පණ ඇති සතුන්ට කරන වද හිංසාව ද ප්‍රාණඝාතය ලෙසම සැලකේ.

සතුන්ගේ ප්‍රාණය වෙන් කිරිමේදී සිත, කය, වචනය මුල්කොට සය ආකාර ප්‍රයෝගයන්ගෙන් ප්‍රාණඝාත අකුසලය සිදු කරගනී.

1. අතින් පයින් ආදියෙන් ගැසිමෙන් හෝ කඩු, කිණිසි, පොලු ආදියෙන් පහරදී මරණයට පත් කිරීම
2. අනුන්ට නියම කොට මැරීම
3. දුර සිටින කෙනෙකු ගල් ගසා හෝ වෙනත් නොයෙක් ක්‍රියාවන්ගෙන් මැරීම
4. වස විස යොදා හෝ මරණයට පත් කිරීම
5. නොයෙක් රෝග උපදවා මැරීම
6. නොයෙක් ප්‍රයෝග යොදා මැරීම

ආදී නොයෙක් ආකාරයන් ගෙන් මැරීම හා මරණ නියෝග කරන්නාටද ප්‍රාණඝාත අකුසලය සිදුවේ.

ප්‍රාණ ඝාතයට ලොකු කුඩා භේදයක් නොමැත. කුරාකුහුඹුවන් පවා මැරීම ප්‍රාණඝාතයකි. සතකුවීම, සතකු බව හැඟීම, මරණ සිත, ඒ සඳහා කරන උපක්‍රම, එමගින් මරණයට පත් කිරිම, යන අංග පහ ප්‍රාණඝාත අකුසලයට එක්වේ. ප්‍රාණඝාතය කරන්නා කොහේ සැඟවී සිටියත් එම පාපයෙන් මිදිය නොහැකිය. පර පණ නසන්නන්ගේ ආයුෂ අඩුය. ලෙඩ දුක් වැඩිය. ප්‍රිය විප්‍රයෝග දුක් වැඩිවේ. නිතර බියෙන් ජීවත් විය යුතුය.

ප්‍රාණඝාතය නොකොට සෑම සියළු සත්වයාටම සම මෛත්‍රීය පැතිරීමට හැකිනම් ඔහුට හෝ ඇයට නපුරු සිහින නොදැක සැප සේ නිදා ගත හැකිය. සැප සේ අවදි විය හැකිය. එවැන්නා මනුෂ්‍යයන්ට ප්‍රිය වෙයි. අමනුෂ්‍යයන්ට පවා ප්‍රිය වෙයි. දෙවියන්ගේ පවා ආරක්ෂාව සැලසේ. ගිනි බිය හෝ ඇති නොවේ. යහපත් මරණයක් අත්පත් වෙයි. එවැන්නෝ මරණින් මතු සුගතිගාමීව උපදිති.

ජීවක සූත්‍ර දේශනාව අකුසලයෙන් මිදී කුසල් දහම්හි හැසිරීමට පමණක් නොව දානයක් දීමේදී එය නිවැරදිව පිළියෙල කරදීම කෙරෙහි ද අපේ දැනුම පොහොසත් කරයි. ත්‍රිකෝටික පාරිශුද්ධ ආහාරය භික්ෂූන් වහන්සේට පමණක් නොව ගිහියන්ටද වැදගත් වේ. දහම ගැන හරිහැටි නොදැන භික්ෂූන් වහන්සේ පිළිබඳ අගතිගාමී විවේචන කරන ඇතැම් දෙනා මෙම සූත්‍ර දේශනාවද සිහිනුවණින් යුතුව කියවා බැලීම සුදුසුය.

"යම් තැනක සිට පවේ විපාකයෙන් මිදිය හැකිද එබඳු තැනක් අහසෙහිත් නැත. මුහුද මැදත් නැත. පර්වත කුහරයකවත් නැත. එබඳු බිම් පෙදෙසක් ලොව කොහේවත් ඇත්තේ නැත."

# නිරෝගී බව ඇතිකරන ලෙඩ දුක් නසන මොකක්ද මේ ගිරිමානන්ද සූත්‍රය



සත්ත්වයකුගේ රූප, වේදනා, සංඥා, සංඛාර විඤ්ඤාණ යන පංචස්කන්ධයම එක්ව පවතින අතර මෙම ස්කන්ධ පහ ක්‍රියාකාරී වශයෙන් එකිනෙකට වෙනස්ය. බුදුරදුන් ගිරිමානන්ද සූත්‍රයෙන් දක්වා ඇත්තේ පංචේන්ද්‍රියවලින් රූපාදී අරමුණු තම තමන්ගේ බුද්ධි සීමාව තුළ හඳුනා ගැනීම නොව පංච උපාදනස්ඛන්ධ අනිත්‍යාදී වශයෙන් හඳුනා ගැනීමේ යෝනිසෝ මනසිකාරයෙන් නිර්වාණගාමී පිළිවෙතට අවතීර්ණ වීමයි. සත්ත්වයාගේ පුහුදුන් ස්වභාවය අනුව පංචේන්ද්‍රියන්ගෙන් රූපාදිය හඳුනා ගන්නේ තාවකාලික ප්‍රයෝජන අපේක්ෂාවෙනි. ඒවා සංකල්ප වශයෙන් මනසේ රැඳෙන විට කමච්ඡන්දදී පංච නීවරණවලින් ශ්‍රද්ධාදී කුසල චේතනා ඇතිවීම වාරණය වන්නේය. එහෙත් ප්‍රඥවන්තයා සිහිබුද්ධියෙන් ගෝචර ධර්ම හඳුනාගෙන නීවරණ ධර්මයන් යටපත් කොට සතර සම්‍යක් වීර්යයෙන් කුසල ධර්මයන් වර්ධනය කරගන්නේය.

සත්ත්වයකු උපන් ද පටන් පෙර ආත්මයෙන් චුතිතිත්තයට අයත් තදලම්භන අරමුණට අනුව පිහිටුවා ගත් සිතින් ලෝකය හඳුනා ගන්නේ පාරම්පරික සම්මතයට සාපේක්ෂ

"යමෙක් මුලදී පමා වුවත් පසුව නොපමා වේද ඔහු වලාකුළින් නිකුත් වූ සඳක් මෙන් මේ ලෝකය බබුළුවයි."

වශයෙනි. මේ නිසා පවත්නා පරිසරයට අනුගතව ලෙඩ රෝග, අතුරු අන්තරා, අපල උපද්‍රව ආදී දුක් වේදනාවන්ට භාජනය වන්නේය. අභ්‍යන්තර, බාහිර අනිෂ්ඨ සංඥා නිසා අහිතකර ප්‍රතිවිපාක ලබන්නේය. සාමාන්‍ය සංඥා දීර්ඝ කාලයක් ඒ ආකාරයෙන්ම පවතින්නේ නම් මාරයා ඉතා ඉක්මනින් ග්‍රහණය කරගන්නේය.

අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ අනිත්‍ය, අනත්ත, අසුභ, ආදීනව, ප්‍රහාණ, සබ්බ සංඛාර අනිත්‍ය, විරාග, නිරෝධ සබ්බලෝක අනභිරත, ආනාපාන සති යන දස සංඥාවලින් තමාගේ ශරීරය හා මනස පිළිබඳවත් බාහිර ලෝකය පිළිබඳවත් තණ්හා මාන දිට්ඨි වශයෙන් සාවද්‍ය දැකීම් හා හැඟීම් ක්‍රමයෙන් සන්තානයෙන් බැහැර වන්නේය.

ශරීරය මෙතරම් පීඩාකාරී වන්නේ එහි ඇති කුඩා අනු කුඩා අංගෝපාංගවල පවත්නා අනිත්‍ය ස්වභාවය නිසාය. මෙම ප්‍රවණතාවය නොවේ නම් ජීවිතයක් පවත්වා ගැනීමටද නොහැකි වන්නේය. එහෙත් සිත නොවැඩූ පුහුදුන් පුද්ගලයන් ශරීරය ඒකකයක් වශයෙන් තණ්හාව නිසා තදින් අල්ලා ගැනීමෙන්ද, මානයෙන් අනුන් හා විශ්ලේෂණය කිරීමෙන්ද දිට්ඨියෙන් කලකට හා ස්වභාවයකට තීරණය කිරීමෙන්ද තම තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් පාලනය කරගන්නේය. එයින් තමන්ගේ කර්මයෙන් ගෙන ආ විපාක ප්‍රකට වී ජාති, ජරා, මරණ, ශෝක, පරිදේවාදී අනේකවිධ දුක් වේදනා විඳවන්නේය.

සියලු සංස්කාර ධර්මයන් නිරුද්ධ වන කාම, භව, දිට්ඨි, අවිජ්ජා යන උපදීන් බැහැර කිරීම තණ්හාව නැති කිරීම හා විරාගයද දස සංඥාවේම උපරිම අංගයකි. මෙම සූත්‍රයෙන් දක්වෙන අවසාන සංඥාව ආනාපාන සතියයි. ආශ්වාස ප්‍රශ්වාස 34 ආකාරයකට කිරීමෙන් ඒ පිළිබඳව ඉතා සියුම්ව සිහිබුද්ධියෙන් අරමුණු කරගැනීම ශාරීරික හා මානසික වේදනා සමනය කරගැනීමට හේතුකාරක වන්නේය.

සත්ත්වයා උපන් ද පටන් මරණය දක්වා කරන නිරායාස නිත්‍ය ක්‍රියාව නම් නාසයෙන් හුස්ම ගැනීම හා පිටකිරීමයි. බාහිර වාතය නාසයෙන් ඇතුල් වී ගලනාලය දිගේ උදරයට අවුත් යළිත් එම මාර්ග යෙන්ම පිටවීම ආශ්වාස ප්‍රශ්වාසයයි. මෙම නිත්‍ය ක්‍රියාවලිය සිහි කල්පනාවෙන් ආනාපානසති භාවනාවෙන් සමථ භාවනාව වඩා විදර්ශනා භාවනාවට යොමු කළ යුතු වන්නේය.

ගිරිමානන්ද සූත්‍ර ධර්ම දේශනාවෙන් ගිරිමානන්ද හිමියන්ගේ රෝගාබාධය සමනය වී නීරෝගී සම්පත්තිය ඇතිවිය.

මෙම සූත්‍රය නිතර දේශනා කිරීමෙන්, දස සංඥා අර්ථය දැනගැනීමෙන් එමෙන්ම සතිපට්ඨානයෙන් ලැබෙන ප්‍රයෝජන අපමණය.

1. සංඥා පරිවර්තනයෙන් සිහි කල්පනාව ඇතිවීම
2. නීරෝගී සම්පත්තිය
3. පාළි භාෂාව දැනගැනීම
4. බුද්ධ ධර්මය දැනගැනීම
5. සිහියෙන් ජීවිතය අවසන් වීම
6. සුගතිගාමී වීම
7. නිර්වාණගාමී ප්‍රතිපදාව පිළිපැදීම

සත්ත්වයකු දවසකට යන්නා වූ අරමුණු අපමණය. එයින් නෙරපෙන සිත නිසා ලෝභාදී අකුසල චේතනාවෙන් රැස්වෙන චිත්ත සන්තානයෙන් දෙලොවටම යහපතක් වන්නේ නැත. මේ නිසා මානසික පරිවර්තනයෙන් සන්තානය පිරිසිදු කරගත් විට මනසේ ලේ ධාතුවද පවිත්‍ර වී නීරෝගී සම්පත ළඟා වන්නේය.

අප බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කළ සියලු ධර්මයන්ගේ සාරාංශය මෙම ගිරිමානන්ද සූත්‍රයට අනුයුක්තව ඇති බැවින් චතුරාර්ය සත්‍ය ධර්මය, ත්‍රිවිධ ශික්ෂා, පටිච්ච සමුප්පාදය, සතර සතිපට්ඨානය, සමථ විදර්ශනා භාවනා ආදී ගැඹුරු දහම් කොටස් පරිශීලනය කරන්නට අවස්ථාව ලැනෙ අතර ආර්යමාර්ග ප්‍රතිපදාවෙන් නිවන් අවබෝධයටද උපයෝගී වන්නේය.


අනවරාග්‍ර සසර සැරිසරන සත්ත්වයා පංචේන්ද්‍රිය මගින් හඳුනා ගන්නා අරමුණු අනුව කොතරම් සැප සම්පත් ලැබුවද එහි අවසානය අනන්ත දුක් වේදනාවලින් පිරී පවතින්නේය. සංඛාරවල ස්වභාවය රැස්වීමයි. යළි එය වෙනස් වීමටද පත්වන්නේය. එහෙත් එයට කිසිම අනුබලයකින් ලබාගත් ශරීරය බැහැර කරන්නට බැරි නිසා සංස්කාරවලින් සිත අයින් කිරීම උතුම් සැපත වන්නේය.

උපත, පැවැත්ම හා විනාශය යන ත්‍රිලක්ෂණය යෝනිසෝ මනසිකාරයෙන් විමසා බලා ඒ පිළිබඳව ගිරිමානන්ද සූත්‍රයේ දක්වෙන දස සංඥා ප්‍රගුණ කිරීමෙන් දෙලොව ශාන්තිය හා අවේදයික සැපත වූ උතුම් නිවණින් සැනසීමට හැකි වන්නේය.

**පූජ්‍ය අමුණුපුර පියරතන හිමි**

# ගිහි ජීවිතයේ සිටියදීම නිවන් මගේ යා හැකිද?

## පූජ්‍ය රාජගිරියේ අරියඥාන ස්වාමීන් වහන්සේගෙන් අහමු



❐ ස්වාමීන් වහන්ස, සාමාන්‍ය බෞද්ධයෙක්ට තම එදිනෙද කටයුතුවල යෙදෙන අතරම නිවනම අරමුණු කරගත් මාර්ගයක ගමන් කළ හැකිද?

2. ගිහි ජීවිතයේ හිඳිමින් ශීලය ආර්ය ශීලයක් කරගන්නේ කෙසේද?

3. සමාධය ආර්ය සමාධියක් කරගන්නේ කෙසේද?

1. දූන් මෙතැනදී ඕනෑම ගිහි පින්වතෙකුට කාන්තා වේවා, පිරිමි වේවා මේ ජීවිතය තුළදී සෝවාන්, සකෘදගාමී, අනාගාමී යන ඵලයන්ට පත්වෙන්න පුළුවන්. කිසිම ගැටලුවක් නැහැ. ඕනෑම පුරුෂයෙකුට කාන්තාවකට මේ ධර්ම මාර්ගය තුළ ගමන් කර ආර්ය අෂ්ඨාංගික මාර්ගය තුළ ගමන් කර සෝවාන්, සකෘදගාමී, අනාගාමී යන ඵලයන්ට පත්වෙන්න පුළුවනි. නමුත් බුදුරජාණන් වහන්සේ නිරතුරුවම ගිහි පින්වතුන්ලාට ඉලක්කය හැටියට පෙන්වන්නේ මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න කියන කාරණයයි. දූවා දරුවන් පෝෂණය කරමින්, ඉකඩම්, දේපළ පරිහරණය කරමින්, යානවාහන, ගෙවල් දෙරවල් පරිහරණය කරමින්, ඒවා කෙරෙහි තෘෂ්ණාව හීන කරගනිමින් මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වෙන්න කියන ඉලක්කයට තමයි බුදුරජාණන් වහන්සේ දෙන්නේ. ඒ නිසා නිරතුරුවම විචිකිච්ඡාව කියන කාරණයෙන් බැහැර වෙන්න. මොකද අපි තුළ විචිකිච්ඡාව, සැකය තියෙනවා පින්වතුනි.

මේ විචිකිච්ඡාව කියන්නේ මොකක්ද? අපි තුළ සැකයක් තියෙනවා මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙන්න බැහැ, මේ ජීවිතයේ කෙනෙකුට සෝවාන් ඵලයට පත්වෙන්න බැහැ, නැවත වතාවක් මෛත්‍රී බුදුරජාණන් වහන්සේගේ ශාසනය ඇතිවෙන තුරු සෝවාන් ඵලයට කෙනෙකුට පත්වෙන්න බැහැ කියන සැකය. මේ සැකයෙන් මුලින්ම මිදෙන්න පින්වතුනි. මේ සැකය තිබෙන තාක් කල් ඔබට මේ මාර්ගය තුළ ගමන් කරන්න බැහැ. බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා ධර්මය සන්දිට්ඨිකව තිබෙන තාක්කල් ඒ උතුම් ආර්ය මාර්ග යේ ඵලයන් ලබන්න ලෝකයාට පුළුවන් කියලා. ධර්මය සන්දිට්ඨිකව තියෙනවා පින්වතුනි, ධර්මය සන්දිට්ඨිකව තියෙනවා කියන්නේ මේ උතුම් ප්‍රාතිමෝක්ෂයන් ආරක්ෂා කරගෙන, උපසම්පද භික්ෂූන් වහන්සේලා චතුරාර්ය සත්‍යය දේශනා කරනවා. ආර්ය අෂ්ඨාංගික මාර්ගය දේශනා කරනවා. ඒ කියන්නේ ධර්මය අපේ ඇස් පනාපිටම අපි ඉදිරියේ තිබෙනවා පින්වතුනි. එහෙම නම් විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. බැහැයි කියන විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. බැහැර වෙලා අර පරමාදර්ශී චරිත මේ ගිහි ජීවිතය තුළ සිට, මේ ගිහි ජීවිතය තරණය කරලා සෝවාන් පළයට පත්වුණා වූ පරමාදර්ශී චරිත ඔබේ ජීවිතයේ පරමාදර්ශය බවට පත්කර ගන්න.

කවුද මේ ජීවිතයේ සෝවාන් ඵලයට පත්වූ පරමාදර්ශී චරිත, අර විශාඛාව බලන්න, අනේපිඬු සිටුතුමා, නකුල මාතා, නකුල පිතා, වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා මේ ගිහි ජීවිත ගත කරමින් මේ ගිහි ජීවිතයේ උතුම් අධිගමයන් කරා ගිය අය පින්වතුන්. බලන්න විශාඛාවට

දරුවන් විසිදෙනෙක් සිටියා. මුනුපුරු, මිනිබිරියන් සිය ගණනක් සිටියා. එහෙම නම් බලන්න දරුවෝ ඉන්නවා කියන කාරණය මේ ගමන යන්න අපට බාධාවක් වෙන්නේ නැහැ. අනේපිඬු සිටුතුමා කියන්නේ කෝටිපති ව්‍යාපාරිකයෙක්. ජේතවනය රන්කාසිවලින් අතුරනවා. ඒ සා ධනයක් තිබුණා පින්වතුනි. එහෙම නම් මම ධනවතෙක් කියන කාරණය මේ ගමන යන්න අපට බාධාවක් නැහැ. එතකොට බලන්න වේළුකණ්ඨකී නන්ද මාතාව ගෙදරක හිටිය මැදිවියේ අම්මා කෙනෙක්. නන්ද කියන එකම දරුවාගෙ අම්මා, මේ අම්මා අනාගාමී උපාසිකාවක් පින්වතුන් කාම, රාග, පටිසයන් නැහැ. එයා කාමය ගැන හඳුනන්නේ නැහැ. ශාරිපුත්‍ර මහරහතන් වහන්සේ දේශනා කරනවා මේ වේළුකණ්ඨකී නන්ද මාතාව සතරවරම් දෙවියන් එක්ක දිවැසින් කතා කරනවා කියා පින්වතුනි. එයාට දෙවියන් එක්ක දිවැසින් කතා කරන්න පුළුවන්.

එතකොට බලන්න උග්ග ගෘහපතිවරයා බිරින්දෑවරු පස්දෙනෙක් සමග එක ගෙදරක සිටියා. මේ බිරින්දෑවරු පස්දෙනා ළඟට කතා කර කියනවා මම බුදුරජාණන් වහන්සේ ළඟට බණ අහන්න යනවා කියලා. ගොස් සද්ධර්මය ශ්‍රවණය කරනවා. ශ්‍රවණය කළා වූ සද්ධර්මය නුවණින් මෙනෙහි කරලා, මෙනෙහි කරලා, කාම, රාග, පටිසයන් නැති කරලා, තුනී කරලා අනාගාමී ඵලයට පත්වෙනවා. පින්වතුනි, අනාගාමී ඵලයට පත් වුණාට පස්සේ මේ උග්ග ගෘහපතිවරයා ගෙදරට එනවා. ගෙදරට ඇවිත් බිරින්දෑවරු පස්දෙනා ළඟට අඬ ගසා කියනවා, අදින් පස්සේ මම ඔබලා සමග කාමයෙහි ඇසුරක් නැහැ, මට දූන් එවැනි සිතුවිලි සකස් වෙන්නේ නැහැ, ඔබලා කැමති කෙනෙක් විවාහ කරගෙන යන්න, කැමති කෙනෙක් සහෝදරියෝ හැටියට මේ ගෙදර ජීවත් වෙන්න කියලා. එක බිරිඳක් කියනවා මට අහවලා විවාහ කරගෙන යන්න ඕනෑ කියලා. එයා ගෙනැල්ලා අතපැන් වත්කර විවාහ කර දීලා, දයාද දීලා පිටත් කරනවා. අනික් බිරින්දෑවරු හතරදෙනා කියනවා අපි සහෝදරියෝ වගේ මේ ගෙදර ඉන්නවා කියලා. එහෙම නම් බලන්න උග්ග ගෘහපතිවරයා කියන අනාගාමී උපාසකතුමා බිරින්දෑවරු හතර දෙනෙක් සහෝදරියන් හැටියට එක ගෙදර ජීවත් වුණ කෙනෙක්. එහෙමනම් පින්වතුනි, කොතැනකවත් බාධාවක් ඇතිවෙන්නේ නැහැ, කොතැනකවත් විචිකිච්ඡාවක්, සැකයක් ඇති වෙන්නේ නැහැ, මේ ගිහි ජීවතය ගත කරමින් මේ උතුම් අධිගමයන් කරා යන්න පුළුවන් කියන සහතිකය බුදුරජාණන් වහන්සේ අපට ලබලා දෙනවා.

එහෙම නම් මුලින්ම විචිකිච්ඡාවෙන් බැහැර වෙන්න. විචිකිච්ඡාවෙන් බැහැර වෙලා ධර්මය කෙරෙහි, මාර්ගය කෙරෙහි, බුදුරජාණන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇති කරගන්න. ඒ විශ්වාසය ඇතිකරගෙන අර පරමාදර්ශී ජීවිත ගත කළා වූ පරමාදර්ශය ඔබේ ජීවිතවලට එකතු කරගන්න. විශාඛාව ජීවත් වුණේ යම් සේද මම විශාඛාවක් වෙනවා කියලා දකින්න. විශාඛාවට ජීවිතයේ මැදි වයසේදී බුදුරජාණන් වහන්සේ ළඟට ඇවිත් කියනවා භාග්‍යවතුන් වහන්ස මට වරයන් අටක් ඕනේ කියලා. මොනවද මේ වරයන් අට?

1. දවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට වැසි සළු පිදීමට.
2. දිවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට ආගන්තුක බත පිදීමට.
3. දිවි හිමියෙන් සියලු භික්ෂූන් වහන්සේලාට ගමික බත පිදීමට.
4. දිවි හිමියෙන් සියලුම ගිලන් භික්ෂූන් වහන්සේලාට සත්ප්‍රාය ආහාර සකස් කොට පිදීමට.
5. දිවි හිමියෙන් ගිලන් භික්ෂූන්ට උවටැන් කරන භික්ෂූන් වහන්සේලාට අවශ්‍ය ආහාර පිදීමට.
6. දිවි හිමියෙන් ගිලන් භික්ෂූන්ට අවශ්‍ය ඖෂධ වර්ග පිදීමට.
7. ඔබ වහන්සේ අන්ධකවින්ද නුවර වැඩ සිටියදී දේශනා කළ පරිදි දස වැදෑරුම් වූ ආනිසංස ලැබෙන කැඳ මාගේ දිවි හිමියෙන් භික්ෂූන් වහන්සේලාට පිදීමට.
8. දිවි හිමියෙන් භික්ෂුණීන් වහන්සේලාට දිය සළු (උදක සාටිකා) පිදීමට.

කවුද මේ. සෝවාන් ඵලයට පත්වූ විශාඛා උපාසිකාවයි. බුදරජාණන් වහන්සේ මේ වර අට අනුදැන වදළා. එතකොට බලන්න වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා, අනේපිඬු සිටුතුමා එක වතාවට පන්සියයක් ස්වාමීන් වහන්සේ ගෙදරට වඩම්මවනවා. පන්සියයක් ස්වාමීන් වහන්සේලා ගෙදරට වැඩම කරවලයි දානය පූජා කරන්නේ පින්වතුනි, එහෙම නම් බලන්න මේ මාර්ගඵල



''ආශාව නිසා ශෝකය හටගනී. බිය හට ගනී. ආශාවෙන් වෙන් වූවනට ශෝකයක් නැත. බියකුත් නැත.''

ලාභී උපාසක, උපාසිකාවන් කොයිතරම් ශාසනය උදෙසා, ස්වාමීන් වහන්සේලා උදෙසා, මේ ශාසනික සේවාවන් සිදුකළාද කියා.

නමුත් බලන්න අපේ සමාජයේ කෙනෙක් සෝවාන් ඵලයට පත්වුණා කිව්වොත් කුමක්ද සිද්ධ වෙන්නේ? එදයින් පසුව එයා පන්සලට යන්නේ නැහැ පින්වතුනි. එයා ස්වාමීන් වහන්සේලාට වන්දනා කරන්නේ නැහැ. බුදු පිළිම වහන්සේලාට වන්දනා කරන්නේ නැහැ. පන්සලට සිල් ගන්න යන්නේ නැහැ. ඇයි? මම සෝවාන් ඵලයට පත්වෙලා කියලා, පින්වතුනි. බලන්න සමාජය කොයිතරම් විකෘතීන් කරා ගමන් කරනවාද කියා. ඇයි මේ සමාජය විකෘතීන් කරා ගමන් කරන්නේ පින්වතුනි? එයට හේතුව තමයි, අර පරමාදර්ශී චරිත අනුව අපේ ජීවිත ගොඩනගා ගන්න අපි දක්ෂ නැහැ.

ඒ නිසා ඔබ චිත්තයක් ඇතිකර ගන්න. මම මේ ජීවිතයේ සතර අපායෙන් මිදෙනවාය කියන චිත්තය. ඡන්දය, කැමැත්ත ඇතිකර ගන්න. එහෙම කැමැත්ත ඇතිකරගෙන ඔබ තුළින්ම ඔබ තීන්දුවක් ගන්න විශාඛාව ජීවත් වූයේ යම් සේද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් ඇතිකර ගන්න. අනේපිඬු සිටුතුමා ජීවත් වුණේ යම් සෙද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් අතිකර ගන්න. වේළුකණ්ඨකී නන්ද මාතාව, උග්ග ගෘහපතිවරයා ජීවත් වුණේ යම් සේද මම එවැනි කෙනෙක් වෙනවා කියා චිත්තයක් ඇතිකර ගන්න. ලෝකය යන දිශාවට යන්න එපා පින්වතුනි. මොකද ලෝකය යන්නේ දුක දිශාවටමයි. මොකද ලෝකය අයිති මාරයාටයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ලෝකය යන දිශාවට යන්න එපා.



මේ ධර්ම මාර්ගය තුළ ගමන් කරන කෙනා උඩුගං බලා යන කෙනෙක් පින්වතුනි. එයා දුක පැත්තට, මුහුද පැත්තට ගලාගෙන යන කෙනෙක් නොවේ. එයා උඩුගං බලා යන විට ලෝකයා ඉදිරියේ ඔබ අමුත්තෙක් වෙන්න පුළුවන්. ලෝකයා ඉදිරියේ ඔබ පිස්සෙක්, පිස්සියක් කියා ලෝකයා කියන්න පුළුවන්. නමුත් මේ කොතැනකදීවත් ඔබේ ගමන ඔබ බාධා කරගන්න එපා පින්වතුනි. මොකද මුළු ලෝකයම ඔබට අහිමි වුණත් බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ ඉන්නවාය කියන විශ්වාසය ඔබ ඇතිකර ගන්න. මේ ධර්ම මාර්ගය තුළ ඔබ ගමන් ගනිද්දී මුළු ලෝකයම ඔබට නැති වුණත් බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ ඉන්නවාය කියන විශ්වාසය හිතේ ඇතිකර ගන්න. මුළු ලෝකයම අත්වැල් බැඳගෙන කරට අත දගෙන හිටියත් වැඩක් නැහැ බුදුරජාණන් වහන්සේ අපි ළඟ නැත්නම් පින්වතුනි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ තමා තුළ ඉන්නවාය කියන විශ්වාසය තුළ ධර්මයේ සන්දිට්ඨික භාවය ජීවමානව පවතින මේ මොහොතේ මේ ජීවිතයේ සෝවාන් පළයට පත්වෙන්න පුළුවන් කියන විශ්වාසය ඇතිකර ගන්න.

2. ශීලය ආර්ය ශීලයක් බවට පත් කරන්නේ කෙසේද? ශීලය ආර්ය ශීලයක් බවට පත්කරනවාය කියන්නේ ශීලය විදර්ශනා නුවණින් දකිනවා කියන එකයි. අපි කොච්චර සිල් සමාදන් වුණත් අපිට ලැබෙන්නේ භවයයි පින්වතුනි. බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ආවා වූ භව ගමනේදී මුණ ගැසුණා වූ සම්මා සම්බුද්ධ ශාසනවල ඔබලා සිල් සමාදන් වෙන්න ඇන්ද සුදු සිල් රෙදි එක ගොඩක් ගැසුවොත් එය ගිජ්ජකූඨ පර්වතයට වඩා විශාලයි කියලා පින්වතුනි. එහෙම නම් බලන්න ඔබලා ඒ සා සංසාරයේ සිල් සමාදන් වෙලා තියෙනවා. නමුත් ඒ සා සිල් සමාදන් වෙලා අපි ප්‍රාර්ථනා කළේ, අපි ලැබුවේ කුමක්ද? භවයමයි පින්වතුනි. අපි ශීලය විදර්ශනා නුවණින් දක්කේ නැහැ. ශීලය ආර්ය ශීලයක් බවට පත් කළේ නැහැ.

දැන් ඔබ හිතන්නකෝ පංච ශීලය සමාදන් වෙනවා. පංච ශීලය සමාදන් වෙලා සිල් පද පහ ඇස් දෙක වගේ ආරක්ෂා කරගන්නවා. ආරක්ෂා කළා වූ සිල් පද ආවර්ජනය කරනවා. ආවර්ජනය කරමින් ශීලයේ සංස්කාරයන්ගේ අනිත්‍ය භාවය දකිනවා. සංස්කාරයට බැඳෙන්නේ නැහැ. මම මුලින් මතක් කළා, ශීලයේ සංස්කාරයන් මොනවාද කියලා. ශීලයේ සංස්කාරයන් තමයි,

1. **මහත් වූ භෝග සම්පත් ලබනවා.**
2. **තමාගේ කීර්ති රාවය පැතිරෙනවා.**
3. **ඕනෑම සභාවකට නොබියව යනවා.**
4. **සිහි මුළා නොවී මැරෙනවා.**
5. **මරණින් මතු සුගතියේ උපදිනවා.**

එහෙම නම් මේ සෑම සංස්කාරයක්ම අනිත්‍යයි පින්වතුනි. සිල් සමාදන් වෙමින් සමාදන් වුණා වූ ශීලය රැක ගනිමින්, ඒ රැකගන්නා වූ ශීලයේ ආනිශංසයන්ගේ අනිත්‍යභාවය දකිමින් ජීවත් වෙන්න. සිල් සමාදන් වෙලා අනාගතයේ දෙවියෙක් වේවා කියා චිත්තයක් ඇති වුණොත් ඔබ ශක්‍රයා වෙලා ඉඳලා සතර අපායට වැටුණ හැටි සිහිපත් කරන්න.

සිල් සමාදන් වෙලා ඔබට බ්‍රහ්මයෙක් වෙන්න කියා චිත්තයක් ඇති වුණොත් ඔබ රූපාවචර, අරූපාවචර, බ්‍රහ්මතලවල කල්ප ගණන් ඉඳලා ආයිමත් සතර අපායට වැටුණ හැටි සිහිපත් කරන්න. සිල් සමාදන් වෙලා ඔබට නැවත මනුෂ්‍යයෙක් වේවා කියා චිත්තයක් ඇති වුණොත් ඔබ සක්විති රජවෙලා ආයිමත් සතර අපායට වැටුණ හැටි සිහිපත් කරන්න. ශීලයේ සංස්කාරයන්ට බැඳෙන්න එපා. ශීලය තුළින් සුගතියේ උපතක් කියන සිත සකස් වෙන විටම ඒ සුගතියේ තිබෙන්නා වූ අනිත්‍ය භාවය නුවණින් දකින්න. එහෙම නැත්නම් ඒ සිතේ අනිත්‍ය භාවය දකින්න දක්ෂ වෙන්න. මෙන්න මේ විදිහටයි ශීලය ආර්ය ශීලයක් බවට පත්වෙන්නේ. මොකද බුදුරජාණන් වහන්සේ පහළ වෙන්නත් පෙර ශීලය දඹදිව තිබුණා පින්වතුනි. මහාමායා දේවියගේ මව්කුසට අපේ සිදුහත් කුමාරයා එන දවසේ එතුමිය උපෝසථ ශීලයක් සමාදන් වෙලයි තිබුණේ. එහෙම නම් ශීලය කියන්නේ බුදුරජාණන් වහන්සේ පනවපු දෙයක් නොවේ. බුදුරජාණන් වහන්සේ කුමක්ද කළේ? සමාජයේ තිබුණා වූ ශීලය ආර්ය ශීලයක් බවට පත් කළා. ආර්ය ශීලය කියන්නේ විදර්ශනා නුවණ. ප්‍රඥාව සකස් වෙන්වා වූ ශීලයයි. ඒක තමයි ආර්ය ශීලය.


**3. සමාධිය ආර්ය සමාධියක් බවට පත්කර ගන්නේ කෙසේද?** ඔබ කොච්චර නම් සමාධිය වැඩුවත්, සමාධිය වඩා ඔබ කොච්චර ධ්‍යාන තල පුහුණු කරගෙන සිටියත්, විදර්ශනා නුවණක් ඔබට සකස් කරන්නේ නැහැ. ධ්‍යාන උපාදන කරගත්තොත්, සමාධියට හිත ගියොත් ඔබ රූපාවචර, අරූපාවචර බ්‍රහ්මතලවලයි උත්පත්තිය ලබන්නේ. මේවා ලෞකික බ්‍රහ්ම තල පින්වතුනි. මාර්ගඵල පැත්තට ඔබේ සිත යන්නේ නැහැ. එතකොට සමාධිය ආර්ය සමාධියක් කරන්න නම් ඔබ මුලින්ම ධ්‍යානයක් සකස් කරගෙන ඒ ධ්‍යානයෙන් විදර්ශනා නුවණින් දකින්න දක්ෂ වෙන්න ඕනේ. ඒ ධ්‍යානයන්ගේ අනිත්‍ය භාවය දකින්න දක්ෂ වෙන්න ඕනේ. මේ ධ්‍යානයන්ගේ අනිත්‍ය භාවය දකින මොහොතේ සමාධිය ආර්ය සමාධියක් බවට පත්වෙනවා පින්වතුනි.

"ඇත්ත කිව යුතුය. අනුන්ට නොකිපිය යුතුය. අනිකකු යමක් ඉල්ලූ කල ටිකක් වුවත් දිය යුතුය. මේ තුන් කරුණෙන් කෙනෙකුට දෙවියන් වෙත යා හැකිය."

# දුසිරි අනුන්ගේ නිති සිහි නො කරන්න සිතමු හොඳයි වෛර නැසුමට මග මෙන්න

අක්කොච්ඡි මං අවධි මං - අජිනි මං අහාසි මෙ
යෙ තං න උපනය්හන්ති - වෙරං තෙසූපසම්මති
(ධම්මපදය - යමක වර්ගය)

අසවලා මට බැන්නේ ය. මට ගැසුවේ ය, මා පැරැද්දුවේ ය. මාගේ දෙය පැහැර ගත්තේයැයි යමෙක් ඔහුට වෛර නො බඳිත් ද ඔවුන්ගේ වෛරය සන්සිඳේ.



වෛරය යනු ඔබේ ප්‍රසන්න, ලස්සන සිත අපවිත්‍ර කරන සිතිවිල්ලක් බව පසුගිය කලාපයේ ධම්මපද දහම් ඔවදනින් ඔබ දැනගත්තෙහි ය. ඔබේ සිතේ හට ගන්නා එම වෛර සිතිවිල්ල සංසිඳුවාගැනීමට හේතුවන කරුණු ඉහත ධම්මපද ගාථාවෙන් අවධාරණය කෙරේ.

බාහිර පුද්ගලයින් ඔබට බැනවැදීමෙන්, ඔබව පැරදවීමෙන්, ඔබේ දේ පැහැර ගැනීමෙන් ආදී විවිධාකාර කරදර, හිංසා ඔබට සිදු කළ විට ඒ ගැන නැවත නැවත සිහි කරමින් ඔබ ඔවුනට වෛර නොබඳින්නේ ද, එයම ඔබේ වෛරය සංසිඳීමට හේතුවන බව මෙහි පැහැදිලි කර ඇත.

ඔබට යමෙක් අවැඩක් කළ විට ඔබේ සිතේ වෛරය හටගැනීම ස්වභාවය යි. එසේ හටගන්නා වෛරය පිළිබඳව ඊට හේතු වූ කරුණුත් සමඟ නැවත නැවත සිහි කළහොත් වෛරය උත්සන්න වී ඔබේ සිතේ ක්‍රෝධය උපදී. ක්‍රෝධ ගින්නෙන් ඔබ රත් වූ විට ඔබට ඔබ ම නොපෙනී යයි. ක්‍රෝධයේ ස්වභාවය වන්නේ තමා කවුදැයි නොදැනීමත් තමා කවුදැයි නොපෙනීමත් ය.

"කුද්ධො අත්තං නජානාති
කුද්ධො අත්තං න පස්සති"

ඒ නිසාම ඔබට නොකළ හැකි වරදක් ද නැත. ඔබ තුළ වෙසෙන සාන්තුවරයා ඔබෙන් ඈත් වී ඉදිරියට එන්නේ දරුණු අමනුෂ්‍යයකි. ඔබේ තරාතිරම, ඔබ ඉදිරියේ සිටින අන්අයගේ තරාතිරම ඔබට නොපෙනේ. ඔබේ මව්පියන් ගුරුවරුන් සහෝදර සහෝදරියන්, ඥාති හිතවතුන් ආදී සියල්ලන්ම ඔබට නොපෙනේ. ඔවුන් ඉදිරියේ ඔබ අමනුෂ්‍යයෙකු අරක් ගත් මිනිස් රූකඩයෙකි. රළු පරළු ගති ඇති නොසන්සුන් පුද්ගලයෙකි. බියකරු පුද්ගලයෙකි. දුර්වර්ණ වූ මුහුණක් ඇතිව බැන වදින්නෙකි. විටෙක ඝාතකයෙකි.

කායිකව මානසිකව රෝගියෙක් කරවමින් ඔබටත් ලොවටත් හානි දායක ලෙස එසේ ඔබව වෙනස් කරන්නේ කුමක් විසින් දැයි මදක් ඔබ සිතුවෙහි ද? ඒ අන් කවරක් නොව ඔබේ සිතේ හටගන්නා නොසන්සිඳුණු වෛරය යි. කැමතිද ඔබ නොසංසිඳුණු වෛරයේ ශාපය ඔබට අත්වෙනවාට. සැබැවින්ම නොවන්නෙහිය. එසේ නම් ඔබ කළයුත්තේ කුමක් ද? වෛරය උපදනා සෑම විට ම ඒ පසුපස හබා නොගොස් ඒ ගැන නැවත නැවත සිහි නොකිරීම යි. ඉන් නොනැවතී ඔබට වෛරය උපදවනා අන් අය කෙරෙහි බිඳෙන් බිඳ මෙත් සිත උපදවා ලීම යි. එවිට ඔබට වෛරයේ ශාපය පහව ගොස් මෛත්‍රියේ ආශීර්වාදය උදා වී ලස්සන වූත් පැහැබර වූත් ජීවිතයක් උදාවන්නේ ය.

**ගුරු උපදේශක ලලිත් අබේසේකර**

"යකඩයෙන් නැගුණ මලකඩ එම යකඩයම කා දමයි. නුවණින් තොරව වසන තැනැත්තාගේ අකුසල් ඔහු දුගතියට යවයි."

18
# දළදා වරුණ
ශ්‍රී දළදා මාලිගාව මාසිකව නිකුත් කරන බෞද්ධ සඟරාව

මාධ්‍ය විශේෂ ව්‍යාපෘති කාර්යාංශය
ශ්‍රී දළදා මාලිගය
මහනුවර
දුරකථන : 0812204684
ෆැක්ස් : 0812236202
E mail : media@sridaladamaligawa.lk
Web : www.sridalada maligawa.lk

## සැබෑ අවුරුදු සතුට

මේ දවස්වල මිනිසුන් වැඩිපුර කතා කරන්නේ ඊළඟ මාසේ පඩිය ලැබෙනකම් ජීවත් වෙන්නේ කෙසේදැයි කියාය. ඊට හේතුවක් තිබේ. සිංහල, දමිළ අවුරුද්ද මහ ඉහළින් සමරා තව වැඩි දවසක් ගතවී නැත. කඩවල්වල විකුණන්නට ඇත්තේ මිනිසුන් වෙනුවෙන් මසන ලද අන්තිම ඇඳුම යැයි සිතා සැතපුම් ගණන් ඇඳුම් මිලදී ගන්නට පෝලිමේ සිටි ගැහැනු, පිරිමි දෙපාර්ශ්වයම තමන් නිර්වස්ත්‍රව සිටියා නම් හොඳයි යැයි සිතන තරමට අද ලැජ්ජාවට පත්වී සිටිති. තමන්ගේ ශීතකරණයේ මස්, මාළු පුරවාගෙන කෑ ඇතැමකු බඩු මිල ඉහළ ගොස් ඇතැයි කියමින් බැණ වදින්නට පටන්ගෙන ඇත්තේ දැන්ය.

- දුවට, පුතාට ටියුෂන් ගාස්තු ගෙවා නැත.
- අවුරුදු කන්නට ඉල්ලා ගත් ණය මුදල ගෙවා දැමූ පසු මාසික වේතනයෙන් ඉතිරි වන මුදලක්ද නැත.
- ඊළඟ මාසය ගෙවා දමන්නට ගෙදර බඩු මුට්ටුද කිසිවක් නැත.
- වතුර බිල්, ලයිට් බිල්, දුරකතන බිල් ගොඩ ගැහිලාය.

මේ ආදී කොටගත් ප්‍රශ්න රාශියකි. නමුත් අවුරුදු දවස්වල මේ කිසිවක් කාටවත් ප්‍රශ්න නොවේය.

''අපි අවුරුදු කෑවා නොවෙයි... අවුරුද්ද අපිව කෑවා...'' කියන කිසිවකු සැබෑ ලෙස ''අවුරුද්ද'' සැමරුවාද යන ප්‍රශ්නය විමසා බලනු වටී. එහිදී පෙනී යන බරපතළම කාරණය වන්නේ අපේ රටේ බොහොමයක් දෙනා තවත් කෙනෙක් අනුකරණය කරන්නට යාමෙන් අමාරුවේ වැටී ඇති බවය.


ලෝකයාට පෙනෙන්නට නොනගත කාලයේ පන්සලට ගිය උදවිය මෙන්ම, උදාවූ අලුත් අවුරුද්දේ දහසකුත් දේ බුදුන්, දෙවියන්ගෙන් ඉල්ලන්නට පන්සල්, කෝවිල් ගිය උදවියද ඕනෑතරම් මේ පුංචි දිවයින තුළ හමු වෙති. අලුත් අවුරුද්ද ජයටම සමරා අද පසුතැවිල්ලෙන් දිවි ගෙවන බොහෝ දෙනකු තමන්ගේ හදවතට ඇත්තටම තට්ටු කර බැලුවාද?

ඔබ කොපමණ ලස්සනට ඇඳුම් ඇන්දත් කවද හෝ දිනක ඔබේ මතකයට නැගී ඇත්තටම සතුටක් අත්වින්දේ අනුන්ට පරිත්‍යාග කළ ඇඳුම ගැන සිතා නේද?

ඔබ කොපමණ රස ගුණ මිහිරි දේ අනුභව කළත් දිනක හිතට සැනසුම අරගෙන ආවේ අනුන්ට දුන් අහර පිඩ පිළිබඳ කල්පනාව නේද?

රැවුම්, ගෙරවුම් සමාජයෙන් කොපමණ ලැබුණත්, ඒවාට එවැනිම විසඳුම් දුන්නත් දිනක හිතට සැනසිල්ල අරගෙන ආවේ ලාභ බලාපොරොත්තුවෙන් තොරව අනුන්ට පෑ මෛත්‍රී සිතුවිල්ල නේද?

උදාවූ නව වසරේ ඔබේ අදිටන විය යුත්තේ මෙබඳු ''පින් සිතුවිලි'' පමණක් නොවේද? ''දළද වරුණ'' පැතුමද ඔබට ''ඥනය'' පහළ වේවා යන්නය. ■



# හිස තෙල්

## මහනුවර නාථ දේවා

## ඇති සම්බන්


සිංහල හින්දු අලුත් අවුරුදු උළෙලේ ඉටු කෙරෙන පාරම්පරික චාරිත්‍ර රාශියකි. ඒවායේ ජාතීන් හා පළාත් අතර සුළු සුළු වෙනස්කම් ඇත. සුබ නැකතින් හිස තෙල් ගෑම අවුරුදු උළෙලේ ඉටුවන වැදගත්ම අවුරුදු චාරිත්‍රයකි. මේ හිස තෙල් ගෑමේ උත්සවයේදී සෙන්කඩගල ඇති ලංකාවේ ප්‍රධාන නාථ දේවාලය වූ නාථ දේවාලයෙන් ඉතා වැදගත් මෙහෙයක් ඉටු වෙයි. එදා සෙන්කඩගල යුගයට වඩා අද කාලය වෙනස් වී ඇතත් පැරණි චාරිත්‍ර රැසක් මහනුවර නාථ දේවාලයෙන් අදත් සිදුවෙයි.

චීනය, ජපානය, ටිබෙට් ආදී මහායාන බෞද්ධ රටවල අවලෝකිතේශ්වර නාථ ඉතා ප්‍රබල බලගතු පූජනීය බෝධිසත්වරයෙකි. එතුමාගේ බිසව තාරා දෙවඟනයි. මහායාන බලපෑම නිසා අනුරාධපුර මුල් කල සිටම අභයගිරිය, ජේතවනාරාමය වැනි මහායානයට බර ලාංකික විහාර ඔස්සේ අවලෝකිතේශ්වර නාථ හා තාරා දෙවඟන පිදීම තිබී ඇත. විශේෂයෙන් වරායවල් ආශ්‍රිතව නාථ වන්දනාව තදින් පැතිරී තිබී ඇත. අනුරාධපුර කාලයට අයත් ශිලා ලිපිවල අවලෝකිතේශ්වර නාථ හා කාරානේ නම සඳහන් වෙයි. එමෙන්ම අනුරාධපුර මැද අවදියේ සිට මේ දෙදෙනාගේම

ලෝකඩ රූප
කුෂ්ඨරණගල
සුව කිරීමේ බ
දෙවිඳුගේ එක්
ශිලා ලිපියේ න
ශ්ලෝකවලින්
හල්លුක වෙළෙ
වෙළෙඳ සංගම
බව සිතිය හැක
දගැබේ බුදුහිමි
වෙළෙඳුන්ට දු
කොට ඇත.

ලංකාවේදී
වනවිට අවලෙ
යන මහායාන
වී 'නාථ' යන
නාමයෙන් නා
පැතිර ගියේය.
වනවිට නාථ
දේවාල කීපයක
තිබූ බව එකල
කෘතිවලින් පෙ
මුවේ ශ්‍රී රාහුල
තොටගමු විහා
දේවාලය ශ්‍රී රා

''අසවලා මට බැන්නේය. මට ගැසුවේය. මා පැරදවූයේය. මා සතු දේ පැහැර ගත්තේය යනුවෙන් යම් කෙ



# ගැම සහ
# ළුය අතර
# නාවය

වේ හමුවෙයි. වැලිගම ඇති
ි ප්‍රතිමාව ලෙඩ රෝග
ඇති බවට සැලකූ නාථ
ැපයකි. තිරියායි සංස්කෘතික
දෙවි උත්කර්ෂවත්ව සංස්කෘත
ිනා කෙරෙයි. තපස්සු
ගේ නම රැගත් පසුකාලීන
ත් තිරියායි දගැබ බැඳ ඇති
ජාවලිය' අනුව තිරියායි
ස්සු භල්ලුක
ශධාතු නිදන්

ාලය
ත්ශ්වර නාථ
ය යටපත්
බෞද්ධ
ද්නාව
විටේ යුගය
ත්ට කැප වූ
ප්‍රසිද්ධව
ණු සාහිත්‍ය
යි. තොටග
වැඩ සිටි
තිබූ නාථ
මිම

ලිවූ පරෙවි සන්දේශයේ හා කාව්‍යශේඛරයේ උත්කර්ෂයෙන් වර්ණනා වෙයි. තොටගමුවේ නාථ වෙත එවූ ගිරා සන්දේශයේ තොටගමු නාථ දේවාලය දීර්ඝ වර්ණනාවකට ලක්වෙයි. දෙරවක තවත් නාථ දේවාලයක් විය. සෙන්කඩගල මුල් යුගය වනවිට නාථ දෙවිඳුගේ මහයාන ස්වරූපය මුළුමනින්ම යටපත් වී බෞද්ධ දෙවියකු ලෙස ඉස්මතු විය. එපමණක් නොව නාථ යනු මතු බුදුවන මෛත්‍රිය බෝසතුන් බවට වැරදි විශ්වාසයක්ද රටේ පැතිර ගියේය. මහනුවර මුල් අවදියේ මුලින්ම නාථ දෙවි වැඩ සිට ඇත්තේ ලේවැල්ලට නුදුරු යක්ගහපිටිය ගමේය. දුම්බර ආධිපත්‍යය පැතිර වූ පිටියේ දෙවි අතින් පැරදුණු නාථ දෙවි මුලින් හේවාහැට පස්ගමට පලාගොස් ඇත. අදත් පස්ගම නාථ දේවාලයක් ඇත. පසුව මහනුවර ධර්මරාජ කන්දට පැමිණ කලක් එහි වාසය කොට පසුව අද මහනුවර ඇති නාථ දෙවාලය පිහිටි බිමට පැමිණ ඇත.

මහනුවර නාථ දේවාලය අද ලංකාවේ ඇති ප්‍රධානම නාථ පිදීමේ මධ්‍යස්ථානයකි. මෙය ගම්පොළ තුන්වෙනි වික්‍රමබාහු රජු කල 1362 ඉදිවූ බව ''සුළු රාජාවලිය'' වර්ෂය සමග දක්වයි. මහනුවර නාථ දේවාලය දකුණු ඉන්දියාවේ විජයනගර් ගොඩනැගිලි සම්ප්‍රදාය ගත් නිර්මාණයකි. ගලින් හා ගඩොලින් බැඳි බොකටු වහලක් සමග ගොඩනැගිලි ''ගෙඩිගේ'' නම් වෙයි. මහනුවර අස්ගිරිය ගෙඩිගේ විහාරයද මහනුවර මුල්ම අවදියේ විජයනගර් සම්ප්‍රදාය අනුව ඉදිවූවකි.

මහනුවර මුල් යුගයේදී රජ මැදුර හා දළද මැදුර අසල තිබූ නාථ දේවාලය හේතු කීපයක් නිසා වැදගත් විය. රජ තම රාජ නාමය තෝරා ගත්තේ මහනුවර නාථ දේවාලයේදීය. රාජාභිෂේක උළෙල මුලින්ම පැවැත්වුණේ නාථ දේවාලයේදීය. ඒ සඳහා ඉදිකර තිබූ වෘත්තාකාර ගොඩනැගිල්ලක නටබුන්, නාථ දේවාල පුරාවිද්‍යා කැණීම්වලදී මතුකරගෙන ඇත. එමෙන්ම රාජාභිෂේක උළෙලේදී රජු නැගී සිටි ගල් පුවරුව අද මහනුවර පත්තිනි දේවාලයේ වැල් බෝධිය යාව ඇති නාථ දේවාල දගැබේ මල් පිදීමට ආසනයක් ලෙස භාවිත වෙයි. ඩේවි හා ඩොයිලිගේ විස්තර වාර්තා අනුව අලුත් අවුරුදු උළෙලේදී රජු ඇතුළු රාජකීයයන් රටේ ප්‍රභූන් නැකතට හිස තෙල් ගෑවේ මහනුවර නාථ දේවාලයේදීය. එමෙන්ම දුර්ලභ ඖෂධ ශාක එකතු කොට කපා කොට කකාරා හිස තෙල් නානු පිළියෙළ කොට මැටි මුට්ටිවල බහා කට වසා බැඳ රට පුරා වෙහෙර විහාරවලට යවා ඇත්තේ නාථ දේවාලයේ සිටයි. එයට හේතුව නාථ දෙවි ලෙඩ රෝග සුව කිරීමේ බලයක් ඇති බව මෙකල තදින් විශ්වාස කළ බැවිනි. ලෙඩ රෝග දුරලා නිරෝගී සුවය ලැබීමට සුබ නැකතින් ගිනියම් හිස්වලට ඖෂධවලින් සැකසූ හිස තෙල් නානු ගෑමෙන් අලුත් අවුරුදු සමයේ උදවන ග්‍රීෂ්මය, විඩාව, ලෙඩ රෝග දුරු කොට නිරෝගී බව ලබාදෙන බව විශ්වාසයවිය. (අත්තරගම රාජගුරු බණ්ඩාරගේ 'වදන් කවි පොත' හා 'ගණදෙවි හැල්ල' අනුව අකුරු කියවීමේදී නාථ දෙවිඳුගේ එද පිහිට පතා ඇත.) පසුකල සතුරු ආක්‍රමණයකදී රාජභිෂේකය ඉටුකළ වෘත්තාකාර ගොඩනැගිල්ල විනාශ වී ඇත.


1362 මහනුවර දූනට ඇති දෙමහල් ගෙඩිගේ නාථ දේවාලය ඉදිකිරීමට පෙර අනුරාධපුර අග අවදියේ සිට ගම්පොළ යුගය දක්වා කුඩා නාථ දේවාලයක් සෙන්කඩගල නාථ දේවාල බිමේම තිබී ඇත. අද මහනුවර නාථ දේවාලයේ පසෙක හූනියන් හෙවත් ගම්බාර දේවාලය ලෙස ඇත්තේ එම පැරණි කුඩා නාථ දේවාලයයි. 1362 ගෙඩිගේ නාථ දේවාල ගොඩනැගිල්ල ඉදිවූ පසු එම පැරණි කුඩා දේවාලයේ තිබූ නාථ දෙවි රූපය අලුත් ගෙඩිගේ දෙමහල් ගොඩනැගිල්ලට වැඩමවා ඇත. හිස් වූ කුඩා නාථ දේවාල පැරණි ගොඩනැගිල්ල හූනියම් දෙවිඳුට කැප කළේ ඉන් පසුවය. හෝල්ට් ලියූ 'අවලෝකිතේශ්වර' නම ග්‍රන්ථයේ ඔහු පෙන්වා දෙන පරිදි දූන් සෙන්කඩගල ඇති නාථ දේවාල ගෙඩිගේට වඩා ඒ තුළ වන්දනාමාන ලබන නාථ දේව රූපය පැරණිය. හේතුව ගෙඩිගේ නාථ දේවාලයට වඩා ඈත යුගයක සිට එම නාථ රූපය ඒ බිමේම කුඩා ගොඩනැගිල්ලක මුල්කල වන්දනාවට ලක්වීමයි.

අලුත් අවුරුද්දේ හිස තෙල් ගෑමේ අරමුණ අවුරුදු සමයේ ඉර මුදුන් වී ඇතිවන ග්‍රීෂ්මය, දහය නිවා දූමීමයි. නැකතට හිසට පයට ඖෂධ පත්‍ර තබා නාථ දේවාලයේ සකස් කළ හිස තෙල් නැකතට ගැල්වීමෙන් ලෙඩ රෝග සුවකර නිරෝගී සුවය ලබා ගැනීමයි. අදත් පැරණි චාරිත්‍ර අනුවම නාථ දේවාලයේ හිස තෙල් නානු පිළියෙළ කොට ප්‍රසිද්ධ විහාර දේවාලවලට හිස තෙල් නානු මුට්ටි නාථ දේවාලයේ සිට කලියෙන් බෙදා හරියි. මේ නිසා හිස තෙල් ගෑමේ උළෙලේදී සොන්කඩගල නාථ දේවාලය ඉතා වැදගත් වෙයි.



**එස්. කේ. ජයවර්ධන**

ක්‍රෝධය සිතෙහි දැඩි කොට බැඳ ගනිත්ද ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.'' - (ධම්ම පදයේ 3 වන ගාථාව)





# සිවි ජාතකයෙන් හෙළිවන දානානිසංස

අසමසම වූ කරුණාවට නිධාන වූ තිලෝගුරු සම්මා සම්බුදුරජාණන් වහන්සේ මනෝරම්‍ය වූ ජේතවනාරාමයේ වැඩවසන සමයෙහි අසදෘශ දානය අරභයා මෙම සිවි ජාතක කථාව දේශනා කොට වදාළ සේක.

යටගිය දවස සිවි රට අරිට්ඨපුර නම් නුවරෙහි සිවි මහරජහු රජ කරන කාලයෙහි පෙර පරමිතා බල ඇති අප මහබෝසතාණන් වහන්සේ ඒ රජු හට පුත්කුමරෙක් ව උපත ලැබූහ. නමින් සිවි කුමරු නම් වූහ. වැඩිවිය පැමිණ පිය රජු ඇවෑමෙන් දස රාජධර්මයෙන් දැහැමින් රජ කරමින් දන්හල් කරවා සලක්ෂයක් බැගින් වස්තු වියදම් කොට මහා දන් පැවැත්වීය. අටවක, තුදුස්වක, පසළොස්වක පෝය දිනයන්හි තමා ම දන්හලට ගොසින් බලා දන් දෙයි. මෙසේ එක් පුන් පොහෝ දිනයකදී සිංහාසනයෙහි වැඩ හිඳ තමන් දුන් දාන පරීක්ෂා කොට බාහිර දාන වස්තු වශයෙන් මා නුදුන් දෙයක් නැත. ආධ්‍යාත්මික ධානයක් දීමට ඇත්නම් මැනවැයි සිතා තමන්ගේ ශරීර අවයවයක් කිසියම් යාචකයෙක් ඉල්ලා එන්නේ නම් එය රාජ්‍ය අභිෂේකයටත් වඩා උතුම් කොට සලකන්නේ යැයි සිතීය.

යම් කිසි යාචකයෙක් මගේ හදවත ඉල්ලා එන්නේ නම් එය දන් දෙමි. මගේ ශරීරයේ මස් ඉල්ලා එන්නේ නම් තියුණු ආයුධයකින් කපා එය දන්දෙමි. ලේ ඉල්ලා එන්නේ නම් ශරීරය පළා භාජන පුරා ලේ දන් දෙමි. කිසියම් කෙනෙක් පැමිණ මට මෙහෙ කරන්නැයි ඉල්ලා සිටියහොත් මේ රජ යස ඉසුරු හැර දමා ඔහුට මෙහෙ කරන්නෙමි. ඇස් ඉල්ලා එන්නේ නම් ශරීරයේ සියලු දෙයට ප්‍රධාන වූ ඇස් උගුල්වා දන්දෙමි. මෙසේ කල්පනා කොට සොළොස් කලයක් සුවඳ පැනින් හිස් සෝදා නා සියලු රාජාභරණයෙන් සැරහී රාජ භෝජනය අනුභව කොට මඟුල් ඇතු පිට නැගී සිවුරඟ සෙනග සමග දන් හල ඉදිරිපිටට පිවිසියේය.

එකල්හි සක්දෙව් රජු මහබෝසතාණන්ගේ අදහස් දැන සිවි මහරජතුමාණන් අද දවසේ තමාගේ ඇස් දන් දීමෙ කැමැත්තෙන් යාචකයෙක් ඇත්නම් මැනවැයි නිශ්චය කොට දන් හල කරා පැමිණෙමින් සිටී. ඔහුගේ අභිලාශය ගැන පරීක්ෂා කරනු වස් මම එහි යන්නෙමැයි සිතා සක්දෙව් රජු ජරපත් වූ දුර්වල වූ අන්ධ බ්‍රාහ්මණ වේශයක් මවාගෙන රජ්ජුරුවන් ඉදිරිපිට රජ්ජුරුවන්ට ආශිර්වාද කොට පෙනී සිටියේය. රජ්ජුරුවන් ද ඔහු හමුවට ඇතු මෙහෙයවා ඔබ කුමක් ඉල්ලා සිටින්නේ දැයි විචාළේය. එවිට ඒ අන්ධ බමුණා මහරජතුමනි, ඔබගේ කීර්තිය දස අත පැතිරී ඇත. ඔබේ කීර්තිය එසේ පැතිර ඇත්තේ පින් බල මහිමයෙනි. ඔබට ඇති ඇස් දෙකෙන් එක් ඇසක්වත් නැති මට එක් ඇසක්වත් දන් දෙන්නැයි ඉල්ලා සිටියේය. රජතුමා එවිට මගේ මනදොළ මුදුන්පත් විය. අද මට වූයේ මහත් ලාභයකි. ඔබ ඇස්ම ඉල්ලා මා සමීපයට ආවේ කුමක් නිසාදැයි විමසීය. එවිට රජතුමනි දෙව්ලොව දෙවියන් අතුරෙන් සක්‍රයන් විසින් සිවි රජ්ජුරුවන් ළඟට ගොසින් කිසිවක් ඉල්ලූයේ නම් තුටු පහටු සිතින් එය දෙති. එබැවින් නොපමාව ගොස් ඇස් ඉල්ලන්නැයි කී බැවින් මෙලෙසින් පැමිණියෙමි. යාච්ඤාවන් අතුරෙන් මාගේ යාච්ඤාව නොලැබිය හැකි යාච්ඤාවකි. සෙසු ලාමක සත්වයන් විසින් නොසිතූ හැකි මේ ඇස් දන් දෙන්නැයි ඉල්ලා සිටියේය. එවිට බෝසතාණන් වහන්සේ බ්‍රාහ්මණය තෝ යම් කාර්යයක් කියා ද යමක් පතන්නෙහි ද ඒ සියල්ල සමෘද්ධ වේවායි ඔබ සැප සේ දවස් හරින පරිද්දෙන් මගේ ඇස් අරගන්වායි එක් ඇසක් ඉල්ලාගෙන පැමිණි ඔබට මාගේ ඇස් දෙකම දන් දෙමියි පැවසූහ. එසේ පවසා එතැන් හිඳී ඇස්



උගුලුවා දන් දීම සුදුසු නොවේ යැයි සිතා බ්‍රාහ්මණයාත් කැඳවාගෙන රජ මාළිගයට ගොස් සිංහාසනයේ වැඩ හිඳ සීවක නම් වෙදඅුරා ගෙන්වා ඇස් දෙක ගලවා බමුණාට දෙවයි කීය.

එය ඇසූ රටවැසියෝ අපේ සිවි රජතුමා ඇස් උගුලුවා දන් දීමට යන්නේ යැයි කියා ඒකකෝලාහල කළහ. සෙනවිරත් හා යුවරජුන් පැමිණ එවැන්නක් නොකරන්නැයි ඉල්ලා සිටියහ. ඇමතියනි, මම මේ ඇස් දන්දෙන්නේ යසස් ලබා ගැනීම නිසා නොව. වස්තුව ලබා ගැනීම සඳහා නොව. බුදුබව පතාගෙනය. ඇස් ආදී පංචමහා පරිත්‍යාග නොකොට බුදුවූ මහෝත්තමයාණන් නැත්තා හ. එබැවින් සර්වඥතා ඥානය ප්‍රාර්ථනා කොට ඇස් දන් දෙමි. එවිට ඇමතියන් කීමට කිසිවක් නොමැතිව මුවින් නොබැන සිටියහ. රජතුමා සීවක වෙදාණන්ට කථා කොට මාගේ ඇස් දෙක තියුණු වූ ආයුධයකින් උපුටා මා බලාසිටියදීම මේ බ්‍රාහ්මණයාගේ අතෙහි පිහිටුවයි කීවේය. එකෙනෙහි සීවක නම් වෙද තෙම ඇස් දන්දීම නම් ඉතා උගහටය කීවේය. එවිට රජතුමා තවදුරටත් කථා නොකොට වහා ඇස් උපුටන්නැයි පැවසීය.

එවිට වෙදදුරා නොයෙක් බෙහෙත් ගල්වා වේදනාව අඩුකොට ඇස් උපුටීමට සිතා ඇසි බැම වැඩී නහර වැලෙහි එල්වීමට සලස්වා අවශ්‍යනම් නැවතත් ඇස ප්‍රකෘතිමත් කිරීමට හැකියි කී විට රජතුමා එය ප්‍රතික්ෂේප කළේය. අන්තඃපුර ස්ත්‍රීහුද, අමාත්‍යයෝද, සෙසු රාජ පුරුෂයෝද හඬා වැටුනාහ. රජුගේ ඉල්ලීම පරිදි ජීවක වෙදදුරු තෙමේ වමතින් ඇස අල්වා දකුණතින් එල්ලී තිබෙන ඇස ගෙන අතෙහි තැබූ විට වමැසින් බලා සම්බෝධියම ප්‍රාර්ථනා කොට බ්‍රාහ්මණයාට දන් දුන්නේය. එම ඇස බමුණාගේ ඇසේ තැබූ පමණින් ආනුභාව බලයෙන් නිලුපුලක් මෙන් බබලමින් පිහිටා සිටියේය. බෝධිසත්වයන් වහන්සේ ඔහුගේ ප්‍රකෘතිමත් වූ ඇස දෙස බලා මහත් සේ දුන් දානයෙහි යහපත දෙස බලා එහි අනුසස් දැන ප්‍රීතියෙන් පිනා ගොස් අනෙක් ඇසත් එසේම උපුටා දුන්නේය. සක්‍ර බ්‍රාහ්මණයාගේ ඇස් ද ප්‍රකෘතිමත් වී අන්තර්දහනව සක්‍ර භවනයට ගියේය. රජ්ජුරුවන් වහන්සේගේ ද ඇස් වල දවස් ගණනින් මස් පිරී සම්පූර්ණව රත්වූ පලස් වටක් මෙන් පිරුණු මස් පිඩින් යුක්තව සිතියම් රුවක්මෙන් විය. වේදනා සංසිඳිනි.

බෝධිසත්වයන් වහන්සේ අන්ධ වූ මට මේ රාජ්‍ය ඉසුරින් පලක් නොමැතැයි අමාත්‍යවරුන්ට පවසා පැවිදිව මහණදම් පුරා උයනට ගොස් වාසය කිරීමට තීරණය කළහ. අමාත්‍යයෝ රථයක් යොදා එහි ගෙන ගොස් රැකවල් යොදා අවශය පහසුකම් සලසා දුන්හ. අන්ධ වූ සිවි රජතුමා උයනට ගොස් එහි පලක් බැඳ තමාගේ සයනයේ හුන්නේය. සක්දෙව් රජු අන්ධ වූ සිවි රජතුමා පරීක්ෂා කරනු වස් ඔහු සිටිනා සමීපයට පැමිණ "මම දෙදොව් ලොවට අධිපති වූ සක්‍ර දෙවියෝ නම් වෙමි. එබැවින් මාගෙන් කැමති වරයක් ගනු යැයි කීවේය". " එවිට රජතුමා මට බෝහෝ මුතු මැණික් ආදී සම්පත් ඇත. අන්ධ වූ මට මරණය කැමතිය". එවිට සක්‍රයා මිනිස් ලොව ආලය නැති නිසා මරණය කැමතිදැයි විමසීය. එවිට ඇස් අන්ධ හෙයින් මරණය කැමති යැයි කීය. එකල්හි සක් දෙව් රජු දානය නම් පරලොව විපාක දෙන්නක් පමණක් නොවේ. මොලොව විපාක දෙන්නක් ද වේ. ඔබ දුන්නා වූ දානයේ ඵල නිසාම ඔබට ඇස් ලැබෙනු ඇත. එවිට රජතුමා බුදුබව පතා දානය දුන් බවට සත්‍යයක් ක්‍රියා කරත්ම දුන් ආධ්‍යාත්ම දානයේ පුණ්‍ය බලමහිමයෙන් බෝධිසත්වයන්ට දිවැස් ලැබිණ. සක්‍රයෝ අහසෙයි පෙනී සිට සියලු රට වැසියන් අමතා බෝධිසත්වයන් ලැබූ දිවැසෙහි කුසල බලය පහදා දී දිව්‍ය ලෝකයටම ගියේය. රජතුමා නුවරට වැද චන්ද්‍ර නම් ප්‍රාසාදයෙහි මතු මහලයට නැගුනාහ. රජතුමාට ඇස් ලැබූ බවට මුළු රාජ්‍ය පුරාම ප්‍රකට විය. රැස්වූ ජනතාවට මින් මතු කිසිවක් දන් නොදී අනුභව නොකරන්නැයි කියා අනුශාසනා කළ රජතුමා ලැබූ දිවැස් පිළිබඳව දක්වමින් දානයේ ඵල එලොවදී පමණක් නොව මෙලොව දීම ලද හැකි බවත්, තමන් විසින් අන්ධ බ්‍රාහ්මණයාට ඇස් දෙක දන් දීමේ පින් බලයෙන් දිවැස් ලද බවත් සිවි රට වාසීන්ට දන්වා කුසල් දහමෙහි හැසිරීමට සිවි රට වාසීන්ට අනුශාසනා කළහ. එය ඇසූ ජනතාව අප්‍රමාදව දානාදී කුසල කර්මයන්හි යෙදුනාහ. මෙසේ පුරාතණයේ නුවණ ඇත්තෝ බාහිර දානයන් පමණක් නොව ආධ්‍යාත්මික දානයන් පවා නිර්ලෝභීව දුන් බව ගෙන හැර දක්වා මෙම සිවි ජාතක කථාව නිමවා වදාළ සේක. එසමයෙහි සීවක නම් වෛද්‍යවරයා ධර්ම භාණ්ඩාගාරික ආනන්ද ස්ථවිරයන් වහන්සේය. සක්‍රදේවේන්ද්‍රයා නම් දිවැස් ඇත්තන් අතර අග්‍ර වූ අනුරුද්ධ ස්ථවිරයන් වහන්සේය. එසමයෙහි දෙඇස් දන් දුන් සිවි රජ්ජුරුවෝ නම් අප මහා බුදුරජාණන් වහන්සේමය. මෙම බක් පුන් පොහෝ දින අපිදු මොලොව පරලොව දෙකෙහි යහපත සලසා දෙන දානාදී කුසල ධර්මයන්හි හැසිරීමට ඉටා ගනිමු.

**කේ. මීගහකුඹුර**

"තමාගේ තරමට වඩා උඩඟුව කටයුතු කිරීමෙන් පිරිහේ - විනීල ජාතකය"



# මිහිඳු මාහිමි මෙරටට ආවේ නැතිනම්

## බුදු දහම මෙරට ස්ථාපිත වූයේ නැතිනම්

## භික්ෂුව මුල්කොට ගත් සමාජ ක්‍රමයක් බිහි වූයේ නැතිනම්

# අද අපිට කතා කරන්නට සිංහල සංස්කෘතියක් නැත

ක්‍රි.පූ. 543 දී ලංකාවට පැමිණි ඉන්දියානු කුමරකු වූ විජය සහ ඔහුගේ පිරිස ආර්ය සම්භවයකින් පැවත එන්නන් ලෙස පිළිගැනේ. ඔහුගේ ආගමනය වන විට යක්ෂ, නාග, දේව ආදී ප්‍රධාන ජනවර්ග තුනක් සහ එයට අමතරව තවත් විසිරී ගිය ජන කණ්ඩායම් කිහිපයකුත් මෙරට තුළ විසිරී සිටියහ. ආර්ය සමාජ චින්තනය හා ඇදහීම් පමණක් කේන්ද්‍ර කරගනිමින් මෙරට පළමු ශිෂ්ටාචාරය ආරම්භ වූයේ යැයි ඉදිරිපත් වන මතය සාවද්‍යය. පණ්ඩුකාභය රජු දවස අනුරාධපුර නගර නිර්මාණය තුළින් යක්ෂ, නාග, දේව යන ජන වර්ග හා ආර්ය යන සියලු කොටස් එක්කොට නිර්මාණය කරගත් අයුරු දක්නා ලැබේ. විශේෂයෙන්ම යක්ෂ ජන කොටසේ නායකයන් වූ කාලවේල සහ චිත්‍රරාජ යන දෙදෙනා වෙනුවෙන් විශේෂ පිළිගැනීමක් පණ්ඩුකාභය විසින් සිදුකරනු ලැබීම මගින් පෙනී යන්නේ අනාර්ය වූ දේශීය ජනතාව සහ ආර්ය වූ පිරිස් අතර ගැටුමකින්

තොරව නව ශිෂ්ටාචාරය ආරම්භ කිරීමේ උත්සාහය යැයි "පාකර්" ඉදිරිපත් කරන අදහස මෙහිදී වඩාත් වැදගත් වේ. මෙම කාලවේල සහ චිත්‍රරාජ යනු හුදු මනඃකල්පිතයක් ලෙස දක්වමින් වල්පොල රාහුල හිමි ඉදිරිපත් කරන මතය මගින් පෙන්නුම් කෙරෙන්නේ මෙරට සිටි දේශීය අනාර්ය ජන වර්ගයක් ලෙස යක්ෂ ගෝත්‍රිකයන් පිළිගැනීමට ඇති අකමැත්ත විය හැකිය.

## බුදු සසුන පිහිටුවීම

ක්‍රි.පූ. 3 වන සියවසේ මැද භාගයේදී මිහිඳු මාහිමියන් විසින් මෙරටට බුදු සමය ගෙනෙන ලද බව පිළිගත් මතය වේ. මෙරට ජනතාව ජාතික චින්තනයක් හා දැක්මක් පිළිබඳව පෝෂණය ලැබුයේ බුදු දහම තුළිනි. මිනිසා හා පරිසරය පිළිබඳ පළල් දෘෂ්ටියකින් යුක්ත වූ බුදුසමය අනුරාධපුර ශිෂ්ටාචාරය වර්ධනය කිරීමේ කේන්ද්‍රීය මතවාදය බවට පත්විය. සිංහල ජාතික චින්තනයේ ප්‍රධාන ඥාන විභාගික පදනම බෞද්ධ දර්ශනය බවට පත්වීම ලෙස ගැනීම වඩාත් උචිතය.

බුදු සමය ලැබීම හා බෞද්ධ චින්තනය සිංහල ජාතික චින්තනයෙහි කේන්ද්‍රීය මතවාදය වීම පමණකින්ම බුදු සමය මෙරට පිහිටියේ යැයි සිතූ දේවානම්පියතිස්ස රජුව (ක්‍රි.පූ. 247-207) නිවැරදි කළ මිහිඳු මාහිමියන් "ලක්දිව උපන් පුතෙකු පැවිදි වන තුරු" මෙරට බුදු සමය මුල් බැස නොගන්නා බව පැවසූ බව දීපවංශය - මහාවංශය යන වංශ කතාවලින් හා සමන්තපාසාදිකාව වැනි අටුවා ග්‍රන්ථවලින්ද දැක්වේ. මෙරට භික්ෂු සමාජය ආරම්භ වූයේ මෙම පදනමින් වන අතර ශතවර්ෂ ගණනාවක ඉතිහාසය තුළ සිංහල භික්ෂුව ශිෂ්ටාචාරයේ කේන්ද්‍රීය සාධකය බවට පත්විය.

## සිංහල භික්ෂු සමාජය


අනුරාධුර ශිෂ්ටාචාරයේ සිට අද දක්වා පැතිරී ඇති කාල පරාසය තුළ සිංහල භික්ෂු සමාජයේ ක්‍රියාකාරීත්වය විමසීම සැබැවින්ම මෙරට කලා ශිල්ප හා සභ්‍යත්වයේ පැතිමාන පරීක්ෂා කිරීමෙන් ඒ ඒ අංශ කෙරෙහි සිංහල භික්ෂුව වෙතින් වූ බලපෑම තක්සේරු කළ හැකි වේ. නමුත් මෙහිදී විශේෂයෙන් විමසිය යුත්තක් තිබේ. එනම් ඉන්දීය සමාජය තුළ බිහිවූ මෙම බෞද්ධ මතවාදය මෙරට තුළ විකාශනය වීමේදී එය සංස්කෘතික අනන්‍යතාවක් මතු කිරීමයි. බුදු සමයේ න්‍යායික ඉදිරිපත් කිරීමත් එසේම ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයත් (භික්ෂු-භික්ෂුණී, උපාසක-උපාසිකා) මෙරට සංස්කෘතියට අනන්‍ය ලෙස සිදුවූ බව මෙයින් අදහස් කෙරේ.

මිහිඳු මාහිමියන් වෙතින් ආරම්භ වූ භික්ෂු සමාජය ශතවර්ෂ ගණනාවක් තුළ විවිධ බාධකයන්ට මුහුණ දෙමින් විකාශනය වී ඇත්තේ මෙරටට අනන්‍ය වූ ආකෘතියක් තුළය.

සිංහල භික්ෂු සමාජයේ විකාශනය හා ඒ ඒ අවදීන්ට අනුව එම විකාශනය පිහිටන ලද ආකෘති වර්ගීකරණය අනුව පහත සඳහන් පරිදි වේ.

* මිහිඳු මාහිමි - පදනම් වාදය
* මහා විහාර වංශය - පළමු ආකෘතිය
* පොළොන්නරු කතිකාවත - දෙවන ආකෘතිය
* දඹදෙණි කතිකාවත - තෙවන ආකෘතිය
* සරණංකර සංඝරාජ - තෙවන ආකෘතිය
* ප්‍රතිසංස්කරණය - සිව්වන ආකෘතිය

මූලික වශයෙන් අනුරාධපුර සමාජය තුළ කේන්ද්‍රීය භික්ෂු ආයතනය වූයේ මහා විහාරීය නිකායිකයන් වන අතර එම නාගරික සමාජයේම අනෙක් පාර්ශ්වය නියෝජනය කරනු ලැබුවේ අභයගිරි නිකායිකයින්ය. මෙම



ආයතන ගත වීම හුදෙක් තේරුම් ගත හැක්කේ තාර්කික ද්වි කාරණයක් ලෙසය.

1. මහා විහාරික භික්ෂු සංස්ථාව (න්‍යායික පිහිටීම) ථේරවාදී බලපෑම

2. අභයගිරි භික්ෂු සංස්ථාව (ප්‍රායෝගික පිහිටීම) මහායාන බලපෑම

මේ ද්වි කාරණය මගින් ශාස්ත්‍රීය උන්නතියක් මෙරට ඇතිවූ බවද පිළිගැනීමට හැකිය.


1. මහා විහාරය - විසුද්ධි මාර්ගය
2. අභයගිරිය - විමුක්ති මාර්ගය

යන කෘතීන් තුළින් එය වඩාත් පැහැදිලි වේ. විශේෂයෙන් දේශීය හා විදේශීය ආක්‍රමණවලින් සිංහල සංස්කෘතිය ආරක්ෂා කිරීම කෙරෙහි ඔවුන්ගේ සක්‍රීය

දයකත්වය ලැබූ බව පිළිගැනීම සත්‍යයක් වේ.

සිංහල භික්ෂු සමාජය විකාශනය පළමු ආකෘතිය මහා විහාර කේන්ද්‍රීයව වන අතර පොළොන්නරු කාලය වන විට දෙවන ආකෘතියට පැමිණි බව පෙනී යයි. එහිදී සිදුවූ විශේෂ තත්ත්වයන් වන්නේ භික්ෂු සමාජයේ පැවැත්ම සඳහා විනය ප්‍රඥප්තීන් ඇතුළත් පොළොන්නරු කතිකාවත ඇති කිරීම සහ භික්ෂු නායකත්වය සඳහා මහාසාමි පදවිය ඇති කිරීමයි. මෙම අවධිය තුළ ඉදිරියට පැමිණි ආගමික හා සමාජ මත වාදයන් හැඳින්විය හැක්කේ ථේරවාදී මහායානය ද්වි කාරණයක් ලෙස නොවේ.

1. ග්‍රාමවාසී භික්ෂු සංස්ථාව
2. වනවාසී භික්ෂු සංස්ථාව



යනුවෙන් එය දැක්විය හැකිය. එසේම භික්ෂු නායකත්වය සඳහා මහාසාමි පදවිය ගොඩනැගී තිබුණේ මෙම අංශ දෙකම නියෝජනය වන පරිදිය. අනුරපුර යුගයේ සිට පැවති පිරිවෙන් සහ අෂ්ටමූල ආයතන යන අධ්‍යාපන ආයතනවල සිට මහා සාමි තනතුරු දක්වා විහිදී ගිය පාලන ව්‍යූහයක්ද ඒ තුළ විය.

1. මහාසාමි
2. පාර්ශ්ව ප්‍රධාන
3. වනවාසී ග්‍රාමවාසී පාර්ශ්ව
4. අෂ්ට මූල ආයතන
5. පිරිවෙන

මේ ආකාරයෙන් එය දැක්විය හැකිය. පොළොන්නරු රාජධානිය තුළ වූ මෙම සිංහල භික්ෂු ක්‍රියාකාරීත්වය පොළොන්නරු කතිකාවත පදනම කරගෙන විකාශනය වීම සිංහල භික්ෂුවගේ දෙවන ආකෘතිය ලෙස ඉහතින් දක්වනු ලැබිණි. එහි තෙවන ආකෘතිය ලෙස සැලකිය හැක්කේ දඹදෙණි කතිකාවත මත පදනම් වූ පශ්චාත් පොළොන්නරු අවධියයි. රජරට රාජ්‍යයට එල්ල වූ පරසතුරු උවදුරු හමුවේ සිංහල ශිෂ්ටාචාරය මායා රටට ව්‍යාප්ත වූ අතර දඹදෙණිය මුල් කරගනිමින් ඇති වූ රාජ්‍ය පාලනය තුළ භික්ෂු සමාජය යළිත් විනය ප්‍රඥප්තීන් මත පිහිටුවනු ලැබීය.

1. ග්‍රාමවාසී භික්ෂු සංස්ථාව
2. ආරණ්‍යවාසී භික්ෂු සංස්ථාව

මෙම කාල පරාසය තුළ දක්නට ලැබේ.

පූජාවලිය, සංදේශ කාව්‍ය, ගුත්තිල කාව්‍ය වැනි සාහිත්‍ය කෘති ලිවීමත්, අධ්‍යාපන ආයතන ගොඩනැගීමත් මෙම කාලය තුළ ග්‍රාමවාසී භික්ෂූන් තුළින් ඉටු වූ සේවාවන් වේ. එසේම දඹදෙණි කතිකාවත පදනම් කරගනිමින් සංවිධානය වූ භික්ෂු පරපුර යාපහුව, කුරුණෑගල, ගම්පොළ, ශ්‍රී ජයවර්ධනපුර යන රාජ්‍ය සමයන් තුළ ඉදිරියට විකාශනය වූ බව පෙනේ. විශේෂයෙන්ම පොළොන්නරු කතිකාවත මගින් ගොඩනැගූ මහාසාමි පදවිය සංඝරාජ පදවිය ලෙසින් සංශෝධනය වූ බවද පෙනී යයි.

සිංහල භික්ෂු සමාජයේ සිව්වන අදියර ලෙස මහනුවර රාජ්‍යය කාලය තුළ සරණංකර සංඝරාජයාණන් වහන්සේ වෙතින් සිදුවූ නව භික්ෂු ප්‍රතිසංස්කරණ දැක්විය හැකිය. සිල්වත් සමාගම කේන්ද්‍ර කරගනිමින් ඇති කළ එම ප්‍රතිසංස්කරණ මගින් යළිත් උපසම්පදාව පිහිටුවීමත් සංඝරාජ පදවිය දැරීමත් දැක්විය හැකිය.

## නිගමනය

මෙම කෙටි නිරීක්ෂණය මගින් විමසනු ලැබුයේ මෙරට ඉතිහාසය තුළ ගොඩනැගුණු භික්ෂු සංස්ථාවේ අනන්‍යතාව හා එහි විකාශනයේ කේන්ද්‍රීය ආකෘතීන් 4 පිළිබඳවය. මෙහිදී විශේෂයෙන් සැලකිය යුත්තේ ඉන්දීය සමාජයෙහි මතු වූ බෞද්ධ මතවාදය මෙරටට පැමිණියේ ඉන්දීය බුදු සමයෙහි ලංකා ශාඛාව ලෙස නොවන බවය. ආගමික සංස්කෘතික භාෂා සාහිත්‍ය යනාදී විවිධ පැතිකඩ පුරා විහිදී ගිය නව ශ්‍රමණ ජීවිතයක ද්වි සම්ප්‍රදායන්ට අයත් වූ ඔවුහු මෙරට සිංහල සංස්කෘතියෙහි පෙර ගමන්කරුවා බවට පත්විය. එනිසාම ලක්දිව භික්ෂුව සැබවින්ම සිංහල භික්ෂුව බවට පත්විය.

සංඝානන්ද පිරිවෙණෙහි නියෝජ්‍ය පරිවෙණාධිපති, අස්ගිරි මහා විහාරයෙහි
**කර්මාචාර්ය රාජකීය පණ්ඩිත මැණික්හින්නේ රතනසාර හිමි**



# අස්ගිරි මහවෙහෙර අභිනව මහානායක මාහිමි

ඓතිහාසික බදුළු මුතියංගන රාජමහා විහාරය, අස්ගිරිය විජේසුන්දරාරාම පුරාණ විහාරය, පොල්ගොල්ල උඩගුන්නෑපාන බෝධිමල්කඩ පුරාණ විහාරය හා බෝරුප්ප බෝධිමළු විහාරය යන විහාරයන්හි අධිපති, ශාස්ත්‍රවේදී පණ්ඩිත මහෝපාධ්‍ය අතිගෞරවාර්හ වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතනාභිධාන මහා විහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ, අනුනායක පදවිය දරමින් ඉටු කරන ලද සම්භාවනීය ලෝක ශාසනික සේවාව සැලකිල්ලට ගත්, ස්වකීය පාර්ශ්වයේ විංශද්වර්ගික කාරක සංඝ සභාව රාජ්‍ය වර්ෂ 2016 වැන්නේ අප්‍රේල් මස හත් වන බ්‍රහස්පතින්දා ඒකමතිකව විසිදෙවන අභිනව මහානායක ධුරයට පත්කර ගැනීම වනාහි සසුනේ චිර පැවැත්ම සඳහාත්, අස්ගිරි මහා විහාරයේ අභිවර්ධනය සඳහාත් හේතුසාධක වනු නියතය.

අතිඋත්තම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි, අචල ශ්‍රද්ධා භක්තිය ඇති, ස්වකීය විහාර පාර්ශ්වයේ හා සසුනේ අභිවර්ධනය ප්‍රාර්ථනා කරන, අප මහානාහිමියෝ රාජ්‍ය වර්ෂ 1942 වැන්නේ මාර්තු මස 18 වන දින, හාරසියපත්තුව වරකාගොඩදී ජන්ම ලාභය ලැබූහ. ගමේ පාසලෙන් මූලික අධ්‍යාපනය ලබා, වර්ෂ 1955 ක් වූ අප්‍රේල් මස 7 වන දින අස්ගිරි මහාවිහාරීය මංගල උපෝෂථාගාරයේදී ප්‍රව්‍රජ්‍යා භූමියට ඇතුළත් වූහ. නිසි බණ දහම් උගෙන ගුණ නුවණින් වැඩී, වර්ෂ 1962 ජූනි මස 9 වන දින අධිශීල සංඛ්‍යාත උපසම්පදා ශීලයෙහි පිහිටියාහ.

ප්‍රාචීන භාෂාවන්හි ප්‍රවීණත්වයක් දැරූ උන්වහන්සේ ධර්ම ශාස්ත්‍රීය අධ්‍යාපනයෙහි දක්ෂකම් දක්වමින්, ශාස්ත්‍රවේදී උපාධිය සමත් වූහ. ධර්ම ශාස්ත්‍රීය දැනුමෙන් පෝෂණය වූවා පමණක් නොව, පැවිදි බණ දහම් උගෙන ගුණ නුවණින් වැඩී, ආචාරයෙන්, ගෝචරයෙන්, යහපත් හැසිරීමෙන් යුක්ත වී ගුණවත්ව සීල සම්පන්න සංඝශෝභන ගුණයන්ගෙන් යුක්ත වූහ. ස්වකීය භික්ෂූත්වය ශීලයෙන්, ප්‍රතිපත්තියෙන්, ව්‍යක්ත, විනීත, විශාරද, බහුශ්‍රැත ධර්මධරත්වයෙන් හා නිරපේක්ෂක ගුණයන්ගෙන් පරිපූර්ණ කරගත්හ.

ලබාගත් ධර්ම ශාස්ත්‍රීය දැනුම ස්වකීය ශිෂ්‍ය භික්ෂූන් වහන්සේ කෙරෙහි පමණක් නොව සාමාන්‍ය පාසල් ශිෂ්‍යයන් කෙරෙහිද බෙදා දීමෙහි අභිරුචිය දැක්වූ අප මහානාහිමියෝ දිගු කලක් විද්‍යාල කීපයකම විශිෂ්ට ධර්මාචාර්යන් වහන්සේ නමක් වශයෙන් ඉටුකරන ලද සේවය එකී විද්‍යාලයන්හි අදටත් ප්‍රචලිතය. උන්වහන්සේ චතුර ධර්ම කථිකයෙකි. ස්වකීය දායක කාරකාදීන්ගේ සියලු ආගමික කටයුතුවල මහත් අභිරුචියෙන් යෙදෙන උන්වහන්සේ ඔවුන්ගේ දුක සැප සොයා බලමින් ඉටුකරනු ලබන සමාජ සත්කාර අපමණය. වර්ෂ කීපයක් තුළම අතිඋත්තම ශ්‍රී දන්ත ධාතූන් වහන්සේ විෂයෙහි බුද්ධෝපස්ථාන බුද පුද චාරිත්‍ර මහත් ශ්‍රද්ධා භක්තියෙන් ඉෂ්ට සිද්ධ කිරීමෙන් ලබා ඇති අත්දැකීම් බොහෝය. වළාකුලින් මිදුනු පුන් සඳක මෙන් සඟ සසුන බැබළවීමට අභිනව මහානායක මාහිමිපාණන් වහන්සේට ආයුරාරෝග්‍ය සම්පත්තිය ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් නොමදව ලැබේවායි දළදා වරුණ ආශිංසනය කරයි.

**කේ. මීගහකුඹුර**


# සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කටයුතු කිරීම මාගේ එකම අරමුණයි

## අතිපූජ්‍ය වරකාගොඩ ඤාණරතන මහනාහිමිපාණන් වහන්සේ මංගල අනුශාසනාව පවත්වමින් කියති

'ශ්‍රී ලංකාව පමණක් නොව මුළු ලොවම අස්ගිරි මල්වතු උභය මහාවිහාර කෙරෙහි විමසිලිමත්ව උනන්දුවකින් සිටින බැවින් ගරුතර මහා සංඝරත්නය වශයෙන් අප සැමගේත්, අස්ගිරි මහාවිහාරයේ වැඩ සිටින අතිපූජ්‍ය මහානායක හිමිපාණන් වහන්සේලාගේ ගෞරවයත් රැකගෙන ශ්‍රී සම්බුද්ධ ශාසනයේ චිරස්ථිතිය වෙනුවෙන් කටයුතු කිරීමට අධිෂ්ඨාන කරගනිමු'' යැයි මහාවිහාර වංශික ශ්‍යාමෝපාලි මහා නිකායේ අස්ගිරි මහාවිහාර පාර්ශ්වයේ 22 වැනි මහානායක පදවියෙන් පිදුම් ලැබූ බදුළු මුතියංගන රජමහා විහාරාධිපති අතිපූජ්‍ය වරකාගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන මහනායක මාහිමිපාණන් වහන්සේ සිය පදවියට පත්වීමෙන් පසු ප්‍රකාශ කළහ.

අස්ගිරි මහාවිහාරයේ ඓතිහාසික මංගල උපෝෂථාගාරයේදී කාරක සංඝ සභාවේ අනුමැතියෙන් පත් කරනු ලැබූ, අස්ගිරි මහාවිහාර කාරක සංඝ සභා ජ්‍යෙෂ්ඨ කාරක සභික, ඓතිහාසික ගෙඩිගේ රාජමහා විහාරාධිකාරී පොළොන්නරුව සොළොස්මස්ථානාධිපති, ශාස්ත්‍රපති අතිපූජ්‍ය වේඩරුවේ ශ්‍රී උපාලි අනුනාහිමිපාණන් වහන්සේගේ තාවකාලික සභාපතිත්වයෙන් පවත්වන ලද සංඝසභා රැස්වීමේදී අස්ගිරි කාරක සංඝ සභික මහියංගන රජමහා විහාරයේ භාරකාර පූජ්‍ය උරුලෑවත්තේ ධම්මරක්ඛිත නාහිමිගේ සහ කාරක සංඝ සභික පූජ්‍ය අරඹෙගම සරණංකර නාහිමිගේ යෝජනා ස්ථිරත්වයෙන් අභිනව මහානායක පදවිය වෙනුවෙන් අතිපූජ්‍ය වරකාගොඩ ශ්‍රී ඤාණරතන අනුනාහිමිපාණන් වහන්සේගේ නම ඉදිරිපත් කෙරිණ. එකී යෝජනාව පරිදි අතිපූජ්‍ය වරකගොඩ ධම්මසිද්ධි ශ්‍රී පඤ්ඤානන්ද ඤාණරතන අනුනාහිමිපාණන් වහන්සේ අභිනව මහානායක පදවියට ගරුතර සංඝ සභාවේ සමානච්ඡන්දයෙන් තෝරා පත්කර ගන්නා ලදී.

අතිපූජ්‍ය වරකාගොඩ ඤාණරතන මහනායක හිමියෝ මෙසේද සඳහන් කළහ. ''මා මහානායක පදවියට පත්කර





**දියවඩන නිලමේ තැන්පත් නිලංග දැල මැතිඳුන් විසින් අභිනව අස්ගිරි මහනාහිමිපාණන් වහන්සේ ගෞරව සම්ප්‍රයුක්තව ශ්‍රී දළදාමාලිගාවේදී පිළිගත් අයුරු.**

ගැනීම සම්බන්ධව පුණ්‍යානුමෝදනාවෙන් සංඝ සභාවට ස්තූතිය පුද කරනවා. මෙම තත්ත්වය ඉදිරියටත් පවත්වාගෙන යෑමෙන් සංඝ සභාවට වැඩ කිරීමට ඉතා පහසු වෙනවා. නව ධුරයේ වැඩ කිරීමට මෙම වගකීම රුකුලක් වෙනවා. සැමගේ සහය ඉදිරියටත් මම බලාපොරොත්තු වෙනවා.

වසර හත්සියයකට වැඩි ශාසනික ඉතිහාසයක් පවතින අස්ගිරි මහාවිහාරයේ අතිගෞරවාර්හ මහානායක පදවි හෙබවූ මහානායක හිමිවරුන් අතර දනට වසර 61 කට ඉහතදී උපෝෂථාගාරයේදී මා වෙත පැවිද්ද ලබාදුන් අතිගෞරවාර්හ යටවත්තේ ධම්මානන්ද මාහිමිපාණන් වනමාගේ ගුරුදේවයාණන් වහන්සේවද මෙහිදී විශේෂයෙන් මතක් කරන්නට කැමතියි.

කාරක සභික ධුරය පිරිනැමූ, අස්ගිරි මහාවිහාරයට උදාර සේවාවක් ඉටුකර ඇති අතිපූජ්‍ය පලිපාන ශ්‍රී චන්දානන්ද මහානාහිමිපාණන් වහන්සේද, අතිපූජ්‍ය උඩගම ශ්‍රී බුද්ධරක්ඛිත මහනාහිමිපාණන් වහන්සේද, අනුනායක පදවියට පත්කළ අතිපූජ්‍ය ගලගම අත්ථදස්සී මහනාහිමිපාණන් වහන්සේද කෘතවේදීව මා සිහිපත් කරනවා.''

අස්ගිරිය මහා විහාරයේ සංඝ සභාවේ ලේඛකාධිකාරී ශාස්ත්‍රපති ආණමඩුවේ ධම්මදස්සි නාහිමියන් සංඝ සභා වාර්තාව ඉදිරිපත් කරමින්. අස්ගිරි පාර්ශ්වයේ මහානායක පදවියට අතිපූජ්‍ය වරකාගොඩ ඤාණරතන මහානායක මාහිමිපාණන් වහන්සේ සභාවේ සමානච්ඡන්දයෙන් පත්වූ බව දන්වා සිටියහ.

ශ්‍රී දළදා මාලිගාවේ දියවඩන නිලමේ ප්‍රදීප් නිල'ග දැල මහතා, ප්‍රධාන සිව්දේවාල බස්නායක නිළමේවරු මහනාහිමිපාණන් වහන්සේ වෙත අටපිරිකර පූජා පවත්වා ආසිරි පැතූහ. මහනාහිමිපාණන් වහන්සේගේ ප්‍රධාන විහාරස්ථානය වන උඩගුන්නෑපාන බෝධිමල්කඩ පුරාණ විහාර දායකයන්ගේ ආශිර්වාදය සමග කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාවේ සභාපති අසේල ඒකනායක මහතා විසින් පිරිකර පූජා කරන ලදී.

අස්ගිරි කාරක සංඝ සභාවේ හිමිවරුන් ප්‍රධාන අස්ගිරි මහාවිහාරයීය මහා සංඝරත්නය පිරිවරාගෙන අස්ගිරි උපෝෂථාගාරයේ සිට මහනාහිමිපාණන් වහන්සේ වැඩ සිටින අස්ගිරිය පුරාණ විජේසුන්දරාරාමය වෙත පෙරහරකින් වැඩමවාගෙන ගිය අතර එහිදී බුදු මැදුරට වැඩම කර ආසිරි ලබාගත්හ. මහනාහිමිපාණන් වහන්සේගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය අස්ගිරිය කාරක සංඝ සභිත බදුළු මුතියංගන රජමහා විහාරයේ භාරකාර පූජ්‍ය මුරුද්දෙණියේ ධම්මරතන නාහිමි සමග ශ්‍රී දළදා මාලිගාවේ රාත්‍රී හතට පැවැත්වුණ දළදා සමිඳු පූජාවටද සහභාගි වී දළදා ආසිරි ලබාගත් අතර මහනාහිමිපාණන් වහන්සේ අස්ගිරි සංඝ සභාව වෙත ගිලන්පස පූජාවක්ද පැවැත්වූහ.

**කේ. බණ්ඩාරනායක**

"සත්පුරුෂයන්ගේ උපදෙස් අනුව වැඩ කරන්නෝ දියුණුවට පත්වෙති - චුල්ලසෙට්ඨී ජාතකය"



## ගෞරවාර්හ දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ ජන්ම දින පුණ්‍ය මහෝත්සවය

කායෙන සංවුතා ධීරා
අථො වාචාය සංවුතා,
මනසා සංවුතා ධීරා
තෙ වෙ සුපරිසංවුතා

"යම් පණ්ඩිත කෙනෙක් කයින්, වචනයෙන්, සිතින් සංවර වූයේ ද ඔහු ඒකාන්තයෙන් ම මනාලෙස සංවර වූවා වෙයි".

මහාවිහාරවංශික ස්‍යාමෝපාලි මහානිකායේ මල්වතු මහාවිහාර පාර්ශවයේ ගෞරවාර්හ දිඹුල්කුඹුරේ ශ්‍රී සරණංකර විමලධම්මාභිධාන අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ වනාහි සාකල්‍යයෙන්ම කයින්, වචනයෙන්, සිතින් යන තිදොරින් ම මනා ලෙස සංවර වූ, සුපේශල ශික්ෂාකාමී සංඝශෝභන ගුණයන්ගෙන් ශෝභිත වූ, අනුනාහිමිපාණන් වහන්සේ නමකි.

කන්ද උඩරට, රජ දරුවන්ගේ අභයස්ථානයක් මෙන්ම, හෙළ රණවිරුවන්ගේ රණබිමක් වූ උඩහේවාහැට, හඟුරන්කෙත, දිඹුල්කුඹුර නම් රමණීය ග්‍රාමයේ කුලගෙයක රාජ්‍ය වර්ෂ 1942 වැන්නේ අප්‍රේල් මස 16 වන දින ජන්ම ලාභය ලබා, දිඹුල්කුඹුරේ කණිටු විදුහලින් මූලික අධ්‍යාපනය ලැබ, සම්බාධක සහිත ගිහි ජීවිතය කෙරෙහි නොඇලී, හිරුඑළිය මෙන් පැහැදිලි සම්බාධක රහිත පැවිදි දිවිය තෝරාගෙන රාජ්‍ය වර්ෂ 1965 දෙසැම්බර් මස 30 වන දින මල්වතු මහාවිහාරයේ දී සසුනට ඇතුළත් වූහ. මල්වතු මහාවිහාරයේ සංඝරාජ මහාපිරිවෙනින් ද්විතීය අධ්‍යාපනය සපුරා, වර්ෂ 1970 දී කොළඹ විශ්ව විද්‍යාලයට ඇතුළත්ව, භාෂා ශාස්ත්‍ර විෂයන් මනාව ප්‍රගුණ කොට ගෞරව උපාධිය දිනාගත්හ.

ස්වකීය පැවිදි ආචාර්යපාදෝත්තමයන් වහන්සේලා පෙන්වා දුන් සසුන් මඟ ගමන් කරමින්, ලෝක ශාසනික සේවාවන් ඉටුකරමින්, තමන් ලත් ධර්ම ශාස්ත්‍රීය දැනුම දානය කරනු වස්, රජයේ පාසල් කීපයක විශිෂ්ට ධර්මාචාර්යන් වහන්සේ නමක් වශයෙන් ද, වර්ෂ 1986 සිට 2001 දක්වා මහනුවර වතුරකුඹුර විද්‍යාලයේ විදුහල්පති ස්වාමීන් වහන්සේ වශයෙන් ද, උදාර අධ්‍යාපන සේවාවක් සිදුකොට ප්‍රදේශයේ සිසු දරුවනට නැණස පාදා දෙන ලදි.

පූර්වාකෘත පුණ්‍ය බල මහිමයෙන් අවස්ථා කීපයකදීම ශ්‍රී දළදා මාළිගාවේ දළදා තේවා ධුරය දරමින්, දළදා පුද සිරිත් පිළිබඳ දැක්වූ කුසලතාවය ප්‍රශස්තය.

අප අනුනාහිමිපාණන් වහන්සේ සතු චාම්, සරල, නිහතමානී, පරාර්ථකාමී භික්ෂු ජීවිතය, ගිහි පැවිදි කාටත් ආදර්ශයට ගත හැකි චරිතාංගයන්ගෙන් උපලක්ෂිතය. පැවිදි දහම්හි මනාව හැසිරෙමින් ස්වකීය දායක කාරකාදීන්ගේ ආගමික කටයුතු වල මැනවින් යෙදෙමින්, ජාතික වූත්, සාමාජික වූත්, සංස්කෘතික වූත් විවිධ සත්කාරයන් හි අනසල්ව යෙදෙමින්, ස්වකීය විහාර පාර්ශවයේ අභිවර්ධනය පිණිස නියැලෙන අප අනුනාහිමිපාණන් වහන්සේට වර්ෂ 2016 වැන්නේ අප්‍රේල් මස 16 වන දිනට වසර 74 ක් සපිරෙයි. ඒ නිමිති කොට සපිරිකරසංඝගතදක්ෂිණාවක් පවත්වා ජන්මෝත්සව පුණ්‍ය මහෝත්සවයක් මල්වතු මහා විහාරයේ නිල ආරාමයේ දී පසුගිය දා පවත්වන ලදි. මෙම උතුම් පිංකමේ පුණ්‍ය බලයෙන් හා ශ්‍රී දන්ත ධාතූන් වහන්සේගේ ආශිර්වාදයෙන් අප අනුනාහිමිපාණන් වහන්සේට, නිරෝගි සම්පත්තිය හා චිර ජීවනය නොමදව ලැබේවායි දළදා වරුණ ආශිංසනය කරයි.

**කේ. මීගහකුඹුර**

## සූරියගොඩ සීලරතන නාහිමි සමරු පිංකම අප්‍රේල් 23දා

පේරාදෙණිය උඩර්රියගම දෙවොල්කොන පුරාණ විහාරය, කුරුකුදේ පුරාණ විහාරය, පුවක්ගහකුඹුර සුධර්මාරාම පුරාණ විහාරය. දෙහිදෙණිය ශ්‍රී සිද්ධාර්ථ බෝධිමළු විහාරය යන සිව්විහාරයන්හි අධිපති දෙවොල්කොන පුරාණ විහාරස්ථ සිරිසුමන විද්‍යායතන බෞද්ධ විද්‍යලයේ අධ්‍යක්ෂ සූරියගොඩ ශ්‍රී සීලරතන නාහිමි අපවත්වීමෙන් තුන්මාසයක් ගතවීම මුල්කරගෙන නාහිමිපාණන්ට පිං අනුමෝදන් කරවන ධර්ම දේශනාත්මක පිංකම අප්‍රේල් 19 සිට 23 දක්වා පැවැත්වේ. 23 වෙනිදා දහවල් මහාසංඝරත්නය පනස්නමක් විෂයෙහි පිරිනමනු ලබන සපිරිකර සංඝගත දක්ෂිනාවකි. අප්‍රේල් 19 සිට 22 දක්වා දිනපතා සවස 6.00 සිට 7.00 දක්වා ධම්දේශනා මාලාවකි.



# මහනුවර

## බොදු සමිති නව නිලධාරීන්

**මහනුවර ශ්‍රී පුෂ්පදාන සමිතියේ 2016 - 2017 වසරට පහත සඳහන් නිලධාරීන් ප්‍රධාන තනතුරු සඳහා පත්ව සිටිති.**

- ප්‍රධාන සභාපති - වෝල්ටර් රණසිංහ.
- ප්‍රධාන ලේකම් - වෝල්ටර් බණ්ඩාරග
- භාණ්ඩාගාරික- ටී. ගාමිණී ද සිල්වා
- උප සභාපතිවරු - එස්. ඩී. නවරත්න /ගාමිණී ඒ. සිරිසේන / ගාමිණී බණ්ඩාර දොඩම්වලග
- උප ලේකම් - එම්.ආර්.ඒ. සිරිසේන.
- පුද්තකාලයාධිපති - එච්.ඒ. ඩබ්. හේවාවසම් යන මහත්වරු.

### මහනුවර තරුණ බෞද්ධ සංගමය

- ප්‍රධාන සභාපති - එම්.කේ.ටී.එල්. මුණසිංහග
- ප්‍රධාන ලේකම් - කේ.එම්.පී.යූ. බණ්ඩාර කරුණානායක.
- භාණ්ඩාගාරික - යසපාල වනසිංහ.
- උප සභාපතිවරු - පී.ඩී. තිසේරා /ඒ.සී. ද සොයිසා /සරත් කුමාරසිංහ / ඩබ්.එම්.එස්.බී. වීරසේකර /එච්.එම්.එන්. ඒකනායක.
- උපලේකම් - එස්.ඩබ්.අංජන විදානගේ.
- ගිණුම් පරීක්ෂක - පී.එච්.ඒ.එල්. සිල්වා.
- සංස්කාරක - යූ.කේ.ජී.ඩබ්. ජයසුන්දර.
- ප්‍රචාරක නිලධාරී - එස්. උපාලි වෛද්‍යරත්න යන මහත්වරුන්.

### මහනුවර මධ්‍යම වෙළඳපොලේ සීමාසහිත ශ්‍රී වෛශාඛදාන සංග්‍රහ සමිතිය.

- ප්‍රධාන සභාපති - කල්‍යාන එස්.අබේවික්‍රම.
- ප්‍රධාන ලේකම් - ජේ.පී.ඩී. විතානගේ.
- ප්‍රධාන භාණ්ඩාගාරික - ඒ.එම්.පී. උපාලි සිල්වා
- නියෝජ්‍ය සභාපතිවරු - පී.ඒ. ඔමන්ත /අසේල කුමාර /පී.බී. දිසානායක / එච්.එම්. ලයනල් ද සිල්වා.


**කේ. බණ්ඩාරනායක**

# සදහම් ප්‍රහේලිකා අංක - 94

**ජයග්‍රාහී වාසනාවන්තයින් තිදෙනාට දයාවංශ ජයකොඩි පොත් මැදුරින් වටිනා ග්‍රන්ථයක් තිළිණ කෙරේ... දුරකථනය - 011-2695773**

### උපදෙස් :

1. මෙය නිවැරදිව හා ඉතා පැහැදිලිව පුරවා තැපැල් පතක අලවා පහත සඳහන් ලිපිනයට එවිය යුතුය.
2. ලිපිනය - සදහම් ප්‍රහේළිකාව (94), 112, දයාවංශ ජයකොඩි පොත් සමාගම, පූජ්‍ය ඇස්. මහින්ද හිමි මාවත, මරදාන.
3. පිළිතුරු භාරගන්නා අවසාන දිනය මැයි මස 12 වෙනිදා බව සලකන්න
4. ජයග්‍රාහකයින් තේරීමේ අවසන් තීරණය ප්‍රධාන සංස්කාරක සතුවේ.
5. ප්‍රහේළිකාවේ අපැහැදිලි තැනක් වේ නම් 071-3391013 අමතන්න.
6. ත්‍යාගය සඳහා විමසීම් සඳහා 011 2695773 (සුසිල්) අමතන්න.



### ▶ හරහට

1. දස සංයෝජනවලින් එකකි.
4. උච්ඡේදවාදය මුල්කොට ඇතිවන තණ්හාව.
7. ජීවිතයත් මෙවැනි බිඳුමක් ලෙසට බුදු දහමෙහි සැලකේ.
8. දරුණු ඇතුන් මෙල්ල කරගන්නට මේවාද උපයෝගී කරගැනේ.
10. නොඅලස්ව රැස්කර ගත යුතුය.
12. දෙතිස් කුණුප කොට්ඨාසවලට අයත්ය.
13. එකල ගංගාවලින් වැලි ප්‍රවාහනය කිරීම සඳහා මේවා භාවිත කළහ.
14. සිත කය දෙකම සන්සුන් කරන ව්‍යායාම ක්‍රමයකි.
15. බුදු දහමට අනුව සියල්ලටම මූලික වන්නේ මෙයයි.
16. අටලෝ දහමට අයත්ය.

### ▼ පහළට

2. දහමට අනුව මෙයද එක්තරා ගින්නකි.
5. පුරපසළොස්වක පොහොයකි.
6. තුන් ආකාරයෙන් සිදුවන දුශ්චරිතවලින් එකකි.
7. පෙර කල භික්ෂූන් වහන්සේලා දනට වැඩි මග.
9. බෞද්ධයා මෙම මාර්ගයේ යාමට උනන්දු විය යුතුය.
11. වැටහෙන නුවණ ඇත්තවුන් අතරින් අග තනතුර දරූ තෙරණුවෝ.

**ප්‍රහේළිකා අංක 91**
**ජයග්‍රාහී වාසනාවන්තයින් නම්**

- බිසෝමැණිකේ රත්නායක, 4, ජලාශය පාර, මහනුවර.
- නන්දාවතී මැණිකේ, 22, කොස්සින්න, ගෙලිඔය.
- පියසිරි කලිකොටුව, 'සමනල සැලූන්', සිරිමල්වත්ත, ගුන්නෑපාන.

# ඔබත් දළදා වරුණට ලියන්න

**දළදා** වරුණ සැම විටම ඔබේ අදහස් උදහස් වලට ගරු කරන පුවත් සඟරාවකි. වසර එකොළහකට ආසන්න කාලයක් තිස්සේ "දළදා වරුණ" සමඟින් ප්‍රවීණ ලේඛක මඬුල්ලක් බැඳී සිටින අතර ගිහි පැවිදි ඕනෑම අයෙකු අප වෙත ලබා දෙන කාලීන හරවත් සහ සමාජයට ප්‍රයෝජනවත් වේ යැයි සිතන දහම් ලිපි සඳහාද ඉඩ කඩ ලබා දීමට අප නිරතුරු සැලකිලිමත් වන්නෙමු. එහිදී දළදා වරුණ පුවත්පතේ පළවන සියලුම ලිපි, රචනා ඒ.ඒ. කර්තෘවරුන්ගේ අදහස් මිස දළදා මාලිගාවේ හෝ එහි සංස්කාරකවරුන්ගේ අදහස් නොවන බවද සිහිපත් කරනු කැමැත්තෙමි. තනි පිටුවේ පැහැදිලි අත් අකුරින් ලියන ලද හෝ යතුරු ලියනය කළ ඔබේ බෞද්ධ ලිපිය පහත ලිපිනය වෙත යොමු කළ යුතුය. සැම ලිපියක්ම බෞද්ධ තේමාවක් ඔස්සේ පිටු 2 කට නොවැඩි වන සේ ලිවිය යුතු බවද සලකන්න.

සංස්කාරක
"දළදා වරුණ" මාධ්‍ය ඒකකය
ශ්‍රී දළදා මාලිගය, මහනුවර

- අන්තර්ජාලයෙන් පසුගිය "දළදා වරුණ" කියවන්න
www.sridaladamaligawa.lk වෙබ් අඩවියට පිවිසෙන්න

# දළදා මාලිගයෙන් පණිවුඩයක්

- **මෙම සටහන සිහියෙන්, සැලකිල්ලෙන් කියවන්න**

1. ඔබගේ සංවර ඇඳුම ඔබේ හැදියාවේ සංකේතයයි.
2. ඔබගේ සංවර ඇඳුම මේ පින්බිම රමණීය කරයි.
3. ඔබගේ සංවරශීලී භාවය මේ පින්බිමට සෝභාවකි. එය ඔබට ගෞරවයකි.
4. දළදා සමිඳු වැඩ සිටින උතුම් පින්බිමට එනවිට ඔබ සැරසී සිටින ඇඳුම් උචිතදැයි සිහියෙන් සිතන්න.
5. ශ්‍රී දළදා මාලිගා පරිශ්‍රයට කොට කලිසම් (පිරිමි, ගැහැනු දෙපිරිසම) පලාපු සායවල්, අත් නැති/කොට හැට්ට, දණහිසෙන් ඉහළට වන සේ කොට වූ සායවල්, ඇඟ පසු පෙදෙස නිරාවරණය වන සේ වූ ඇඳුම් යනාදියෙන් සැරසී ඒමෙන් වළකින්න.
6. ඔබ දළදා මාලිගාවට පැමිණෙන විට චාම් ලා පාට ඇඳුමෙන් සැරසෙන්න.
7. තද පාට (කළු) ඇඳුම් පින් බිමට නොහොබින බව තේරුම් ගන්න.
8. ඇඳුම ඔබේ චරිතය කියාපාන කැඩපතක් බව සිතන්න.
9. දළදා මාලිගාව පින් බිමක් මිස පෙම්වතුන්ගේ පාරාදීසයක් නොවන බව සිහියට ගන්න.
10. ඔබට ඇත්තේ දෙඇසක් වුවද ඔබ වටා ඇස් දහසක් ඇති බව මෙනෙහි කරන්න.

ඔබ හැසිරිය යුත්තේ හැඟීම්වලට වහල් වී නොව බුද්ධිමත්වය. මෙම කරුණු අප ඔබ වෙත ඉදිරිපත් කළේ කරුණාවෙන් බවත්, රට භාර ගන්නට සිටිනා මතු පරපුරට ඔබගේ ආදර්ශයක් ලබාදීමට බවත් සිහිකරනු කැමැත්තෙමු.

"නිතර අනුන්ගේ දෙස් සොයන්නා වූ, අනුන් හෙළා තලා කතා කරන්නා වූ පුද්ගලයාගේ කාමාදී පාප ධර්ම වැඩෙත්. ඔහු රහත් ඵලයෙන් ඈත්ය."



# නිදහස් චින්තනයට බුදු දහමේ තැනක් තිබේද?

ලෞකික සහ ලෝකෝත්තර ගුණය උපදවා ගැනීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපදා මාර්ගය කුමක්ද යන්න විමසා බැලීම මෙම ලිපියේ අරමුණයි. මේ පිළිබඳව කරුණු විස්තර වන මූලාශ්‍ර අතර මජ්ඣිම නිකායේ විමංසක සූත්‍රය සහ සන්ධක සූත්‍රය, අංගුත්තර නිකායේ කාලාම සූත්‍රය යන බෞද්ධ මූලාශ්‍ර ප්‍රධාන වේ. ඒවායේ සඳහන් වන බෞද්ධ චින්තන නිදහසෙහි ශ්‍රේෂ්ඨත්වය පැහැදිලි වන්නේ එය වෛදික චින්තන නිදහස සමග තුලනය කර බැලීමේදීය. වේදයේ සඳහන් වන පරිදි බ්‍රාහ්මණ ශ්‍රම විභාගය ගොඩනැගී තිබුණේ ශ්‍රැතිය සහ ස්මෘතිය පදනම් කරගෙනය. ඒ අනුව ඇසීම සහ ඇසෙන දෙය මතක තබා ගැනීම බ්‍රාහ්මණ චින්තනයේ මූලික ලක්ෂණය විය. කිසිම කරුණක් පිළිබඳව ප්‍රශ්න කිරීම හෝ සාකච්ඡා කිරීමේ නිදහසක් බ්‍රාහ්මණ සංස්කෘතිය තුළ නොපැවැති බවට හොඳම සාධකය නම් උපනිශද් සාහිත්‍යයේ සඳහන් වන යාඥාවාලකතී ඍෂිවරයා සහ ගාරගිබාලකී නම් කාන්තාව අතර ඇතිවූ සංවාදයයි. මෙහිදී යාඥාවාලබතී විසින් ලෝකය ජලය මත පිහිටියේ යැයි කී විට, ජලය කොහි පිහිටියේ දැයි විමසූ විට ජලය වායුවෙහිත්, වායුව ආකාශයෙහිත්, ආකාශය බ්‍රහ්ම ලෝකයෙහිත් පිහිටි බව කියා ඇත. අනතුරුව බ්‍රහ්ම ලෝකය කොහි පිහිටියේ දැයි ඇසූ විට ඍෂිවරයා කියා සිටියේ ඉන් එහාට නොවිමසා තමන් කී දේ පමණක් පිළිගන්නැයි කියා තර්ජනය කිරීමයි. මෙයින් පෙනෙන්නේ යමක් ප්‍රශ්න කිරීමෙන් අවබෝධය ලබාගැනීම වෛදික ආගමේ නිදහසක් නොමැති බවයි. මේ අනුව උපනිෂද් දර්ශනයද විවෘතව දේශනා නොකළ බව පෙනේ. එය තෝරාගත් පිරිසකට පමණක් සූත්‍රාකාරයෙන් ඉදිරිපත් කරා පමණි.

එහෙත් මේ අයුරින් බුදු දහම තෝරාගත් පිරිසකට පමණක් ඉගැන්වූවක් නොවන බව බුදුන් වහන්සේ පරිනිර්වාණ සූත්‍රයේ දේශනා කොට ඇත. එපමණක් නොව බුදු දහම සඟවා උගන්වන ලද්දක් නොවේ. බුදුන් දේශනා කළ ධර්ම, විනය විවෘත වූ විට පමණක් බබළන බවත්, කිනම් ආකාරයකින් හෝ එය වැසුණොත් බබළන්නේ නැති බවත් දක්වන ලදී. ඒ නිසා බුදු දහමේ විවෘත ස්වභාවය විශේෂ ලක්ෂණයක් ලෙස හැඳින්විය හැකිය. තමන් වහන්සේ විසින් කී දේ ඒ ආකාරයෙන් නොපිළිගත යුතුයි සඳහන් කරන අතර, එයට හොඳම නිදසුන මජ්ඣිම නිකායේ උපාලි සූත්‍රයෙහි උපාලි ගෘහපතියාට බුදුන් වහන්සේ කළ ප්‍රකාශයයි. මේ අතර, අංගුත්තර නිකායේ කාලාම සූත්‍රයේ සඳහන් වන කාලාමයින් සිටින කේස පුත්ත නුවරට පැමිණිය එක් මවක් ආගමික ශාස්තෘවරුන් තමන් දේශනා කරන දේ සත්‍ය බවත් අන්‍ය දර්ශනය අසත්‍ය බවත් හඳුන්වා දී ඇත. මේ පිළිබඳව කාලාමයින් බුදුන් වහන්සේට සැලකළ විට බුදුන් වහන්සේ අනුන් කී පමණින් නොව තමන් විසින්ම කල්පනා කර බලා සත්‍ය අසත්‍ය කුසලාකුසලය කුමක්දැයි තේරුම් ගත යුතු බව වදාළ සේක. මේ පිළිබඳව කරුණු සඳහන් කරන බුදුරජාණන් වහන්සේ පහත දැක්වෙන කරුණු 10 ඇතුළත් කිසිවක් සත්‍ය හෝ අසත්‍ය වශයෙන් නොපිළිගත යුතු බව පෙන්වා වදාළ සේක.

''යම් කෙනෙකුගේ සිත දිවා රෑ දෙකේ අහිංසාවෙහි ඇළුණේද ඒ ගෝතම ශ්‍රාවකයෝ හැමදම සුවසේ නිදා පුබුදිත්.''

1. මා අනුස්සවේන
2. මා පරම්පරාය
3. මා ඉතිකිරියාය
4. මා පිඨක සම්පදානෙන
5. මා තන්ත හේතුන
6. මා නය හේතුන
7. මා ආකාර පරිවිතක් ඛේන
8. මා දිට්ඨී තිජ්ඣාන කත්තියා
9. මා හබ්බ රූපකාය
10. මා සමණොගරූති යනුවෙනි.


මෙහි අනුස්සවේන වශයෙන් අදහස් කරන්නේ ශ්‍රැතියයි. මෙහි අදහස යමෙකු කියනු ලබන දේ අසා උගෙනීමයි. ශ්‍රැතියෙන් එක්තරා ආකාරයකට සත්‍යාවබෝධය ලැබේ. මෙමගින් නුවණින් සත්‍ය අසත්‍ය භාවය විමසා බලා පිළිගත යුතු බව පෙන්වා දෙයි.

පරම්පරාව නිර්ණායකයක් වශයෙන් පිළිගන්නා පුද්ගලයන්ගේ ලක්ෂණය වන්නේ තම ගුරු පරම්පරාවෙන් පැවත ගෙන එන දේ පමණක් සත්‍ය ලෙස පිළිගැනීමයි. යමකග්ග භාරද්වාජ සහ අංගිරස යන ගුරු පරම්පරා තමා අට්ඨකා, වාබදේව යමකග්ග, භාරද්වාජ සහ අංගිරස යන ගුරු පරම්පරාවෙන් පැවතගෙන එන දේ අසත්‍ය වුවත් සත්‍ය වශයෙන් පිළිගැනීම බ්‍රාහ්මණ සංස්කෘතියේ ලක්ෂණය විය. බුදුන් වහන්සේ චංකී සහ තේවිජ්ජ යන සූත්‍රවල දේශනා කර ඇති අන්ධපේනූපමාවෙන් පෙන්වා දී ඇත්තේ සත්‍යාවබෝධයේ නිර්ණයක් වශයෙන් සදොස් බවයි. අන්ධයින් පේළියක මුලින් සිටින අන්ධයාට පසුව සිටින අන්ධයා නොපෙනෙන්නාක් මෙන් පරම්පරා කරුණු පිළිගන්නට සත්‍ය අවබෝධය නොවන බවයි. මා ඉතිකිරාය යන්නෙන් අදහස් කෙරෙන්නේ අනුමානය කිරීමයි. අනුමාන කරන්නාට සත්‍යාවබෝධය කර ගැනීමට නොහැකි බවයි. මේ පිළිබඳව මජ්ඣිම නිකායේ චූල්ල හත්ථි පදෝපම සූත්‍රයෙන් වැඩිදුරටත් කරුණු විස්තර වේ.

වෛදික ධර්මයේ ඇතුළත් වේද, බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිශද් හෝ සූත්‍ර, විනය, අභිධර්මය යන පිටක හෝ සඳහන් කරන දේ සත්‍ය අසත්‍යතාවය නොවිමසා පිළිනොගත යුතු බව අවධාරණය කෙරේ. මෙපමණක් නොව සාමාන්‍ය ලෝකයා අතර සත්‍යාවබෝධයෙහි ලා තර්කය ඉවහල් කරගන්නා තර්කයද බැහැර කොට ඇත. මාතක්කපේතු යන දේශනාවෙන් පැහැදිලි වන්නේ එයයි. සුක්ඛ නිපාතයේ මාගන්ධියා සූත්‍රය වැනි දේශනාවන්හි තර්කයේ ආදීනව රාශියක් දක්නා ලැබේ. තර්ක කිරීමේදී මිනිසුන් යොදාගන්නේ ව්‍යවහාර භාෂාවයි. භාෂාවේ ඇති වචන කාලය, දේශය, පරිසරය, ජාතිය අනුව වෙනස් විය හැක. නිදසුනක් වශයෙන් ගොනා, බල්ලා, බූරුවා වැනි වචන දැක්විය හැකිය. මේ වචන භාවිත කරන අවස්ථාව අනුව වෙනස් විය හැක. තවත් තැනකදී තර්ක කරන්නාගේ උගත්කම සහ පෞරුෂ ලක්ෂණ සහ කථිකත්වය අනුවද සත්‍ය අසත්‍ය කොට දැක්විය හැක. එසේම තර්කයෙන් සත්‍ය පෙන්වා දීමේදී මිනිසුන් අතර වාද විවාද කල කෝලාහල ඇති විය හැක. සමහර තැනකදී සත්‍ය අසත්‍ය ලෙසත් අසත්‍ය සත්‍ය ලෙසත් දැක්විය හැක. සමහර නඩු හබවලදී වැරදිකරුවන් නිවැරදිවන් වන්නේත්, නිවැරදිකරුවන් වැරදිකරුවන් වන්නේත් මේ තර්කයේ ඇති ආදීනවයන්ගෙනි.

අනිත් නිර්ණායකය වන්නේ න්‍යායයි. මේ අනුව කිසියම් පුද්ගලයකු න්‍යාය සිද්ධාන්තයක එල්බගෙන සිටීමෙන් ඔහුට අසත්‍ය වුවත්, සත්‍යයක් ලෙස ගෙන සිටීමට සිදුවේ. එක් එක් පිළිගත් න්‍යාය සිද්ධාන්ත මුල්කරගෙන පුද්ගලයා තුළ සත්‍යාවබෝධය කෙසේ වෙතත් තණ්හා, දිට්ඨී, මානාදී කෙලෙස් ඇති වන බව බුද්ධ දේශනාවයි. මෙයද සත්‍යාවබෝධයට බාධාවක් වන අතර පුද්ගලයාගේ මෙන්ම සමාජයටද අයහපත ගෙන දේ.


යම්කිසි දෙයක පුද්ගලයකුගේ ඇතිවන පැවතුම් දෙස බලා සත්‍ය අසත්‍ය තීරණය කිරීම නම් ආකාර පරිවිතර්කයයි. එකල භාරතීයයන් අතර පැවති මිණුම් දණ්ඩයකි. බුදුන් සහ කොසොල් රජු සමග ධර්ම සාකච්ඡාවේ යෙදී සිටින අතරතුරදී ඒ අසලින් යමින් සිටි කොරක්ඛිතිය නම් සුනඛ වෘත සමාදන් වූ තවුසා සම්පූර්ණ කෙලෙස් ප්‍රහීන කළ රහත් පුද්ගලයකු ලෙස සලකන රජු ඔහුට වැඳ නමස්කාර කළේය. මෙම නිර්ණායකයා පිළිගන්නා පුද්ගලයා හැඟීමට යටවන අතර, විචාර බුද්ධියට තැනක් නොදෙයි. එසේම මා දිට්ඨී තිජ්ඣන කත්තියා යනුවෙන් ආගමක් සමග ඊට සමානව සඳහන් වුන දෘෂ්ටියක් සමග සන්සන්දනය කොට සත්‍ය හෝ අසත්‍ය පිළිගැනීමයි. එසේම යම් පුද්ගලයකුගේ පුද්ගල ගෞරවයෙන් කරුණු පිළිගන්නාගේ ලක්ෂණය වන්නේ ඔහු කියන දෙයෙහි සත්‍ය අසත්‍ය නොසලකා ඔහුගේ උගත්කම ධනය හෝ නිලය වැනි බාහිර පෞර්ෂ ලක්ෂණ කෙරෙහි ඇති



කරගන්නා හැඟීම අනුව ඔහු කියන දේ එසේ පිළිගැනීමයි. මා හබ්බ රූපකායේ න්‍යායයි. මෙයද බුදුන් විසින්ද ප්‍රතික්ෂේප කර ඇත.

එකල භාරතයේ පැවති දෘෂ්ටීන් අතර විචාර බුද්ධියට තැනක් නොලැබෙන අතර යටත් පිරිසෙයින් බුදුන් තමන්ගේ ගුරුවරයා යන හැඟීමෙන් තමන් දේශනා කරන ලද දේ විචාරයෙන් තොරව නොපිළිගත යුතු බව මා සමණො ගරූති යන්නෙන් පෙන්වා දී ඇත. මේ අනුව බුදුන් සියල්ල අවබෝධ කරගත් උතුමකු වශයෙන් සත්ත්වයාගේ යහපත මිස අයහපතට ඉවහන් වන අසත්‍ය ධර්මයක් දේශනා කරන්නේ නැත. එසේ වුවත් ඒ සඳහා සොයා බලා පිළිගැනීමට නියම කර තිබීම බුදු දහමේ චින්තන නිදහසට කෙබඳු තැනක් ලැබී ඇද්ද යන්න සඳහා ප්‍රකට නිදසුනකි. එසේම කලාම විමංසක, සන්දන සහ චංකි යන සූත්‍රවලින් බුදුන් වහන්සේ පෙන්වා දුන් චින්තන නිදහස බුදු දහමේ කැපී පෙනෙන ලක්ෂණයක් ලෙස දැක්විය හැක.

**ශාස්ත්‍රවේදී පූජ්‍ය තිබ්බටුවාවේ සිද්ධත්ත හිමි**



2 පිටුවෙන් ▶

සිත පිරිසිදු කරගැනීමේ තුන්වන නිර්ණායකය වන්නේ භාවනාවයි. භාවනාව සිත පිරිසිදු කරගැනීමට සෘජුවම බලපාන සංසිද්ධියකි. "භාවේති කුසලෙ ධම්මෙ ආසේවති වඩ්ඪෙති ඒකායති භාවනා" කුසල ධර්ම වඩයිද, වැඩි දියුණු කරයිද, ඒ චේතනාව භාවනාවයි. එතුළින්ම සිත පිරිසිදු වීමේ මාර්ගය පැහැදිලි කොට ඇත. කුසල් දහම් යනු හොඳ සිතුවිලිය. ඒවා මෙලොව පරලොව යහපත් කරදීමට සෘජුවම බලපානු ඇත. කෙනෙකුට පිරිසිදු සිතකින් මරණයට පත්වීමට හැකි නම් ඊළඟ භවය සුගතිගාමී වීමට එය හේතුවේ. ඒ සඳහා ප්‍රායෝගික ජීවිතය තුළ දාන, ශීල, භාවනා දී සිත පිරිසිදු කරන, දියුණු කරන යහපත් ක්‍රියාධර්ම කිරීමට අවශ්‍යව ඇත. සිත පුදුමාකාර දෙයකි. එහි ස්වභාවය සංකීර්ණය.

"දූරංගමං ඒක චරං - අසරීරං ගුහාසයං

යෙ චිත්තං සඤ්ඤ මෙස්සන්ති - මොක්ඛන්ති මාර බන්ධනා"

("දුර ගමන් යන, තනිවම හැසිරෙන, ශරීරයක් නැත්තා වූ, ගුහාවක වෙසෙන සිත යමෙක් සංවර කර ගනිත්ද ඔහු මාර බන්ධනයෙන් මිදෙනු ඇත.")

ධම්ම පදයේ චිත්ත වග්ගයට අයත් එම දහම් පාඨයද සිතට ගෙන නිරන්තරයෙන් සිත දමනය කර ගැනීමටත්, සිත පිරිසිදු කරගැනීමටත් වෙහෙසිය යුතුය. සසර දීර්ඝ බැවිනුත්, පුහුදුන් සිතේ අකුසල් සිදුවීමේ ප්‍රවණතාව වැඩි හෙයිනුත් සිත පිරිසිදු කරගැනීම අනිවාර්ය වේ. අලෝභ, අදෝෂ, අමෝහ ආදී කුසල් දහම් වඩමින් කරුණාව, දයාව, මෛත්‍රිය ආදී සිතුවිලි වඩා වර්ධනය කරගත යුතුව ඇත. එය තමන්ටත්, අනුන්ටත්, මෙලොවටත්, පරලොවටත් සුබ සිද්ධිය කැඳවනු නියතය. එපමණක්ද නොව එය නිවන් පිණිසද හේතු වන්නේය.

පූජ්‍ය ගලගෙදර රතනවංස හිමි

# මහාචාර්ය කොටපිටියේ රාහුල නාහිමි

## කෝට්ටේ පාර්ශ්වයේ අභිනව අනුනායක පදවියට

අතිපූජ්‍ය කොටපිටියේ රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ බෞද්ධ විනය පිළිබඳ විශාරදත්වයක් දරන නූතන සංඝ සමාජයෙහි වැඩ සිටින තෙර නමක් වේ. උන්වහන්සේ විනය අධ්‍යයන නම් වූ ශාස්ත්‍රීය සංග්‍රහයක්ද කම්මවාචා හා පැවිදි උපසම්පදා වත නමින් කෘතියක්ද සද්දසාරත්ථජාලිනි නමින් පර්යේෂණාත්මක ග්‍රන්ථයක්ද වශයෙන් විවිධ ශාස්ත්‍රීය කෘතිද, ලේඛන රාශියක්ද රචනා කරමින් ධර්මවිනය පිළිබඳ සිය පෘථුල ප්‍රඥාව, ශාස්ත්‍රීය ලෝකයට විවෘත කළහ. එමතුද නොව කෝට්ටේ ශ්‍රී කල්‍යාණි ධර්ම මහා සංඝ සභාවට ඇතුළත්ව විනය ගරුක භික්ෂු පිරිසක් සසුනටද දායාද කිරීමට නිරතුරුව වෙහෙසෙති. මෙම අප්‍රතිහත ධෛර්යය, ශක්තිය හා විනය පිළිබඳ විශාරද බව නිසාම එම සංඝ සභාවෙහි ජ්‍යෙෂ්ඨ කර්මවාගාචාර්ය ධුරය එහි උපසම්පදා ලේඛකාධිකාරී තනතුරු උන්වහන්සේ වෙත නිතැතින්ම හිමි විය. එසේම එයින් ඉදිරියට පැමිණ එම සංඝ සභාවේ නියෝජ්‍ය ලේඛකාධිකාරී ධුරය හෙබවූහ. උන්වහන්සේ තුළ වූ කැපවීම හා විශාරද බවම නිසාම මහ ලේඛකාධිකාරී පදවියටද ඒකමතිකවම පත්වූහ. අතිපූජ්‍ය රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ උදාරතර ශාසනික මෙහෙවරට ජවයක් ගෙන දීමට මෙම පදවිය සාධනයන් වනු නිසැකය. අනතුරුව උන්වහන්සේ කෝට්ටේ ශ්‍රී කල්‍යාණි සාමග්‍රී ධර්ම මහා සංඝ සභාවේ අනුනායක පදවියට පත්වීම එම ශ්‍රීමත් සංඝ සභාවට මහත් ශාසනික ප්‍රබෝධයක් ගෙන දෙමින් ශාසනික උන්නතියට හේතු වෙයි.

අභිනව අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ තුළ දුර්ලභ මානුෂීය ගුණාංග පිහිටා ඇත. මෙම අනර්ඝ වූත්, අනුස්මරණීය වූත් අවස්ථාවේ එයින් කිහිපයක් සටහන් කිරීම උන්වහන්සේට කරනු ලබන පූජෝපහාරයක් වේ. කුඩා අවදියේ සිටම විවිධ දුක් කරදර මැද මහණ දම් පුරමින් අධ්‍යාපනය ලැබූ උන්වහන්සේ සමහර දිනවල පාන් පෙත්තක්, තේ වතුර ටිකක් වළඳමින් කාලය ගෙවූහ.

උන්වහන්සේ සාමණේර අවදිය ගත කළ ගල්පිටිය විහාරස්ථානය කුඩා ආවාසයක් විය. අව්වෙන්, වැස්සෙන් පීඩා ගෙන දෙන දිරාපත් වූ ආවාසයක් වූයෙන් උන්වහන්සේට කටුක දිවියක් ගෙවීමට සිදු විය. එක්දිනක් උන්වහන්සේ රාත්‍රියේ සැතපී සිටින විට වහලෙන් ජලය කාන්දු වන බව දැක පසුදින උන්වහන්සේම මැදිහත් වී පිළිසකර කළමුත් අවසන් කරන්නට නොහැකි වූයෙන් පසුදිනට එම කාර්ය කල් තැබුවේය. එදින රාත්‍රියේ දැඩි සුළඟත් සමගින් වැස්සක් ඇවිත් වහලයට දමා තිබූ ඉටි රෙද්ද ගැලවී ගියේය. එම අවස්ථාවේ කුඩය යටට වී ඇඳ මත හිඳගෙන වැස්සෙන් පීඩා විඳිමින් කල් ගෙවූ බව උන්වහන්සේ වරෙක පැවැසූහ. තවද නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ කුඩා අවදියේ තල්පිටියේ සිට මොල්ලිගොඩ පිරිවෙන දක්වා හිරු මුදුන් වූ සමයෙහි රත්වූ පොළොව මත පාවහන් නොමැතිව යමින් ශිල්ප ශාස්ත්‍රය හැදෑරූහ. එහිදී උන්වහන්සේ සමග අධ්‍යාපනය ලැබූ සමහර භික්ෂූන් වහන්සේලා බසයෙන් යනවා දුටු බවත් එමස අය මග හරිමින් පාරේ ගමන් කරන බවත් උන්වහන්සේ පවසා ඇත. සමහර වැඩිහිටි උපාසක මව්වරු යම් යම් ආහාර හා රසකැවිලි උන්වහන්සේට ගෙනවිත් දීම උන්වහන්සේගේ සාමණේර කටුක දිවියට සැනසිල්ලක් ගෙන දෙන කරුණක් වූ බව අදටත් අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ උපේක්ෂාවෙන් මෙනෙහි කරති. මේ අතර ප්‍රේමසිරි කේමදාසයන්ගේ මව නිරතුරුව පිහිට වූ බව වරෙක පැවැසූහ.


අනුන්ගේ දුක දැක හදතව කම්පාවීම, කරුණාව බව හඟවන බුදු වදන සනාථ කිරීමට අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ පරාර්ථ සේවය නිවැරදිම සාධකය වේ. අනුන්ගේ දුක් කරදර දැක ඒවා තමන්ට වූ දුකක්, කරදරයක් වශයෙන් සිතන උන්වහන්සේ ඒ සඳහා පිහිට විය හැකි උපරිම ආකාරයෙන් ක්‍රියා කරති. මේ අතර තිරිසන් සතුන්ට සංග්‍රහ කිරීමට රුචිකත්වයක් දක්වන නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ උනුනට රසවත් කෑම වේලක් දීමටද කිසිදා අමතක නොකරති.

නිහතමානී බව ආභරණයක් කරගත් රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ කිසිදාක ශාස්ත්‍රීය දැනුම නිසා හෝ තනතුරු නිසා හෝ උදම් නොවූහ. යකඩයක් රත්වෙන තරමට නැමෙන්නා සේ උන්වහන්සේ උගත්කම පමණටම නම්‍යශීලී බව, නිහතමානී බව හා තැන්පත් බව විදහා පායි. බුදුන් වහන්සේගේ විනය දේශනාව සිය ජීවිතය කරගත් උන්වහන්සේ කායික මානසික හැප්පීම්වලින් එය ලොවට පෙන්වා දෙති. ඉතාමත් අල්ප වූ හෝ වරදක් නිසා භික්ෂූත්වයට හානියක් වනු නොදැකීම දිවියේ පරම පැතුමයි. එපමණටම ධර්මය දන්නා වූ අනුනායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ බුද්ධ දේශනාව ඇතුළත් පෙළ, අටුවා හා ටීකා ඇසුරෙන් ධර්ම දේශනා කිරීමට මහත් කුසලතාවක් දක්වති. එසේම අනුකරණවලින් තොරව තමාම ගොඩ නගා ගත් ව්‍යක්ත බස් වහරකින් යුතු ශෛලියකින් ධර්ම දේශනා කිරීමට මනා පරිචයක් දැරීම නිසා දෙස් විදෙස් සැමගේ ගෞරවාදරයට පත්ව සිටිති. මේ නිසා මෙරට පමණක් නොව එංගලන්තය, තායිලන්තය, භාරතය, සිංගප්පූරුව, ඕස්ට්‍රේලියාව, ඉතාලිය, බුරුමය, ප්‍රංශය ආදී රටවල් ගණනාවකම ඉතාමත් සම්භාවනීය, ශාස්ත්‍රීය හා සාමාජීය සම්මේලනවලට මේ වනවිටත් සහභාගි වී තිබේ. මෑතකදී රෝමයේ පැවැති අන්තර් ආගමික ලෝක සම්මේලනය වෙනුවෙන් ශ්‍රී ලංකාව නියෝජනය කළ අතිපූජ්‍ය රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ පාප් වහන්සේගේ විශේෂ ඇගයීමකට භාජනය විය.

කිසිදාක කිසිවකුගේ ජීවිතයකට හිරිහැරයක් වීමට අකමැති නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ දායකයන්ට පිහිට වනු මිස දායකයන්ගෙන්ද කිසිවක් නොපතති. මෙබඳු අපමණ ගුණාංග යන්ගෙන් හෙබි භික්ෂූන් වහන්සේලා අල්පය.

ආචාර්ය එච්. එම්. මහින්ද හේරත්
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයීය
පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය.

"ද්වේශ රහිත වූ යමෙක් බැණීම් ගැහීම් හා වධ බන්ධනත් ඉවසාද, ඉවසීම බලය කොටත් බල ඇණිය කොටත් ගත් ඔහු උත්තමයෙකි."



# බුදු බණ දෙසන්නට නිවැරදි ක්‍රමයක් තිබෙනවාද?

බුදුරජාණන් වහන්සේ එක්තරා කාලයක ගංගා නම් ගඟ අසබඩ වැඩ සිටියහ. දිනක් ගංගාවේ සැඩ පහරින් ගසාගෙන යන දරකඩක් දැක බුදුහු භික්ෂූන් ඇමතූහ.

''මහණෙනි, ගංගා නදියෙහි සැඩ පහරින් ගසාගෙන යන අර දරකඩ දුටුවේද?'' යනුවෙන් විමසූහ. ''එසේය ස්වාමීනි'' යි භික්ෂූහු කීහ.

''මහණෙනි, ඔය පාවෙන දර කොටය, මෙගොඩට පාවී නොආවේ නම්, එගොඩටද නොයයි නම්, ගඟ මැද නොගිලෙයි නම්, මිනිසුන් ගත්තෙත් නැත්නම් අමනුෂ්‍යයන් ගත්තෙත් නැත්නම්, සුළියකට අසු වුණේත් නැත්නම්, ගඟ මැද ගියේත් නැත්නම්, මහ මුහුදටම යන්නේය. මන්ද ගංගා නදිය මහ මුහුදටම ගලා බසින බැවිනි.

මහණෙනි, ඔබ සැමද ඒ වගේය. ඉදින් මෙතෙරට නාවොත් එතෙරට ගියේත් නැත්නම්, මිනිසුන් හෝ නොමිනිසුන් ගත්තෙත් නැත්නම්, සුළියකට අසු වුණේත් නැත්නම්, ඇතුළත කුණු වී ගියේත් නැත්නම්, නිවනටම යන්නේය. මන්ද සම්මා දිට්ඨිය නිවනටම බර වූයේය. එහෙයිනි.''

බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළ කල්හි එක්තරා භික්ෂු නමක් උන්වහන්සේගෙන් ප්‍රශ්න ගණනාවක් විමසා සිටියහ. එසේ විමසූ ප්‍රශ්න මෙහෙමයි. ''ස්වාමීනි, ඔබවහන්සේ දෙසූ බණ පදය මට තරමක් අපැහැදිලියි. එනිසා මා සිත ප්‍රශ්න රාශියකින් වෙළී තිබෙනවා. ඒවාට පිළිතුරු දුන මැනවි. මගේ ප්‍රශ්න මේවාය. මෙතෙර කුමක්ද? එතෙර කුමක්ද? මැද ගිලා බැසීම කුමක්ද? ගොඩ ගැසීම කුමක්ද? මිනිසුන්ගේ ගැනීම කුමක්ද? අමනුෂ්‍යයන්ගේ ගැනීම් කුමක්ද? සුළියට අසුවීම කුමක්ද? ඇතුළත කුණුවීම යනු කුමක්ද? යනුයි.

මෙතෙර යනු ආධ්‍යාත්මික ෂඩ් ඉන්ද්‍රියවලට නමකි. එතෙර යනු බාහිර ෂඩායතනයයි. මැද ගිලා බැසීම යනු නන්දිරාගයයි. ගොඩ ගැසීම යනු අස්මිමානයයි.

මිනිසුන්ගේ ගැනීම යනු කුමක්ද? යම් භික්ෂුවක් ගිහියන් සමග මිශ්‍රව මිත්‍රව සමග සතුටු වෙමින්, සමග ශෝක වෙමින් සුවපත් වූවන් අතර සුවපත්ව, දුකට පත්වූවන් අතර දුක්පත්ව වසයි. මිනිසුන්ගේ වැඩ කටයුතු උපන් කල තමා එහි යෙදිය යුත්තෙක් බවට පත්වෙයි. මිනිසුන්ගේ ගැනීම යනු මෙයයි.

අමනුෂ්‍යයන්ගේ ගැනීම යනු කුමක්ද? යම් භික්ෂුවක්

"කෝපයෙන් මත් වූ තැනැත්තා උමතු අශ්වයෙකු පිට නැඟී යන්නෙකු වැනිය"

මම මේ ශීලයෙන් උතුම්ය. අගතැන්පත්ය. එනිසා මම දෙවියෙක් හා සමාන වෙමියි කිසියම් දේව නිකායක් පතා බඹසර රකියි නම් මෙය අමනුෂ්‍යයන්ගේ ගැනීම යයි කියනු ලැබේ. සුළියට අසුවීම යනු පංචකාම ගුණයන්ට නමකි.

ඇතුළත කුණුවීම යනු කුමක්ද? මේ සසුනෙහි සමහරු දුශ්ශීලව පාප ධර්ම ඇතිවන පරිදි සැක කටයුතු හැසිරීම් ඇතිව, සැඟවුණු ක්‍රියා ඇතිව, අශ්‍රමණව, ශ්‍රමණ ප්‍රතිඥා ඇතිව අබ්‍රහ්මචාරීව, බ්‍රහ්මචාරීව ප්‍රතිඥා ඇතිව ඇතුළත කෙලෙස්වලට වසඟ වී වසති. මෙය ඇතුළත කුණුවීම යනුයි.

බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ධර්මය පැහැදිලි කරන ආකාරය අසාගෙන සිටි නන්ද නමැති ගව පාලකයාට (නන්ද ගෝපාල) ධර්මය ඉතා හොඳින් හිතට වැදුණේ ය. ඔහු බුදුරජාණන් වහන්සේ අමතා මෙසේ කීවේය. ''ස්වාමීනි බුදුරජාණන් වහන්ස, මම මෙගොඩ නොඑමි. එගොඩ නොයමි. මැද නොගිලෙමි. ගොඩට නොගැසෙමි. මිනිසුන්ගේ ගැනීමක් නැත. අමනුෂ්‍යයන්ගේ ගැනීමක් නැත. සුළියකට අසු නොවෙමි. ඇතුළත කුණු නොවෙමි. මම ඔබවහන්සේ සමීපයේ මහණ වෙමි'' යනුයි.

''නන්ද, ඔබ මහණ වීමට කැමති නම් ඔබ ආරක්ෂා කරන ඔය ගවයන් උන්ගේ අයිතිකාරයාට බාර දෙන්න.''

''ස්වාමීනි, උන් පුරුදු පරිදි නිවහනටම යති.''

''නන්ද, ඔබම ගොස් ගවයන් ගව හිමියාට බාර දෙන්න.''

නන්ද ගෝපාල බුදු වදන් අසා තෙමේම ගොස් ගවයන් ගව හිමියාට භාර දුන්නේය. එසේ කොට නැවත බුදු හිමියන් වෙතට පැමිණියේය. නන්ද ගෝපාල බුදු සසුනෙහි පැවිදි විය. නොබෝ දිනකින්ම උපසම්පදාව ලබා රහතන් වහන්සේලා අතර එක් නමක් බවට පත්විය.

**සං.නි. දාරුක්ඛන්දෝපම සූත්‍රය**


බුදුරජාණන් වහන්සේ විසින් ධර්මය පැහැදිලි කිරීමේදී භාවිත කරගනු ලැබූ වස්තූන් පිළිබඳ සංකල්පය මින් හෙළි වෙයි. නන්ද ගෝපාල වැනි ඉහළ අධ්‍යාපනයක් නොලැබූ කෙනකු පවා එය මැනැවින් අවබෝධ කරගනු ලැබුවේ එම නිසාය. මෙයින් පැහැදිලි වන කරුණු කීපයක් වෙයි. එනම්, යමක් පිළිබඳ කෙනකුගේ ඉක්මන් අවධානය ඇති වන්නේ එහි හොඳ හෝ නරක නිසා නොව එය පැහැදිලි කර දෙනු ලබන්නා තුළ පවතින පැහැදිලි කිරීමේ ක්‍රමය අනුවය.

ධර්මය පැහැදිලි කළ යුත්තේ කෙසේද? ඒ සඳහා භාවිත කරගනු ලබන බස කුමක්ද යන්න අනතුරුව නිරාකරණය කරගත යුතු ගැටලුවයි. එයට එකවර දිය යුතු බුදු දහමට එකඟ පිළිතුර වන්නේ අසන්නාට (ශ්‍රාවකයාට) ඉක්මනින් වැටහෙන භාෂාව යන්නයි. ඓතිහාසික වශයෙන් ඔප්පු කර ගත හැකි භාෂාවයි. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටින විට ධර්ම සන්නිවේදනය සඳහා භාවිත කරගනු ලැබ ඇත්තේ ජනපද නිරුක්තියයි. එම ප්‍රදේශයේ භාවිත වන උපමා රූපකයි.

මිහිඳු හිමියන් ලංකාවට බුද්ධාගම අරගෙන ආවේ මාගධී භාෂාවෙන්ය. ඒවා ශ්‍රී ලාංකිකයන් හට ඉක්මනින් වටහා ගැනීමට අපහසු විය. මෙය වටහා ගත් අරිට්ඨ හිමියන් ඇතුළු පිරිස ධර්මය වඩාත් ලෙහෙසියෙන් තේරුම් ගැනීම පිණිස එම කෘතිවලට අටුවා ග්‍රන්ථ ලියූහ. උන්වහන්සේලා ඒවා ලියුවේ සිංහල භාෂාවෙන්ය. එසේ වූයේ මාගධී භාෂාව නොවැටහෙන නිසාය. එසේ ලියූ අටුවා පොත් පහකි. ඒවා හඳුන්වනු ලබන්නේ හෙළ අටුවා යනුවෙනි.

මහානාම රජ්ජුරුවන්ගේ කාලයේ එම හෙළ අටුවා පොත්වල තිබූ හරවත් ධර්ම කරුණු නැවත පාලි භාෂාවට පෙරලුවේ බුද්ධඝෝෂ හිමිපාණන් වහන්සේය. එසේ ක්‍රමික විපර්යාසවලට පත්වෙමින් පැමිණි බුද්ධ වචනය විවිධ ධර්ම කථික හිමිවරුන්ගේ සරල පැහැදිලි කිරීම් නිසා සාමාන්‍ය මිනිස් සමාජයට ඉතා ඉක්මනින් ගමන් කිරීමද එබඳු දක්ෂ ධර්ම කථිකයන් වහන්සේලා නොමැති විට විට පොත් අතරටම සීමා වීමද සිදුවිය.

අතිගරු සෝම හිමියන් තුළ පැවති ධර්ම කරුණු පැහැදිලි කිරීමේ සරල බව මත පසුගිය කාලයේ ධර්මය



පිළිබඳ මහත් උද්ඝෝෂණයක් ඇති විය. ඇතැම්හු දොස් කීහ. ඇතැම්හු ගුණ කීහ. පළමුව දොස් කියූ ඇතැමෙක් පසුව ගුණ කීහ.

මේ දිනවල මිනිසුන් අතර ඉතා ශීඝ්‍ර ලෙස පැතිරී යන ධර්මය දෙසූ සංයුක්ත තැටියක් වෙයි. එම තැටිය වඩාත් ජනප්‍රිය වී ඇත්තේ ආගම් බේදයකින් තොරව තරුණ පිරිස අතරේය. ඒ බණ තැටිය ඇසූ විට දොස් නගන්නටද නොහිතෙයි. ගුණ වනන්නටද නොහැකිය. දොස් කියන්නට බැරි ඇයි? ඒ සංයුක්ත තැටිය සාවධානව ඇසූ විට කියන්නේ බුදු බණයි. ශෛලිය නුහුරුය. එය දොස් නගන්නට තරම් වරදක් නොවේ. ගුණ වනන්නට නොහැකි ඇයි? බුදුන් දවස සිට මේ දක්වා ධර්ම දේශනාවේ යම් ප්‍රවණතා ඇති වී තිබේ. බණ කිව යුත්තේ කියන්නාගේ ශීලය පෙන්වීමට වඩා අසන්නාට වැටහෙන පරිදිය. කාලීන නව ප්‍රවණතා අතර මෙය සුවිශේෂයක් නොවේ.

මහාචාර්ය පාතේගම ඥාණිස්සර හිමි